# 5
## ශ්‍රේණිය

## මූලික පිරිවෙන්

# සමාජ විද්‍යාව

## මධ්‍ය හා අවසාන වාර ප්‍රශ්න පත්‍ර
## Mid Term and Year End Papers

**මූලික පිරිවෙන් මධ්‍ය හා අවසාන වාර ප්‍රශ්න පත්‍ර i-ii**



සමාජ විද්‍යාව - මධ්‍ය හා අවසාන වාර ප්‍රශ්න පත්‍ර

# සමාජ විද්‍යාව

## මධ්‍ය වාර ප්‍රශ්න පත්‍ර - 5 ශ්‍රේණිය

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය 2018

# Primary Piriven Mid Year Tearm Test - 2018

## 05 ශ්‍රේණිය /Grade 05

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව I, II
sociology I, II

කාලය : පැය තුන යි
Time : Three Hours

## සමාජ විද්‍යාව I

උපදෙස්

- මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ.
- එය එක් එක් ප්‍රශ්නයට වරණ හතර බැගින් දී ඇත. නමුත් නිවැරදි පිළිතුර වන්නේ එක් වරණයක් පමණි. එම නිවැරදි වරණය තෝරාදී ඇති උපදෙස් අනුව පිළිතුරු ලකුණු කරන්න.
- මෙම කොටසට ලකුණු 40 ක් හිමි වේ.

01. සමාජය පිළිබඳව අධ්‍යනය කෙරෙන විෂය හැඳින්වීමට "සමාජ විද්‍යාව" යන නාමය මුලින් ම භාවිත කළ සමාජ විද්‍යාඥයා කවරෙක් ද?

(i) එමිල් ඩූර්කයිම
(ii) මැක්ස් වෙබර්
(iii) කාල් මාක්ස්
(iv) ඔගස්ටස් කොම්ට්

02. ප්‍රංශයට සමාජ විද්‍යාව හඳුන්වා දුන් සමාජ විද්‍යාඥයා වන්නේ,

(i) එමිල් ඩූර්කයිම් ය.
(ii) ඔගස්ටස් කොම්ට් ය.
(iii) කාල් මාක්ස් ය.
(iv) මැක්ස් වෙබර් ය.

03. ඔගස්ටස් කොම්ට් විසින් දැක්වූ මානව ප්‍රගතියේ අවධි තුන නිවැරදිව සඳහන් පිළිතුර තෝරන්න.

(i) දේවවාදී යුගය, රණකාමී යුගය, කාර්මික යුගය
(ii) රණකාමී යුගය, කාර්මික යුගය, යථානුභූත යුගය
(iii) දේවවාදී යුගය, පාරභෞතික යුගය, යථානුභූත යුගය
(iv) ප්‍රාථමික යුගය, රණකාමී යුගය, කාර්මික යුගය

04. " සමාජ විද්‍යාව සමාජ සම්බන්ධතා පිළිබඳ විද්‍යාවයි." සමාජ විද්‍යාව සඳහා මේ නිර්වචනය ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයා වන්නේ,

(i) ඒ. ඩබ්ලිව්. ස්මෙල් ය.
(ii) කිංස්ලි ඩේවිස් ය.
(iii) කාල් මාක්ස් ය.
(iv) රොබට් පාර්ක් ය.

05. නිවැරදි අධ්‍යයන ක්‍රමවේදයක් මගින් සත්‍ය සොයාගත හැකි ආකාරය පැහැදිලි කෙරෙන බෞද්ධ සූත්‍රයකට උදාහරණයක් වන්නේ,

(i) මහා මංගල සූත්‍රය යි.
(ii) රතන සූත්‍රය යි.
(iii) කරණීයමෙත්ත සූත්‍රය යි.
(iv) චූල්ලහත්ථි පදෝපම සූත්‍රය යි.

06. සමාජ පරිණාමය පිළිබඳ සිය අදහස් පළ කිරීම සඳහා 'ඔගස්ටස් කොම්ට්' රචනා කළ ග්‍රන්ථය වූයේ,

(i) ආගමික ජීවිතයේ මූලික හරය (ii) යථාභූත දර්ශනය

(iii) ප්‍රාග්ධනය (iv) බෞද්ධ සමාජ පාලනය

07. 'මැක්ස් වේබර්' දක්වා ඇති ආධිපත්‍ය න්‍යායට අයත් සංකල්ප ගණන වන්නේ,

(i) 02 කි. (ii) 04 කි. (iii) 03 කි. (iv) 05 කි.

08. සමාජ පරිණාමය සමාජයක පැවැත්මට අත්‍යවශ්‍ය සාධකයක් ලෙස සැලකෙන්නේ පහත සඳහන් කවර සාධකයක් නිසා ද?

(i) සමාජ විද්‍යාඥයින් විසින් ඉදිරිපත් කර ඇති සංකල්පයක්වීම.

(ii) එය පර්යේෂණයක් මගින් තහවුරු කර ගත හැකිවීම.

(iii) බුදුදහම මගින්ද පරිණාමයට පිළිගෙන ඇති නිසා.

(iv) නව සමාජ තත්වයන්ට සාර්ථකව මුහුණදීමට වෙනස්වීම අවශ්‍යවීම.

09. ශ්‍රී ලංකාවේ පැරණි ග්‍රාමීය ගොවි සමාජයේ පැවති අත්තම් ක්‍රමය පිළිබඳ පහත කවර කරුණක් නිවැරදිවේ ද?

(i) දෑතේ ශක්තියෙන් වැඩ කිරීමයි.

(ii) අන්‍යෝන්‍ය ශ්‍රම සහයෝගීතා ක්‍රමයකි.

(iii) තමාගේ වැඩ තමා විසින්ම කර ගැනීමයි.

(iv) ගොවිතැන් සඳහා සත්ව ශ්‍රමය යොදා ගැනීමයි.

10. පහත ප්‍රකාශ අතරින් නවීකරණය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(i) දේශපාලන නවීකරණය නිසා ප්‍රජාතන්ත්‍රවාදය බිඳ වැටිණි.

(ii) ජනමාධ්‍ය නවීකරණය නිසා ලෝක ජනතාව අතර සම්පස්ථ සම්බන්ධතා ඇති විය.

(iii) අධ්‍යාපන නවීකරණය නිසා තාක්ෂණික අධ්‍යාපනය දුර්වල විය.

(iv) ප්‍රවාහන නවීකරණය රිය අනතුරු බහුල විය.

11. කාර්මීකරණය සම්බන්ධ පහත ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(i) කාර්මීකරණය ලෙස සැලකෙන්නේ ජේම්ස් වොට් විසින් වාෂ්ප බල යන්ත්‍රය නිර්මාණය කිරීමයි.

(ii) කාර්මීකරණය නිසා කෘෂිකර්මාන්තයට පහර වැදිණි.

(iii) කාර්මීකරණය මිනිසා තුළ අලස බවක් ඇති කළේ ය.

(iv) ගෘහාශ්‍රිත හස්ථ කර්මාන්ත වෙනුවට මහා පරිමාණ කර්මාන්තශාලා ඇතිවීමට කාර්මීකරණය හේතු විය.

12. පහත වගුවේ 'අ' කොටසේ සඳහන් ග්‍රන්ථවල කතුවරුන් 'ආ' කොටසින් තෝරා ගත් විට නිවැරදි පිළිවෙල අයත් පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| • බෞද්ධ සමාජ පාලනය | A - මහාචාර්ය ඩබ්ලිව්. එස්. කරුණාරත්න |
| • බෞද්ධ සමාජ විද්‍යාව | B - ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර |
| • බෞද්ධ දර්ශනය හා චරණය | C - මහාචාර්ය නන්දසේන රත්නපාල |

(i) B C A (ii) A C B (iii) C A B (iv) A B C

13. සමාජ පරිණාමය සම්බන්ධයෙන් තම අදහස දැක්වීම සඳහා සමාජ විද්‍යාඥයින් විසින් විවිධ න්‍යායන් ඉදිරිපත් කර ඇත. එහෙත් ඔවුන් විසින් පිළිගනු ලබන පොදු අදහසක් ඇත. ඒ අදහස වන්නේ,

(i) සමාජය දෙවියන්ගේ නිර්මාණයක් වන බවයි.

(ii) සමාජයේ ජීවත්වන සියලු දෙනාගේ අදහස සමාන වන බවයි.

(iii) නොදියුණු ප්‍රාථමික සමාජයක සිට දියුණු නාගරික සමාජයක් දක්වා සමාජය පරිණාමය වූ බවයි.

(iv) සමාජ පරිණාමය එක් අවස්ථාවකදී අවසන් වන බවයි.

14. කෙටිකාලීනව සමාජය පරිණාමය සිදුවීම සඳහා බලපානු ලබන සාධක පමණක් ඇති පිළිතුර තෝරන්න.

(i) කාර්මීකරණය, මෝස්තර ව්‍යාපාර, සංස්කෘතික සහයෝගිතා ව්‍යාපාර

(ii) නාගරීකරණය, කාර්මීකරණය, නවීකරණය

(iii) දේශපාලන විරෝධතා ව්‍යාපාරය, සංස්කෘතික සහයෝගිතා ව්‍යාපාර, කාර්මීකරණය

(iv) මෝස්තර ව්‍යාපාර, දේශපාලන විරෝධතා ව්‍යාපාර, සංස්කෘතික සහයෝගිතා ව්‍යාපාර

15. අධ්‍යාපන නවීකරණය සම්බන්ධයෙන් වන පහත ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(i) පැරණි අධ්‍යාපනය ප්‍රායෝගික ජීවිතය සැකසීමට නැඹුරු නොවීය.

(ii) නූතන අධ්‍යාපනය විෂයානුබද්ධ ශාස්ත්‍රීය ස්වරූපයක් මෙන් ම වෘත්තීය අධ්‍යයනයන් ද අන්තර්ගත වූවකි.

(iii) පැරණි අධ්‍යාපනය ශාස්ත්‍රීය බවක් ගන්නා අතර වෘත්තීය වටිනාකමින් අඩුය.

(iv) පැරණි අධ්‍යාපනය වර්තමාන අධ්‍යාපනයට වඩා දියුණු වූවකි.

16. කාර්මීකරණයේ අනිටු ප්‍රතිවිපාකයක් නොවන්නේ මින් කවරක් ද?

(i) අන්තර් පුද්ගල සම්බන්ධතා දුරස් වීම.

(ii) නාගරික තදබදයක් නිර්මාණය වීම.

(iii) පරිසර දූෂණය අවම වීම.

(iv) රැකියා වියුක්තිය ඉහළ යාම

17. දියුණු බටහිර සමාජවල බොහෝ විට කාර්මික නගර දක්නට ලැබෙන අතර අඩු දියුණුවක් සහිත සමාජවල දක්නට ලැබෙන්නේ,

(i) වාණිජ නගරයන් ය. (ii) අර්ධ නගරයන් ය.

(iii) මිලියන නගරයන් ය. (iv) සුපිරි නගරයන් ය.

18. පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(i) කාර්මීකරණය, නාගරීකරණය සිදුවීමට හේතු වූයේ නැත.

(ii) ලොව ඇතැම් රටවල නගර පුළුල්වීම වැළැක්වීම අපහසුවී ඇත.

(iii) විශ්ව සමාජයක් බිහිවීම ගෝලීයකරණය මගින් වලක්වා ඇත.

(iv) නවීකරණය සෑම විටම සමාජ යහපත පිණිසම හේතු වී ඇත.

19. "මහරජ ඔබ මේ රටේ බාරකරුවා මිස අයිතිකරුවා නොවේ." මේ ප්‍රකාශය සිදු කරන ලද්දේ කවුරුන් විසින් කාහටද?

(i) බුදුරදුන් විසින් කොසොල් රජුට

(ii) ආනන්ද හිමියන් විසින් බිම්බිසාර රජුට

(iii) විහාරමහාදේවිය විසින් කාවන්තිස්ස රජුට

(iv) මිහිඳු හිමියන් විසින් දෙවනපෑතිස් රජුට

20 දසරාජ ධර්මවලට අයත් සංකල්ප පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(i) දානය, ප්‍රියවචනය, මෘදුභාවය, සෘජු බව

(ii) පරිත්‍යාගය, සෘජුත්වය, සමානාත්මතාව, පරාර්ථ චර්යාව

(iii) ශීලය, පරිත්‍යාගය, අත්හැරයාම, දඬුවම් දීම

(iv) ක්‍රෝධ නොවීම, අවිහිංසාව, ඉවසීම, සෘජු බව

21. බ්‍රිතාන්‍ය මානව විද්‍යාවේ පියා ලෙස හැඳින්වෙන්නේ කවරෙක් ද?

(i) රැල්ෆ් ලින්ටන් (ii) ඊ.බී. ටයිලර්

(iii) ජේමන් පර්ස් (iv) මැක්ස් වේබර්

22. මිනිසා පරම්පරාවෙන් පරම්පරාවට දායාදයක් වශයෙන් ගෙන යන ජීවන රටා සමුදාය "සංස්කෘතියයි" මේ නිර්වචනය ඉදිරිපත් කළ මානව විද්‍යාඥයා වන්නේ,

(i) රැල්ෆ් ලින්ටන් ය. (ii) ඊ.බී. ටයිලර් ය.

(iii) ජේ. විල්කින්ස් ය. (iv) එල්.ටී. හොබ්හවුස් ය.

23. 'සංස්කෘතියේ ලැග්ම' ලෙස හඳුන්වනු ලබන්නේ පහත පිළිතුරු අතරින් කවරක් ද?

(i) වෙනස්වීම සඳහා මිනිසා තුළ ඇති අකමැත්තය.

(ii) සංස්කෘතියේ ඇතැම් ලක්ෂණ වෙනස් කිරීම අපහසුවීම නිසා ඇති වන තත්වයකි.

(iii) සංස්කෘතිය ඉක්මනින් වෙනස් කරගත යුතුය යන අදහසයි.

(iv) සංස්කෘතිය රැක ගැනීමට පාලකයන් විසින් ගනු ලබන උත්සාහයයි.

24. සංස්කෘතික විසරණය යනුවෙන් හඳුන්වන්නේ මින් කවරක් ද?

(i) සංස්කෘතික ලක්ෂණ ගිලිහී යාම නිසා ඇති වන තත්වයකි

(ii) කිසියම් ප්‍රබල සංස්කෘතියක ලක්ෂණ වෙනත් සංස්කෘතියකට ව්‍යාප්ත වී යාමයි.

(iii) සංස්කෘතියක සිදු වන විප්ලවීය වෙනසයි

(iv) සංස්කෘතියක් ජනතාව අතරින් ප්‍රතික්ෂේප වීමයි

25. ස්වදේශික පූජ්‍ය පක්ෂය විසින් දෙනු ලබන අධ්‍යාපනය කිසිසේත්ම සැලකිය යුත්තක් නොවේ. මේ ප්‍රකාශය කරන ලද්දේ

(i) වොරින්ටන් ආණ්ඩුකාරවරයා ය. (ii) මැනිං ආණ්ඩුකාරවරයා ය.

(iii) ජෙනරල් බාම්ස් ආණ්ඩුකාරවරයා ය. (iv) කෝල්බෲක් හා කැමරන් යන දෙදෙනා ය.

26. "ශ්‍රී ලාංකිකයා ලෙහෙසියෙන් කම්පා නොවන ප්‍රකෝප නොකළ හැකි ඉවසිලිවන්ත සාමකාමී අයෙකු වී ඇත්තේ බුදු දහමින් ලැබුණු මගපෙන්වීම නිසාය." මේ ප්‍රකාශය ඇතුළත් වන්නේ,

(i) ලෙනාඩ් වුල්ෆ්ගේ වාර්තාවලයි.
(ii) ලී සිං ගේ වාර්තාවලයි.
(iii) රොබට් නොක්ස්ගේ එදාහෙළදිව කෘතියේ ය.
(iv) පාහියන් වාර්තාවලයි.

27. කූටදන්ත සූත්‍රයේ සඳහන්වන පරිදි පාලකයාගේ යුතුකම් නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(i) ගොවියාට අවශ්‍ය බීජ හා ඉඩම් ලබාදීම ජල සම්පාදනය කරදීම, වෙළඳාම සඳහා මූල ධනය ලබාදීම
(ii) ජල සම්පාදනය කරදීම, ඉඩම් හා බීජ ලබාදීම, ත්‍රස්තවාදීන් විනාශ කිරීම
(iii) සත්ව ඝාතනය වැළැක්වීම, හොරුන්ට දඬුවම් කිරීම, පරිසරය සුරැකීම
(iv) ආගම්වලට ගරු කිරීම, පුරවැසියන්ට නිදහස ලබාදීම, හොරුන්ට දඬුවම

28. පැරණි ශ්‍රී ලාංකික සමාජයේ ගවයා පිළිබඳ පැවති අදහස තෝරන්න.

(i) පූජනීය සත්වයෙකු ලෙසය.
(ii) වත්කම පෙන්වන සම්පතක් ලෙසය.
(iii) රෝගකාරක සත්වයෙකු ලෙසය .
(iv) මහලු වූ පසු නිදහස් කළ යුතු බවය.

29. මාතෘ විහීනතාව යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?

(i) මවගේ ආදරය හා උණුසුම ලැබීම.
(ii) මවගෙන් ලැබෙන ආදරය හා උණුසුම පියාගෙන් නොලැබීම.
(iii) ජාතියේ දරුවන් වෙත සියලු මව්වරු ආදරය නොදැක්වීම.
(iv) කුඩා අවධියේදී ම මව්වරුන් මිය යාම.

30. ශ්‍රී ලංකාව ඉන්දියාවට සමීපව පිහිටීම නිසා සිදු වූ බලපෑම්වලට වඩාත් නිවැරදි අදහස වන්නේ,

(i) සංවර්ධන උපායමාර්ග පිළිබඳ දැනුම ලැබීමය.
(ii) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ව්‍යුහය ලැබීමයි.
(iii) කපු කැටීම හා රෙදි විවීමේ කර්මාන්තය ලැබීමයි.
(iv) සමාජීය හා සංස්කෘතික වශයෙන් විශාල බලපෑමක් සිදුවීමයි.

31. සියවස් පහළොවක් පමණ පැවති රජරට රාජධානියේ ජන සමාජයන් බිඳ වැටීම සඳහා වඩාත් වැඩි බලපෑමක් වූ සාධකය කුමක් ද?

(i) මැලේරියා උවදුර පැතිරී යෑම.
(ii) ආක්‍රමණිකයන් විසින් වාරිමාර්ග පද්ධතිය විනාශ කිරීම නිසා රජු හා ජනතාව බෙලහීන විය.
(iii) පාලකයන් අත්තනෝමතික ලෙස පාලන කටයුතු කිරීම.
(iv) ගොවිතැන ලාභදායි රැකියාවක් නොවීම.

32. පුද්ගලයෙකු සමාජයේ පිළිගැනීමට ලක්විය යුත්තේ ආරෝපිත තත්වය මත නොව සාධිත තත්වය මතයි. මේ අදහස ප්‍රකට කෙරෙන බෞද්ධ සූත්‍රය වන්නේ,

(i) පරාභව සූත්‍රයයි.
(ii) වසල සූත්‍රයයි.
(iii) සිඟාලෝවාද සූත්‍රයයි.
(iv) කාලාම සූත්‍රයයි.

33. රාජ පාලනය පිළිබඳව නූතන ප්‍රජාතන්ත්‍රවාදී සංකල්ප රැසක් ඇතුළත් සූත්‍රයකට උදාහරණයක් වන්නේ කුමක්ද?

(i) රතන සූත්‍රය (ii) වසල සූත්‍රය

(iii) කරණීය මෙත්ත සූත්‍රය (iv) චක්කවත්ති සීහනාද සූත්‍රය

34. සප්ත අපරිහානීය ධර්මවලට අයත් නොවන සංකල්පය තෝරන්න.

(i) කාන්තාවන්ට හිරිහැර හෝ බලහත්කාරකම් නොකිරීම

(ii) කතාවට වඩා ක්‍රියාවට මුල්තැන දීම

(iii) වැඩිහිටියන්ට ගරුබුහුමන් කිරීම හා ඔවුන්ගේ අවවාද පිළිගැනීම

(iv) පූජනීය ස්ථානවලට ගරු කිරීම හා ආරක්ෂා කිරීම

35. බන්ධනාගාර ගත කරන වරදකරුවෙකු එහි රැඳවීමේ අරමුණු දෙකකි. ඒවා මොනවාද?

(i) පුනරුත්ථාපනය හා දණ්ඩනය (ii) දණ්ඩනය හා සමාජ යහපත

(iii) දණ්ඩනය හා අන්‍යයන්ට ආදර්ශයක් වීම (iv) සමාජය ආරක්ෂා කිරීම හා නීතිය ආරක්ෂා කිරීම

36. පොලීසියට අයත් කාර්යයක් නොවන්නේ පහත සඳහන් ඒවායින් කුමක්ද?

(i) පරීක්ෂණ පැවැත්වීමේ බලතල (ii) අපරාධකරුවන් අත්අඩංගුවට ගැනීමේ බලතල

(iii) දඬුවම් කිරීමේ බලතල (iv) රථවාහන පාලන බලතල

37. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය සම්මත වූයේ,

(i) 1985 දී ය (ii) 1972දී ය

(iii) 1948දී ය (iv) 1833 දී ය

38. ශ්‍රී ලංකාවේ අධිකරණ ක්‍රමය තුළ ක්‍රියාත්මක වන ප්‍රාථමික අධිකරණය වන්නේ,

(i) දිසා අධිකරණය යි. (ii) මහාධිකරණය යි.

(iii) අභියාචනාධිකරණය යි. (iv) මහේස්ත්‍රාත් අධිකරණය යි.

39. විමානවත්ථුප්‍රකරණය තුළින් කියවෙන්නේ,

(i) පින්කළ අය සුගතියට ගිය ආකාරයයි. (ii) පව් කළ අය දුගතියට ගිය ආකාරයයි.

(iii) සුගතියට ගිය අය ද දුකට පත් වන ආකාරයයි. (iv) දුගතියේ දුක්විඳින ආකාරයයි.

40. අංගුත්තර නිකායේ ආධිපත්‍ය සූත්‍රයේ දී දේශනා කර ඇති ආධිපත්‍ය ගණන කීය ද?

(i) 04 යි (ii) 03 යි

(iii) 05 යි (iv) 02 යි

| | |
|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි<br>All Rights Reserved | **මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය 2018**<br>Primary Piriven Mid Year Tearm Test - 2018<br>**05 ශ්‍රේණිය/Grade 05**<br>සමාජ විද්‍යාව I, II<br>sociology I, II |

**සමාජ විද්‍යාව II**

සැලකිය යුතුයි

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- මෙම කොටසට ලකුණු 60 ක් හිමි වේ.

01. I. " සමාජ විද්‍යාව සමාජ ආයතන හෙවත් සමාජ සංස්ථා පිළිබඳ විද්‍යාවයි" යනුවෙන් අර්ථ දැක්වූ සමාජ විද්‍යාඥයා කවුද?

II. ඕනෑම විෂය ක්ෂේත්‍රයක් වඩාත් වැදගත් වන්නේ මූලික කරුණු දෙකක් පදනම් කරගෙනය. එම කරුණු දෙක කුමක් ද?

III. "යථානුභූත දර්ශනය" කාගේ කෘතියක් ද?

IV. එමිල් ඩුර්කයිම් පෙන්වා දුන් සමාජ ඒකාබද්ධතාවන් දෙක කුමක් ද?

V. මැක්ස් වෙබර්ගේ ආධිපත්‍යයේ ආකාර නම් කරන්න.

VI. නූතන සමාජ වෙනස්වීමේ ප්‍රධාන කොටස් දෙකකි. ඒ මොනවාද?

VII. බ්‍රිතාන්‍ය මානව විද්‍යාවේ පියා නම් කරන්න.

VIII. පුද්ගලයාගේ පෞරුෂ වර්ධනයට සමාජ හා සංස්කෘතීන් බොහෝ දුරට බලපාන බව පෙන්වා දුන් සමාජ විද්‍යාඥයින් දෙදෙනා කවුද?

IX. දසරාජ ධර්ම වලින් දෙකක් ලියන්න.

X. ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධති පහකි. එයින් දෙකක් නම් කරන්න.

( ලකුණු 2 x 10 =20 )

02. I. සමාජ පරිණාමය යන්න අර්ථ දක්වන්න.

II. සමාජ පරිණාමය නම් ක්‍රියාවලිය ප්‍රධාන ආකාර තුනක් ඔස්සේ විග්‍රහ කළ හැකිය. එම ආකාර මොනවා ද?

III. ඔගස්ට් කොම්ට් විසින් පෙන්වා දුන් සමාජ ප්‍රගතියේ අවධි තුන නම් කොට ඒ පිළිබඳව විස්තර කරන්න.

( ලකුණු 2 + 3 +5 = 10 )

03. I. සමාජ විද්‍යා විෂය සංවර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක වූ සමාජ විද්‍යාඥයින් දෙදෙනෙක් නම් කරන්න.

II. 'සමාජ විද්‍යාව' යනු කුමක් දැයි අර්ථ දක්වන්න.

III. බුදු දහමේ හඳුනාගත හැකි සමාජ විද්‍යාත්මක සංකල්ප දෙකක් විස්තර කරන්න.

( ලකුණු 2 + 3 +5 = 10 )

04\. I [illegible]

II [illegible]

III [illegible]

( [illegible] )

05\. I [illegible]

II [illegible]

III [illegible]

( [illegible] )

06\. I [illegible]

II [illegible]

III [illegible]

( [illegible] )

07\. I '[illegible]' [illegible]

II [illegible]

III [illegible]

( [illegible] )

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2019

## Primary Piriven Mid Term Test - 2019

### 05 ශ්‍රේණිය /Grade 05

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව I, II — කාලය : පැය තුන යි
sociology I, II — Time : Three Hours

### සමාජ විද්‍යාව I

උපදෙස්

- මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ.
- එය එක් එක් ප්‍රශ්නයට වරණ හතර බැගින් දී ඇත. නමුත් නිවැරදි පිළිතුර වන්නේ එක් වරණයක් පමණි. එම නිවැරදි වරණය තෝරා දී ඇති උපදෙස් අනුව පිළිතුරු ලකුණු කරන්න.
- මෙම කොටසට ලකුණු 40 ක් හිමි වේ.

01. ''සමාජ විද්‍යාව යනු සමාජ ආයතන හෙවත් සමාජ සංස්ථා පිළිබඳ විද්‍යාව යි''. මේ නිර්වචනය ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයා වන්නේ,

(i) රොබට් පාර්ක් ය. (ii) කිංස්ලි ඩේවිස් ය.
(iii) එමිර් ඩුර්කයිම් ය. (iv) ඔගස්ට් කොම්ට් ය.

02. සමාජ ගතිකත්වය යනු,

(i) සමාජයේ ස්ථාවර බව යි. (ii) සමාජයේ වෙනස්වීම යි.
(iii) සමාජයේ දියුණුව යි. (iv) සමාජයේ පරිහානිය යි.

03. 'යථාභූත දර්ශනය' ග්‍රන්ථයේ රචකයා වන්නේ,

(i) ඔගස්ට් කොම්ට් ය. (ii) එමිල් ඩුර්කයිම් ය.
(iii) කාල් මාක්ස් ය. (iv) හර්බට් ස්පෙන්සර් ය.

04. අතීතයේ ගමක පාලකයා හැඳින්වූයේ,

(i) ගාමණී යන නමිනි. (ii) විදානේ යන නමිනි.
(iii) ග්‍රාම නිලධාරී යන නමිනි. (iv) ග්‍රාම සේවක යන නමිනි.

05. ''සමාජයේ ශ්‍රම විභජනය'' ග්‍රන්ථයේ රචකයා කවුද?

(i) ආර් බ්‍රවුන් (ii) ඊ. බී. ටයිලර්
(iii) රැල්ෆ් ලින්ටන් (iv) එමිල් ඩුර්කයිම්

06. සමාජ පරිණාමය සම්බන්ධ කරුණු ඇතුළත් බෞද්ධ සූත්‍රයකට උදාහරණයක් වන්නේ,

(i) මහාමංගල සූත්‍රය යි. (ii) අග්ගඤ්ඤ සූත්‍රය යි.
(iii) කාලාම සූත්‍රය යි. (iv) පරාභව සූත්‍රය යි.

07. බුදු දහම සමාජ විරෝධී දේශපාලන විරෝධී ආගමක් ලෙස හඳුන්වා දුන් සම්භාව්‍ය සමාජ විද්‍යාඥයා වන්නේ,

(i) එමිල් ඩූර්කයිම් ය. (ii) රැල්ෆ් ලින්ටන් ය.

(iii) මැක්ස් වේබර් ය. (iv) කාල් මාක්ස් ය.

08. සමාජය වෙනස්වීමේ දී ආර්ථික කරුණු වැඩි බලපෑමක් සිදු කරන බව පෙන්වා දුන් සමාජ විද්‍යාඥයා කවුද?

(i) රොබට් පාර්ක් (ii) කිංස්ලි ඩේවිස්

(iii) එමිල් ඩූර්කයිම් (iv) කාල් මාක්ස්

09. පෞරුෂ වර්ධනය වීම සඳහා බාහිර පරිසරය උපකාර වන ආකාරය දැක්වෙන ජාතක කතාව කුමක් ද?

(i) කුස ජාතකය (ii) උම්මග්ග ජාතකය

(iii) අපණ්ණක ජාතකය (iv) සත්තිකුම්භ ජාතකය

10. සංස්කෘතියේ ප්‍රධාන අංග දෙක අයත් පිළිතුර කුමක් ද?

(i) සංස්කෘතික විසරණය හා සංස්කෘතික ලැග්ම

(ii) මහා සංස්කෘතිය හා උපසංස්කෘතිය

(iii) භෞතික සංස්කෘතිය හා අභෞතික සංස්කෘතිය

(iv) මහා සංස්කෘතිය හා භෞතික සංස්කෘතිය

11. සමාජ පරිණාමය පිළිබඳව හර්බට් ස්පෙන්සර් දැක්වූ අවධි දෙක කුමක් ද?

(i) රණකාමී අවධිය හා කාර්මික අවධිය

(ii) දේවවාදී අවධිය හා කාර්මික අවධිය

(iii) කාර්මික අවධිය හා යථානුභූත අවධිය

(iv) ප්‍රාථමික අවධිය හා නූතන අවධිය

12. විමර්ශනාත්මකව පියවරෙන් පියවරට සත්‍ය ගවේෂණය කිරීමේ මාර්ගය පැහැදිලි කෙරෙන බෞද්ධ සූත්‍රය මින් කුමක් ද?

(i) චූල්ලහත්ථි පදෝපම සූත්‍රය (ii) සිඟාලෝවාද සූත්‍රය

(iii) මහාමංගල සූත්‍රය (iv) පරාභව සූත්‍රය

13. උපයන ධනය පරිභෝජනය කිරීම, ආයෝජනය කිරීම හා ඉතිරි කිරීම සඳහා යොමු කළ යුතු ආකාරය පිළිබඳ විස්තර ඉදිරිපත් කර ඇති බෞද්ධ සූත්‍රය වන්නේ,

(i) ව්‍යග්ගපජ්ජ සූත්‍රය යි. (ii) කාලම සූත්‍රය යි.

(iii) සිඟාලෝවාද සූත්‍රය යි. (iv) පරාභව සූත්‍රය යි.

14. ''නජච්ඡා වසලෝ හෝති නජච්ඡා හෝති බ්‍රාහ්මණෝ'' වසල සූත්‍රයේ එන මෙම පාඨයෙන් ගම්‍ය වන අදහස වන්නේ,

(i) ආරෝපිත තත්ත්වය සමාජයේ පිළිගැනීමට ලක් විය යුතු බව යි.

(ii) සාධිත තත්ත්වය සමාජයේ පිළිගැනීමට ලක් විය යුතු බව යි.

(iii) සමාජයේ පිළිගැනීම සඳහා ගුණ ධර්ම රැක ගත යුතු බව යි.

(iv) නීති ආරක්ෂා කිරීම සමාජයේ පිළිගැනීමට ලක් විය යුතු බව යි.

15. අන්සතු ධනය සොරකම් නොකිරීම මගින් ආරක්ෂා කර ගත හැකි මිනිස් ඓතිවාසිකම කුමක් ද?

(i) රැකියාවේ සුරක්ෂිත භාවය පිළිබඳ අයිතිය ආරක්ෂා වීම.

(ii) සාධාරණ ලාභයක් ලැබීම පිළිබඳ අයිතිය ආරක්ෂා වීම.

(iii) තමා සතු දේපල ආරක්ෂා කර ගැනීමේ අයිතිය ආරක්ෂා වීම.

(iv) තමා සතු ධනය තම අවශ්‍යතා සඳහා වියදම් කිරීමේ අයිතිය ආරක්ෂා වීම.

16. ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ උපරිමාධිකරණය ලෙස ක්‍රියා කරන ආයතනය වන්නේ,

(i) මහාධිකරණය යි. (ii) අභියාචනාධිකරණය යි.

(iii) පළාත්බද මහාධිකරණය යි. (iv) ශ්‍රේෂ්ඨාධිකරණය යි.

17. පොලීසියට පැවරෙන බලතලවලට අයත් <u>නොවන</u> කරුණ ඇතුළත් වරණය තෝරන්න.

(i) පුද්ගලික ආරක්ෂාව පිළිබඳ බලතල (ii) බලය පාලනය කිරීමේ බලතල

(iii) වරදකරුවන්ට දඬුවම්දීමේ බලතල (iv) පරීක්ෂණ පැවැත්වීමේ බලතල

18. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලතල ඇති ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක එකම අධිකරණ ආයතනය වන්නේ,

(i) ශ්‍රේෂ්ඨාධිකරණය යි. (ii) මහේස්ත්‍රාත් අධිකරණය යි.

(iii) අභියාචනාධිකරණය යි. (iv) මහාධිකරණය යි.

19. වරදකරුවකු බන්ධනාගාර ගත කිරීමේ ප්‍රධාන අරමුණු දෙකක් තිබේ. ඒවා නිවැරදිව සඳහන් පිළිතුර තෝරන්න.

(i) අපරාධ අවම කිරීම හා දඬුවම් ලබාදීම

(ii) පුනරුත්ථාපනය කිරීම හා දඬුවම් ලබාදීම

(iii) වරද අවබෝධ කිරීම හා වැරදි අවම කිරීම

(iv) පුනරුත්ථාපනය කිරීම හා වරද අවබෝධ කරවීම

20. නීතිය ක්‍රියාත්මක වීමේ නිමිති අනුව එහි ප්‍රධාන කොටස් දෙකකි. එම කොටස් දෙක ඇතුළත් නිවැරදි පිළිතුර කුමක් ද?

(i) සිවිල් නීතිය හා ව්‍යවස්ථා නීතිය

(ii) මූලික නීතිය හා අපරාධ නීතිය

(iii) සිවිල් නීතිය හා මූලික නීතිය

(iv) සිවිල් නීතිය හා අපරාධ නීතිය

21. කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා බුදුන් වහන්සේ විසින් ගනු ලැබූ වැදගත්ම ක්‍රියාමාර්ගය සඳහන් පිළිතුර වන්නේ,

(i) කාන්තාවන්ට ගරු කිරීමේ අගය දේශනා කිරීම යි.

(ii) කාන්තාවන්ගේ බුද්ධිමත් බව ප්‍රශංසා කිරීම යි.

(iii) කාන්තාවන්ට පැවිද්ද ලබාදීම යි.

(iv) බිරිඳට මවට සැලකීමේ වැදගත්කම පෙන්වා දීම යි.

22. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත වූ වර්ෂය කුමක් ද?

(i) 1948 (ii) 1952 (iii) 1985 (iv) 1977

23. 'මේ දීපයෙහි යම් යහපත් ගමක් ඇතොත් එහි විහාරයක් හා දේවාලයක් ඇත.' ශ්‍රී ලංකාවේ අතීත ගැමි සමාජය පිළිබඳ ඉහත ප්‍රකාශය ඇතුලත් ග්‍රන්ථය හා එහි රචකයා සඳහන් නිවැරදි පිළිතුර තෝරන්න.

(i) අපේ සංස්කෘතිය - බද්දේගම විමලවංශ හිමි

(ii) එදා හෙළ දිව - රොබට් නොක්ස්

(iii) බෞද්ධ සමාජ පාලනය - ආචාර්ය ප්‍රනීත් අබේසුන්දර

(iv) ලංකා ජනතාව - නන්දදේව විජේසේකර

24. පහත සඳහන් වගුව පිළිබඳ අවධානය යොමු කරන්න.

| අ | ආ |
|---|---|
| A - පරාභව සූත්‍රය | E - චින්තන නිදහස ලබාදීම |
| B - සිඟාලෝවාද සූත්‍රය | F - මැදුම් පිළිවෙත පිළිබඳ දේශනා කිරීම |
| C - කාලම සූත්‍රය | G - පිරිහීම සඳහා බලපානු ලබන සාධක දැක්වීම |
| D - දම්සක් පැවතුම් සූත්‍රය | H - යුතුකම් හා වගකීම් පිළිබඳ කරුණු දැක්වීම |

ඉහත 'අ' කොටසේ ඇතුළත් සූත්‍රවලින් ඉගැන්වෙන කරුණු 'ආ' කොටසට අනුව පිළිවෙලින් 'ආ' කොටස ගැලපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

(i) G, E, F, H (ii) G, H, E, F

(iii) G, H, F, E (iv) G, E, H, F

25. මැක්ස්වේබර් දැක්වූ ආධිපත්‍ය සංකල්පයට අයත් අංග තුන නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(i) සාම්ප්‍රදායික ආධිපත්‍ය, අනුභාසාත්මක ආධිපත්‍ය, නෛතික ආධිපත්‍ය

(ii) ඓතිහාසික ආධිපත්‍ය, අනුභාසාත්මක ආධිපත්‍ය, ආර්ථික ආධිපත්‍ය

(iii) අනුභාසාත්මක ආධිපත්‍ය, සාම්ප්‍රදායික ආධිපත්‍ය, දේශපාලන ආධිපත්‍ය

(iv) දේශපාලන ආධිපත්‍ය, ආර්ථික ආධිපත්‍ය, බලාධිපත්‍ය

- පහත කරුණු ඇසුරින් 26 හා 27 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A- සිරිත් - විරිත්　　D - විශ්වාසයන්
B -වැව් - අමුණු　　E - ආකල්ප
C- අවි - ආයුධ　　F - විහාරාරාම

26. ඉහත සඳහන් ඒවායින් අභෞතික සංස්කෘතියට අයත් අංග පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?

(i) A,E,D　(ii) B,C,D　(iii) B,E,F　(iv) B,C,F

27. ඉහත සඳහන් ඒවායින් භෞතික සංස්කෘතියට අයත් අංග පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?

(i) A,C,D　(ii) B,C,D　(iii) B,E,F　(iv) B,C,F

- පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරන්න.

A - පාර්ලිමේන්තු ක්‍රමය　　D -ඉංග්‍රීසි භාෂාව

B - රාජාණ්ඩු ක්‍රමය　　E -හේතුඵලවාදී දහමක්

C - වැවිලි ආර්ථිකය

28. ඉහත කරුණු අතරින් බටහිරකරණයේ ප්‍රතිඵලයක් ලෙස ලංකාවේ ස්ථාපිත වූ කරුණු පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(i) A,C,D　(ii) A,C,E　(iii) B,C,D　(iv) C,D,E

- පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරන්න.

A - ජන මාධ්‍ය නවීකරණය　　D -ආර්ථික නවීකරණය
B - අධ්‍යාපන නවීකරණය　　E- ප්‍රවාහන නවීකරණය
C - ආහාර නවීකරණය

29. ඉහත කරුණු අතුරින් නවීකරණයේ ප්‍රධාන අංග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(i) A,B,C,D　(ii) A,C,D,E　(iii) A,B,D,E　(iv) B,C,D,E

- පහත වගුවේ දැක්වෙන්නේ ශ්‍රී ලංකාවට පැමිණි විදේශීය ජාතිකයන් කිහිපයක 'අ' පැමිණි ප්‍රදේශ 'ආ' ඔවුන්ගේ ආගම, 'ඇ' ඔවුන්ගේ ආගමික ග්‍රන්ථ යන තොරතුරු ය. ඒ අනුසාරයෙන් 30, 31, 32 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| අ | ආ | ඇ |
|---|---|---|
| A - ඉන්දියාව | D - අල් කුරානය | G - ක්‍රිස්තියානි |
| B - යුරෝපය | E - බයිබලය | H - හින්දු |
| C - අරාබිය | F - භගවත් ගීතාව | I - ඉස්ලාම් |

30. ඉංග්‍රීසීන්ට අදාළ තොරතුරු පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(i) A,D,G (ii) B,F,I (iii) B,D,G (iv) B,E,G

31. මුස්ලිම්වරුන්ට පමණක් අදාළ කරුණු ඇතුළත් පිළිතුර තෝරන්න.

(i) A,D,H (ii) B,E,I (iii) C,D,I (iv) C,D,H

32. දමිළ ජනතාවට පමණක් අදාළ කරුණු ඇතුළත් පිළිතුර කුමක් ද?

(i) A,F,H (ii) C,D,H (iii) B,E,I (iv) C,D,I

33. නාගරීකරණයේ අයහපත් ලක්ෂණ පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(i) මහාමාර්ග ඉදිවීම, පරිසර දූෂණය, මුඩුක්කු නිවාස ඇතිවීම

(ii) වෙළෙඳපොළ ක්‍රමයක් ඇතිවීම, අපරාධ බහුල වීම, පරිසර දූෂණය

(iii) පරිසර දූෂණය, රැකියා වියුක්තිය, අපරාධ බහුල වීම

(iv) අපරාධ බහුල වීම, රැකියා හිඟය, වෙළෙඳපොළ ක්‍රමයක් බිහිවීම

- පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරන්න.

A - ජන මාධ්‍ය නවීකරණය D - නාගරීකරණය
B - සංස්කෘතික සහයෝගීතා ව්‍යාපාර
C - මෝස්තර ව්‍යාපාර

34. ඉහත ලක්ෂණ අතරින් කෙටි කාලීනව සමාජය වෙනස්වීම සඳහා හේතුවන කරුණු පමණක් අඩංගු පිළිතුර කුමක් ද?

(i) A හා B (ii) B හා C (iii) A හා C (iv) B හා D

35. රාගය, කාමය, තෘෂ්ණාව බැහැර කර සහනශීලී මානසිකත්වයක් ගොඩනගා ගත හැකි භාවනා ක්‍රමය වන්නේ,

(i) මෛත්තානුස්සති භාවනාව යි. (ii) බුද්ධානුස්සති භාවනාව යි.

(iii) මරණානුස්සති භාවනාව යි. (iv) අසුභානුස්සති භාවනාව යි.

36. පේතවත්ථුප්පකරණය සමාජ පාලනයට උපකාර වන්නේ,

(i) එමගින් වැරදිකරුවන්ට දෙන දඬුවම් කියවෙන බැවිනි.

(ii) වරද අවබෝධ කරගෙන නිවැරදි විය හැකි බව කියවෙන බැවිනි.

(iii) වරද කළවුන් අපාගතව දුක් විඳින බව කියවෙන බැවිනි.

(iv) අපාගත වූවන් ඉන් මිදෙන ආකාරය පෙන්වා දෙන බැවිනි.

- 37 සිට 40 තෙක් ඇති ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ අතුරින් <u>වඩාත් නිවැරදි</u> ප්‍රකාශ තෝරන්න.

37.

(i) බෞද්ධ ඉගැන්වීම්වලට අනුව සමාජ පාලනයක් කළ යුතු වන්නේ පංච නීවරණයන්හි ඇලුණු සිත් මුදවා ගනු පිණිසය.

(ii) ඇමරිකාව, එංගලන්තය වැනි රටවල ආගමික නීතිය ක්‍රියාත්මක වේ.

(iii) බටහිර පාලන ක්‍රමයන් සැමවිටම ස්වයං පාලනයකට මග පාදයි.

(iv) අන්‍ය පූජනීය ස්ථානවලට ගරු කිරීම හා ආරක්ෂා කිරීම පිළිබඳව බුදු දහම උනන්දුවක් නොදක්වයි.

38.

(i) කාර්මීකරණයේ ප්‍රතිඵලයක් ලෙස මහා පරිමාණ කර්මාන්තශාලා ගෘහස්ථ කර්මාන්ත බවට පත් විය.

(ii) කාර්මීකරණය නිසා ශ්‍රම විභජනය හා විශේෂ ප්‍රාගුණ්‍ය දුර්වල විය.

(iii) ග්‍රාමීය ජනතාව රැකියා සොයා නාගරික ප්‍රදේශවලට සංක්‍රමණයවීම නිසා ශ්‍රම සංචලතාවක් ඇති විය.

(iv) මිනිසා නගර වෙත සංක්‍රමණය වීම නිසා ප්‍රවාහණය සඳහා වූ ඉල්ලුම අඩු විය.

39.

(i) සංස්කෘතික ලැග්ම යනු සංස්කෘතියක් වේගයෙන් වෙනස්වීම යි.

(ii) සංස්කෘතික ලැග්ම පිළිබඳ සංකල්පය මුලින් ම හඳුන්වා දුන්නේ ඩබ්ලිව්. එෆ්. ඔග්බර්න් ය.

(iii) සංස්කෘතික විසරණය බොහෝ සංස්කෘතීන් වෙනස් නොවී පැවතීමට හේතු විය.

(iv) ප්‍රාථමික සමාජයන්හි සංස්කෘතික විවිධත්වය බහුල වේ.

40.

(i) ශ්‍රී ලංකාවේ විධායක බලය පාර්ලිමේන්තුව මගින් ක්‍රියාත්මක වේ.

(ii) ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශවල ඇතැම් නීති කටයුතු සඳහා 'තේසවලාමේ' නීතිය භාවිත වේ.

(iii) ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව මගින් අධිකරණ බලතල මෙහෙයවනු ලැබේ.

(iv) ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවේ ප්‍රධානියා ලෙස ක්‍රියා කරයි.

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2019

## Primary Piriven Mid Term Test - 2019

### 05 ශ්‍රේණිය/Grade 05

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව I, II
sociology I, II

**සමාජ විද්‍යාව II**

සැලකිය යුතුයි

» **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
» **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
» **මෙම කොටසට ලකුණු 60 ක් හිමි වේ.**

01. I. 'සමාජ විද්‍යාව යනු සමාජ සම්බන්ධතා පිළිබඳ විද්‍යාව යි' මේ නිර්වචනය ඉදිරිපත් කළ විද්‍යාඥයා කවුද?

II. සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රයට අයත් මූලික සංකල්ප දෙකක් නම් කරන්න.

III. ප්‍රථමයෙන් ම සමාජ විද්‍යාවට අධ්‍යයන ක්‍රමවේදයක් හඳුන්වාදුන් සමාජ විද්‍යාඥයා නම් කරන්න

IV. කාල් මාක්ස් හඳුන්වාදුන් වහල් යුගයේ දක්නට ලැබුණු සමාජ පන්ති දෙක මොනවාද?

V. මැක්ස් වේබර් විසින් සමාජ විද්‍යාවේ විෂය ක්ෂේත්‍රයට හඳුන්වාදුන් න්‍යායාත්මක සංකල්ප දෙකක් ලියන්න.

VI. සංස්කෘතියට ආවේණික ලක්ෂණ දෙකක් නම් කරන්න.

VII. පාලකයා විසින් රටේ ජනතාවගේ ආර්ථික වර්ධනය උදෙසා ක්‍රියා කළ යුතු ආකාරය සඳහන් බෞද්ධ සූත්‍රයක් දක්වන්න.

VIII. ශ්‍රී ලාංකික සමාජයට දේශපාලන පක්ෂ ක්‍රමය හඳුන්වා දීමෙන් පසුව ඇති වූ වෙනස්කම් දෙකක් ලියන්න.

IX. සප්ත අපරිහානිය ධර්මවලින් දෙකක් ලියන්න

X. සුරාපානයෙන් වෙන් වීම මගින් ලබා ගත හැකි ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න.

( ලකුණු 2 x 10 = 20 )

02. I. සමාජ විද්‍යාව යනු කුමක්ද? අර්ථකථනය කරන්න

II. සමාජ විද්‍යාවේ ආරම්භය හා වර්ධනය වෙනුවෙන් ඔගස්ට් කොම්ට්ගෙන් සිදු වූ සේවාවන් තුනක් දක්වන්න.

III. බුදු දහමේ සමාජ විද්‍යාත්මක ලක්ෂණ උදාහරණ දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

( ලකුණු 2 + 3 + 5 = 10 )

03. I. සමාජ පරිණාමය යනු කුමක් ද?

II. දිගු කාලීනව සමාජය වෙනස්වීම කෙරෙහි බලපාන සාධක තුනක් දක්වන්න.

III. වෙනස්වීම පිළිබඳ යාථාර්ථය බුදු දහමින් විස්තරවන ආකාරය පැහැදිලි කරන්න.

( ලකුණු 2 + 3 + 5 = 10 )

04. I. සංස්කෘතිය පිළිබඳ නිර්වචනයක් ලියන්න

II. සංස්කෘතික විසරණය ශ්‍රී ලංකා සමාජයට බලපෑම් කළ අවස්ථා තුනක් දක්වන්න.

III. ගෝලීය ප්‍රවණතා හමුවේ ශ්‍රී ලාංකික සංස්කෘතිය මුහුණදෙන අභියෝග පිළිබඳ විමසුමක් කරන්න.

( ලකුණු 2 + 3 +5 =10 )

05. I. සමාජානුයෝජනය යනු කුමක්ද?

II. සමාජානුයෝජන කාරකයන් තුනක් දක්වන්න.

III. පෞරුෂ වර්ධනය සඳහා සමාජානුයෝජනයෙන් සිදුවන මෙහෙය පිළිබඳ විස්තර කරන්න.

( ලකුණු 2 + 3 +5 =10 )

06. I. යටත් විජිත යුගයේ දී හා ඉන් පසුව පාලකයන් සිදු කළ ප්‍රතිසංස්කරණ ලාංකික සමාජය වෙනස් කිරීමට ඉවහල් විය. එවැනි ප්‍රතිසංස්කරණ දෙකක් ලියන්න.

II. යුරෝපියයන් විසින් හඳුන්වා දුන් වතු වැවිලි ආර්ථිකය නිසා ශ්‍රී ලාංකික සමාජයට සිදු වූ අහිතකර බලපෑම් තුනක් දක්වන්න.

III. සමාජ සාධාරණත්වය සඳහා බුදු දහමෙන් සිදු වූ මගපෙන්වීම පිළිබඳ විස්තරයක් කරන්න.

( ලකුණු 2 + 3 +5 =10 )

07. I. සමාජ පාලනය යන්න අර්ථ දක්වන්න.

II. සමාජ පාලනය මගින් සමාජයට සිදුවන වාසි තුනක් දක්වන්න.

III. සමාජ පාලනය සඳහා බුදු දහම දායක වන ආකාරය උදාහරණ දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

( ලකුණු 2 + 3 +5 =10 )

සියලුම හිමිකම් ඇවිරිණි|
முழுப் பதிப்புரிமையுடையது|
All rights reserved|

**NEW**

| 08 | S | I, II |
|---|---|---|

# අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**මධ්‍යවාර පරීක්ෂණය - 2022**
**இரண்டாம் தவணைப் பரீட்சை - 2022**
**Mid Year Term Test - 2022**

පැ තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

**05 ශ්‍රේණිය**

## (08) සමාජ විද්‍යාව - I, II

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## සමාජ විද්‍යාව 1 පත්‍රය

**සැලකිය යුතුයි :**

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
* අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර** තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

(ලකුණු 01×40=40 යි)

1. සමාජ ආයතන හෙවත් සමාජ සංස්ථා විද්‍යාත්මකව අධ්‍යයනය කරන විෂයක් ලෙස සමාජ විද්‍යාව අර්ථකථනය කළ සමාජ විද්‍යාඥයා වන්නේ,

   (1) එමිල් ඩූර්ක්හයිම් ය. (2) මැක්ස් වේබර් ය.
   (3) රොබට් පාර්ක් ය. (4) එච්. පී. ෆෙයාචයිල්ඩ් ය.

2. සමාජය විද්‍යාත්මකව අධ්‍යයනයේ දී 'සමාජ පැවැත්ම හා සමාජ වෙනස්වීම' යන අංශ දෙක පිළිබඳ ව අවධානය යොමු කළ යුතු බව පෙන්වා දුන් සමාජ විද්‍යාඥයා කවුද?

   (1) හර්බට් ස්පෙන්සර් (2) ඔගස්ට් කොම්ට්
   (3) කිංස්ලි ඩේවිස් (4) ඒ. ඩබ්ලිව්. ස්මෙල්

3. වේබේරියානු සමාජ විද්‍යාවේ ප්‍රධාන ක්ෂේත්‍ර පමණක් නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

   (1) සමාජ ක්‍රියා, ආර්ථික නියතිවාදය, නිලබල ක්‍රමය
   (2) පරාරෝපණය, ආධිපත්‍ය වර්ගීකරණය, සමාජ ක්‍රියා
   (3) සමාජ ක්‍රියා, ආධිපත්‍ය වර්ගීකරණය, නිලබල ක්‍රමය
   (4) නිලබල ක්‍රමය, සමාජයේ ශ්‍රම විභජනය, සමාජ ක්‍රියා

4. සදිසා සංකල්පය මගින් පුද්ගලයා හා සමාජය අතර පවත්වා ගත යුතු සම්බන්ධතාව මනාව පැහැදිලි කෙරෙන බෞද්ධ සූත්‍රය කුමක් ද?

   (1) චක්කවත්ති සීහනාද සූත්‍රය (2) පරාභව සූත්‍රය
   (3) අග්ගඤ්ඤ සූත්‍රය (4) සිගාලෝවාද සූත්‍රය

[2 වැනි පිටුව බලන්න.

- පහත වගුවේ "අ" තීරුවේ සමාජ සමූහ කිහිපයක් ද "ආ" තීරුවේ සම්බන්ධතාවල ස්වභාවය ද "ඇ" තීරුවේ අරමුණුවල ස්වභාවය ද දැක්වේ. ඒ අනුසාරයෙන් අංක 5 සහ 6 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| අ | ආ | ඇ |
|---|---|---|
| A. දායක සභාව<br>B. මිත්‍ර කණ්ඩායම් | C. හැඟීම්බර සම්බන්ධතා<br>D. නිත්‍යානුකූල සම්බන්ධතා | E. පෞද්ගලික අරමුණු<br>F. පොදු අරමුණු |

5. ප්‍රාථමික සමූහවලට අදාළ තොරතුරු පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.

(1) A, C හා E (2) A, D හා E (3) B, C හා E (4) B, C හා F

6. ද්විතියික සමූහවලට අදාළ තොරතුරු පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?

(1) A, C හා F (2) A, D හා F (3) B, C හා F (4) B, D හා E

- පහත වගුවේ "අ" තීරුවේ තත්ත්ව කුලකයන් ද "ආ" තීරුවේ පුද්ගල අභිමතයේ ස්වභාවය ද "ඇ" තීරුවේ තත්ත්වය හිමි වන ආකාරය ද දැක්වේ. ඒ අනුසාරයෙන් අංක 7 සහ 8 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| අ | ආ | ඇ |
|---|---|---|
| A. ජාතිකත්ව සමූහ<br>B. වෘත්තීය සමූහ | C. පුද්ගල අභිමතයට අනුකූලයි<br>D. පුද්ගල අභිමතයෙන් තොරයි | E. උපතින්ම හිමි වේ<br>F. කුසලතා අනුව හිමි වේ. |

7. ආරෝපිත තත්ත්වයට අදාළ තොරතුරු පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.

(1) A, C හා E (2) A, D හා E (3) B, C හා F (4) B, D හා F

8. සාධිත තත්ත්වයට අදාළ තොරතුරු පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?

(1) A, C හා F (2) A, D හා E (3) B, C හා F (4) B, D හා E

9. සමාජ වෙනස්වීම පිළිබඳ වඩාත් ම ගැළපෙන ප්‍රකාශය මින් කුමක් ද?

(1) සමාජ පර්යාය, දිගු කාලයක් තුළ අඛණ්ඩ ව සිදුවන වෙනස්වීම් සමුදායකි.

(2) භෞතික පරිසරයේ ස්වභාවික සිදුවීම් හේතුවෙන් සිදුවන වෙනස්වීම් සමුදායකි.

(3) පාරිසරික සාධක මත සත්ත්ව හා වෘක්ෂලතා ආදියේ සිදුවන අඛණ්ඩ වෙනස්වීමයි.

(4) පාරිසරික හා අධිස්වභාවික බලවේග හේතුවෙන් සමාජය තුළ සිදුවන කෙටිකාලීන වෙනස්වීමයි.

- පහත සඳහන් සාධක හොඳින් අධ්‍යයනය කර 10 සහ 11 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(A) සංකීර්ණ ශ්‍රම විභජනයක් පැවතීම

(B) සාමූහික විඥ්ඥාණය මත අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම

(C) ගිවිසුම් හෝ සම්මුතිවලට අනුව අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම

(D) සරල ශ්‍රම විභජනයක් පැවතීම

10. යාන්ත්‍රික ඒකාබද්ධතාවක් සහිත සමාජවල ලක්ෂණ පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

11. ඓන්ද්‍රිය ඒකාබද්ධතාවක් සහිත සමාජවල ලක්ෂණ පමණක් දැක්වෙන පිළිතුර තොරන්න.

(1) A හා B (2) A හා C (3) B හා C (4) C හා D

[3 වැනි පිටුව බලන්න.

- පහත සදහන් සමාජ පරිණාම අවධි හොඳින් අධ්‍යයනය කර 12 - 14 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(A) දේවවාදී අවධිය
(B) කාර්මික අවධිය
(C) පාර භෞතික අවධිය
(D) සම්ප්‍රදායික අවධිය
(E) රණකාමී අවධිය
(F) තාර්කික අවධිය
(G) යථානුභූත අවධිය

12. ඔගස්ට් කොම්ට් පෙන්වා දුන් සමාජ පරිණාම අවධි පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A, B හා C (2) A, C හා G (3) B, D හා F (4) D, E හා G

13. හර්බට් ස්පෙන්සර් පෙන්වා දුන් සමාජ පරිණාම අවධි පමණක් දක්නට ලැබෙන පිළිතුර කුමක් ද?

(1) A හා E (2) B හා E (3) B හා F (4) E හා G

14. මැක්ස් වේබර් පෙන්වා දුන් සමාජ පරිණාම අවධි පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) A හා F (2) B හා D (3) D හා E (4) D හා F

15. වර්තමාන සමාජ හර පද්ධතීන්ගේ ඇතිවන වෙනස්වීම අනාගත සමාජයේ ස්වභාවය තීරණය වීමට බලපාන ආකාරය පිළිබඳ කරුණු දැක්වෙන බෞද්ධ ජාතක කතාව මින් කුමක් ද?

(1) මහා සුපින ජාතකය (2) සත්තිකුම්භ ජාතකය
(3) වට්ටක ජාතකය (4) දේවධර්ම ජාතකය

- පහත සිදුවීම් හොඳින් අධ්‍යයනය කර 16 - 18 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(A) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය ව්‍යාප්ත වීම
(B) ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් වීම
(C) මහා පරිමාණ කර්මාන්තශාලා ව්‍යාප්ත වීම
(D) තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය ශීඝ්‍රයෙන් වර්ධනය වීම
(E) නීතියේ ආධිපත්‍ය පිළිබඳ සංකල්ප ලොව පුරා ව්‍යාප්ත වීම
(F) ව්‍යාපාරික කෘෂිකර්මාන්තය ශීඝ්‍රයෙන් දියුණු වීම

16. දේශපාලන නවීකරණය හා වඩාත් සම්බන්ධ කරුණු පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A හා C (2) A හා E (3) B හා D (4) D හා F

17. ආර්ථික නවීකරණය හේතුවෙන් ඇති වූ වෙනස්කම් පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A හා B (2) B හා C (3) C හා E (4) C හා F

18. ජනමාධ්‍ය නවීකරණය නිසා ඇති වූ ප්‍රතිඵල පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) A හා D (2) B හා C (3) B හා D (4) D හා E

19. "මහරජ ඔබ මේ රටේ භාරකරුවා මිස අයිතිකරුවා නොවේ" යන ප්‍රකාශය සිදු කරන ලද්දේ,

(1) මිහිඳු මහ රහතන්වහන්සේ විසින් දෙවනපෑතිස් රජුටය.
(2) මිහිඳු මහ රහතන්වහන්සේ විසින් ධර්මාශෝක රජුටය.
(3) ගෝඨගත්ත තෙරුන්වහන්සේ විසින් දුටුගැමුණු රජුටය.
(4) මහා තිස්ස හිමියන් විසින් වළගම්බා රජුටය.

20. මිනිසුන් අපරාධවලට පෙළඹෙන්නේ දුප්පත්කම නිසා බවත් එහෙයින් ජනතාවගේ දුප්පත්කම නැති කිරීම සඳහා පාලකයා ක්‍රියා කළ යුතු බවත් දැක්වෙන බෞද්ධ සූත්‍රය කුමක් ද?

(1) සිගාලෝවාද සූත්‍රය (2) කූටදන්ත සූත්‍රය (3) පරාභව සූත්‍රය (4) වසල සූත්‍රය

21. මානව විද්‍යාවේ දැක්වෙන සමාජ පරිණාමවාදී සංකල්පයට සමීප අදහස් දක්නට ලැබෙන බෞද්ධ සූත්‍රය මින් කුමක් ද?

(1) කාලාම සූත්‍රය (2) ව්‍යග්ගපජ්ජ සූත්‍රය (3) අග්ගඤ්ඤ සූත්‍රය (4) පඨම සංවාස සූත්‍රය

- පහත සිදුවීම් හොඳින් අධ්‍යයනය කර 22 - 24 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(A) තරුණ පරපුර හා වැඩිහිටි පරපුර අතර පවත්නා නොරුස්සනා ස්වභාවය

(B) දියුණු තාක්ෂණයක් සහිත මෝටර් රථයක් මිල දී ගැනීම හා එය දෙවියන්ට භාර කිරීම

(C) එක් සමාජයක පිළිගත් සංස්කෘතිකාංග තවත් සමාජයකට ව්‍යාප්ත වීම

(D) කිසියම් සමාජයකට වෙනත් සමාජයක පිළිගත් සංස්කෘතිකාංග එක් කිරීමේ දී විරෝධතා ඇති වීම

(E) පරිගණක නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් නැකත් බලා ආරම්භ කිරීම

(F) නාගරික සමාජයේ පිළිගත් සංස්කෘතිකාංග මගින් ග්‍රාමීය සංස්කෘතිය පෝෂණය වීම

22. සංස්කෘතික ගැටුම ප්‍රකටවන අවස්ථා පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?

(1) A හා C (2) A හා D (3) B හා D (4) D හා F

23. සංස්කෘතික ලැග්ම පිළිබඳ වඩාත් ගැළපෙන නිදසුන් පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A හා B (2) B හා D (3) B හා E (4) E හා F

24. සංස්කෘතික විසරණය සම්බන්ධ අවස්ථා පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.

(1) A හා D (2) B හා E (3) C හා D (4) C හා F

25. "මිනිසා පරම්පරාවෙන් පරම්පරාවට දායාද වශයෙන් ගෙන යන ජීවන රටා සමුදාය සංස්කෘතියයි." යන නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,

(1) රැල්ප් ලින්ටන් විසිනි. . (2) රැඩ්ක්ලිෆ් බ්‍රවුන් විසිනි.

(3) බී. මැලිනොවුස්කි විසිනි. (4) ඊ. බී. ටයිලර් විසිනි.

26. "මිනිසුන් ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීම සඳහා ඉතා හොඳ මාර්ගය නම් අධ්‍යාපනයයි." යන ප්‍රකාශ සිදු කළ ඉංග්‍රීසි ජාතික ආණ්ඩුකාරවරයා කවුද?

(1) තෝමස් මේට්ලන්ඩ් . (2) ටොරින්ටන්

(3) රොබට් බ්‍රවුන්රිග් (4) ෆෙඩ්රික් නෝර්ත්

27. මාතෘ විහීනතාව යනු,

(1) දරුවන්ට මවගේ උණුසුම ආදරය නොලැබීමයි. (2) මව විදේශගත වීමයි.

(3) දරුවන්ට මව්කිරි නොදීමයි. (4) මව මිය යිමයි.

28. "සමාජය" සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය මින් කුමක් ද?

(1) අන්‍යෝන්‍ය බැඳීමවලින් යුතු මිනිස් එකතුවකි.

(2) යම් ප්‍රදේශයක ජීවත්වන මිනිසුන් පිරිසකි.

(3) යම් ස්ථානයක සිටින මිනිසුන් කණ්ඩායමකි.

(4) යම් රාජ්‍යයක සිටින ජනගහනයයි.

29. අතීතයේ සිට ශ්‍රී ලංකාව නාවික නැවතුම්පොලක් වීම කෙරෙහි බලපා ඇති වඩාත් වැදගත් සාධකය මින් කුමක් ද?

(1) ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නව පිහිටා තිබීම.

(2) දිවයිනේ විවිධ ප්‍රදේශවල ස්වාභාවික වරායන් පිහිටා තිබීම.

(3) ශ්‍රී ලංකාව දූපතක් වීම

(4) ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටා තිබීම.

30. ශ්‍රී ලංකාව සම්පූර්ණයෙන් ම බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත් වූයේ කුමන වර්ෂයේ දී ද?

(1) ක්‍රි. ව. 1796 (2) ක්‍රි. ව. 1802

(3) ක්‍රි. ව. 1815 (4) ක්‍රි. ව. 1818

- පහත සමාජ ලක්ෂණ හොඳින් අධ්‍යයනය කර 31 සහ 32 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(A) ආරෝපිත තත්ත්වය මත සමාජ පදනම සකස්වීම

(B) විස්තෘත පවුල් ක්‍රමය බිඳ වැටී න්‍යෂ්ටික පවුල් ව්‍යාප්ත වීම

(C) ස්වයංපෝෂිත කෘෂි ආර්ථිකයකින් යුක්ත වීම

(D) වෘත්තිය මත පදනම් වූ කුල ක්‍රමයක් පැවතීම

(E) මුදල් හුවමාරු වූ ආර්ථිකයක් ගොඩනැගීම

(F) සමාජ පාලනයේ දී නීතියට ප්‍රබල ස්ථානයක් ලැබීම

31. ශ්‍රී ලාංකේය පැරණි සමාජයට ආවේණික ලක්ෂණ පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?

(1) A, B හා C (2) A, C හා D (3) A, C හා E (4) A, D හා F

32. ශ්‍රී ලංකාවේ නූතන සමාජයේ දක්නට ලැබෙන ලක්ෂණ පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A, C හා D (2) B, C හා F (3) B, E හා F (4) D, E හා F

33. පුද්ගලයෙකු සමාජයේ පිළිගැනීමට ලක් විය යුත්තේ ආරෝපිත තත්ත්වය මත නොව සාධිත තත්ත්වය මත බව අදහස් කෙරෙන බෞද්ධ සූත්‍රය කුමක් ද?

(1) වසල සූත්‍රය (2) මහා මංගල සූත්‍රය

(3) ධජග්ග සූත්‍රය (4) පරාභව සූත්‍රය

34. ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික ගම පිළිබඳ කරුණු දැක්වෙන "ලංකා ජනතාව" කෘතියේ කතුවරයා වන්නේ,

(1) පූජ්‍ය බද්දේගම විමලවංස හිමි ය. (2) නන්දදේව විජේසේකර ය.

(3) රොබට් නොක්ස් ය. (4) නන්දසේන රත්නපාල ය.

35. ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයට අත්සන් කරනු ලැබූයේ,

(1) 1931 දී ය. (2) 1948 දී ය.

(3) 1971 දී ය. (4) 1985 දී ය.

36. මැක්ස් වෙබර් ඉදිරිපත් කළ ආධිපත්‍යයේ ආකාර තුන නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) සාම්ප්‍රදායික ආධිපත්‍යය, අනුභසාත්මක ආධිපත්‍යය හා නීත්‍යානුකූල ආධිපත්‍යය

(2) සාම්ප්‍රදායික ආධිපත්‍යය, අනුභසාත්මක ආධිපත්‍යය හා කැරිස්මා ආධිපත්‍යය

(3) සාම්ප්‍රදායික ආධිපත්‍යය, නීත්‍යානුකූල ආධිපත්‍යය හා තාර්කික ආධිපත්‍යය

(4) සාම්ප්‍රදායික ආධිපත්‍යය, අභිචාර ආධිපත්‍යය හා නීත්‍යානුකූල ආධිපත්‍යය

37. ශ්‍රී ලංකාවේ උත්තරීතර අධිකරණය වන්නේ,

(1) දිසා අධිකරණයයි. (2) අභියාචනා අධිකරණයයි.

(3) ශ්‍රේෂ්ඨාධිකරණයයි. (4) මහාධිකරධිකරණයයි.

- පහත සඳහන් බලතල හොඳින් අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

(A) අත්අඩංගුවට ගැනීමේ බලතල

(B) පරීක්ෂණ පැවැත්වීමේ බලතල

(C) දඬුවම් කිරීමේ බලතල

(D) රථවාහන පාලන බලතල

38. පොලීසිය සතු කෘත්‍යාත්මක බලතල පමණක් නිවැරදි ව දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A, B හා C (2) A, B හා D (3) A, C හා D (4) B, C හා D

39. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති සම්පාදනය කරනු ලබන ආයතනය කුමක් ද?

(1) මහාධිකරධිකරණය (2) පොලීසිය

(3) ශ්‍රේෂ්ඨාධිකරණයයි. (4) පාර්ලිමේන්තුව

40. බෞද්ධ ඉගැන්වීම්වලට අනුව “කුසල්“ යනුවෙන් අර්ථ දැක්වෙනුයේ,

(1) පින් දහම් කිරීමයි. (2) යහපත් ක්‍රියාවන් කිරීමට ඇති හැකියාවයි.

(3) දක්ෂතාවයි. (4) යම් කාර්යයක් කිරීමට ඇති හැකියාවයි.

* * *

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

| 08 | S | I, II |
|---|---|---|

**මධ්‍යවාර පරීක්ෂණය - 2022**
**இரண்டாம் தவணைப் பரீட்சை - 2022**
**Mid Year Term Test - 2022**

**(08) සමාජ විද්‍යාව - I, II**

**05 ශ්‍රේණිය**

**සමාජ විද්‍යාව II පත්‍රය**

- **පළමුවන** ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **හතරක් ද** තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

(1)

(i) සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රයේ සංවර්ධනයට එමිල් ඩුර්ක්හයිම්ගෙන් සිදු වූ සේවාවන් **දෙකක්** ලියන්න.

(ii) බෞද්ධ සමාජ විද්‍යාවේ ප්‍රධාන ලක්ෂණ **දෙක** සඳහන් කරන්න.

(iii) සමාජ ක්‍රමය වේගයෙන් හා දිගු කාලීනව වෙනස්කරන බලවේග **දෙකක්** නම් කරන්න.

(iv) බටහිර අධිරාජ්‍යයට යටත්වීම නිසා ශ්‍රී ලාංකේය සමාජයේ ඇති වූ වෙනස්කම් **දෙකක්** ලියන්න.

(v) සංස්කෘතියේ ප්‍රධාන බෙදීම් **දෙක** කුමක් ද?

(vi) ශ්‍රී ලංකාවේ පැවති ඉංග්‍රීසි පාලනයට අභියෝග කළ බෞද්ධ නායකයින් **දෙදෙනෙකුගේ** නම් ලියන්න.

(vii) ශ්‍රී ලාංකික බෞද්ධයින්ගේ වන්දනාවට පාත්‍රවන දෙවිවරුන් **දෙදෙනෙකුගේ** නම් ලියන්න. .

(viii) ශ්‍රී ලංකාවේ වර්තමාන සමාජය තුළ දක්නට ලැබෙන සමාජ ගැටලු **දෙකක්** සඳහන් කරන්න.

(ix) බුදු දහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම **දෙක** කුමක් ද?

(x) බන්ධනාගාරගත කරන වරදකරුවන් එහි රඳවා තබා ගන්නා ප්‍රධාන අරමුණු **දෙක** මොනවා ද?

(ලකුණු 02 × 10 = 20යි)

(2)

(i) සමාජ විද්‍යාව පිළිබඳ අර්ථකථනයක් සපයන්න (ලකුණු 02 යි)

(ii) සමාජ විද්‍යාව ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) බුදු දහමේ සමාජ විද්‍යාත්මක වටිනාකම කරුණු **දෙකක්** ඇසුරින් අගය කරන්න..

(ලකුණු 05 යි)

(3)

(i) සමාජීය විද්‍යාවන් අතුරින් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) සමාජානුයෝජන කාරක **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) සමාජ ගැටලු විද්‍යාත්මක ව තේරුම් ගැනීමට බුදු දහමේ ඉගැන්වෙන හේතුඵල වාදය උපයෝගී කර ගත හැකි ආකාරය නිදසුන් **දෙකක්** ඇසුරින් විග්‍රහ කරන්න.

(ලකුණු 05 යි)

[8 වැනි පිටුව බලන්න.

(4)

(i) නවීකරණය යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) කාර්මීකරණයේ යහපත් ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න . (ලකුණු 03 යි)

(iii) නාගරීකරණය හේතුවෙන් ඇති වන සමාජ ගැටලු **දෙකක්** සඳහන් කර ඒවා නිවාරණයට බෞද්ධ ඉගැන්වීම් උපයෝගි කර ගත හැකි ආකාරය නිදසුන් ඇසුරින් පහදන්න. (ලකුණු 05 යි)

(5)

(i) සමාජ පරිණාමී ක්‍රියාවලියේ ගාමක බලවේගය සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) කාල් මාක්ස් දැක්වූ සමාජ පරිණාමයේ අවධි සඳහන් කරන්න (ලකුණු 03 යි)

(iii) මහින්දාගමනය හේතුවෙන් ශ්‍රී ලාංකේය සමාජයේ ඇති වූ වෙනස්කම් **දෙකක්** අගයන්න. (ලකුණු 05 යි)

(6)

(i) සංස්කෘතිය යන්න අර්ථකථනය කරන්න. (ලකුණු 02 යි)

(ii) බෞද්ධයෙක් වෙතින් ප්‍රකට වන සාරධර්ම **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) පුද්ගල පෞරුෂය සංවර්ධනය කෙරෙහි සංස්කෘතිය බලපාන ආකාරය කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(7)

(i) මානව පවුලේ කාර්යයන් **දෙකක්** ලියන්න.. (ලකුණු 02 යි)

(ii) විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දීමත් සමග ශ්‍රී ලාංකේය සමාජය තුළ ඇති වූ වෙනස්කම් **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

(iii) සාමාජ සාධාරණත්වය සඳහා සතර බ්‍රහ්ම විහරණ උපයෝගි කර ගත හැකි ආකාරය නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. . (ලකුණු 05 යි)

(8)

(i) සමාජ පාලනයේ ප්‍රධාන ආකාර දෙක නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) නීති පද්ධතියක පැවතිය යුතු ප්‍රධාන ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ස්වයං පාලනය ඇති කර ගැනීමට උපයෝගි වන බෞද්ධ ඉගැන්වීම් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

* * *

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**

| 08 | S | I, II |
|---|---|---|

**මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය -2023**

**05 ශ්‍රේණිය**

**(08) සමාජ විද්‍යාව - I, II**

පැය තුනයි

අමතර කියවීම් කාලයය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## සමාජ විද්‍යාව I පත්‍රය

**සැලකිය යුතුයි :**

* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න.මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40 ක්** ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යෙදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. 'සමාජ භෞතික විද්‍යාව' (Social Physics) යන නමින් බිහි වූ විෂය, 'සමාජ විද්‍යාව' (Sociology) ලෙස නාම සංශෝධනය වූයේ,
   (1) 1638 දී ය. (2) 1738 දී ය. (3) 1838 දී ය. (4) 1938 දී ය.

2. සමස්ත මානව සමාජය පිළිබඳ විද්‍යාත්මක එළඹුමකින් අධ්‍යයනය කරන විෂය ධාරාව කුමක් ද?
   (1) භූගෝල විද්‍යාව (2) අධ්‍යාපන විද්‍යාව (3) ජීව විද්‍යාව (4) සමාජ විද්‍යාව

3. 'සමාජ විද්‍යාව සමාජ සම්බන්ධතා පිළිබඳ විද්‍යාව වේ.' යන නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,
   (1) ඒ. ඩබ්ලිව්. ස්මෝල් විසිනි. (2) රොබට් පාර්ක් විසිනි.
   (3) කිංස්ලි ඩේවිස් විසිනි. (4) එච්.පී. ෆෙයාවයිල්ඩ් විසිනි.

4. සමාජ පරිණාමය, පන්ති සටන්වල ප්‍රතිඵලයක් බවට අදහස් දැක්වූ සමාජ විද්‍යාඥයා කවුද?
   (1) මැක්ස් වෙබර් (2) කාල් මාක්ස් (3) හර්බට් ස්පෙන්සර් (4) එමිල් ඩුර්කයිම්

5. සමාජ විද්‍යාවේ උපවිෂය ධාරාවට අයත් **නොවන** වරණය කුමක් ද?
   (1) ආර්ථික විද්‍යාව (2) සමාජ මනෝ විද්‍යාව
   (3) දේශපාලන සමාජ විද්‍යාව (4) සමාජ මානව විද්‍යාව

6. අනාගත සමාජ වෙනස්කම් පිළිබඳ තොරතුරු අනාවරණය කර ගත හැකි බෞද්ධ මූලාශ්‍රය මින් කුමක් ද?
   (1) ඉල්ලීස ජාතකය (2) සත්තිගුම්භ ජාතකය (3) මහා සුපින ජාතකය (4) සාම ජාතකය

- ප්‍රශ්න අංක 7ට පිළිතුරු සැපයීම සඳහා (අ) තීරුවේ දැක්වෙන බෞද්ධ සූත්‍ර හා (ආ) තීරුවේ දැක්වෙන සංක්ෂිප්ත අර්ථය උපයෝගී කර ගන්න.

| (අ) තීරුව | (ආ) තීරුව |
|---|---|
| (1) අග්ගඤ්ඤ සූත්‍රය | (A) නිදහස් චින්තනය අගය කිරීම. |
| (2) චක්කවත්තිසීහනාද සූත්‍රය | (B) සමාජයේ ප්‍රභවය හා විකාසනය |
| (3) සිගාලෝවාද සූත්‍රය | (C) රාජ්‍ය පාලන මූලධර්ම. |
| (4) කාලාම සූත්‍රය | (D) අන්තර් පුද්ගල සබඳතා |

7. ඉහත (අ) තීරුවේ අනුපිළිවෙළට (ආ) තීරුව ගැළපූ විට වඩාත් නිවැරදි වරණය තෝරන්න.
   (1) A, B, C හා D (2) A, D, C හා B (3) B, C, A හා D (4) B, C, D හා A

8. සමාජ විද්‍යාව විෂයේ දී අධ්‍යයනය කරන තත්ත්වය හා කාර්යභාරය සංකල්පය වඩාත් හොඳින් නිරූපිත බෞද්ධ සූත්‍ර දේශනාව මින් කුමක් ද?
   (1) අග්ගඤ්ඤ සූත්‍රය (2) වසල සූත්‍රය (3) සිගාලෝවාද සූත්‍රය (4) කාලාම සූත්‍රය

[2 වැනි පිටුව බලන්න.

- පහත දැක්වෙන සමාජ පරිණාම අවධි උපයෝගී කර ගෙන 09 - 10 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  - A - රණකාමී අවධිය
  - B - ඓන්ද්‍රිය ඒකාබද්ධතාව
  - C - යාන්ත්‍රික ඒකාබද්ධතාව
  - D - කාර්මික අවධිය

9. ප්‍රාථමික සමාජ ලක්ෂණ සහිත සමාජ අවධි පමණක් දැක්වෙන වරණය වන්නේ,
   (1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) C හා D ය.

10. නූතන සංකීර්ණ සමාජ ලක්ෂණ සහිත සමාජ අවධි පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක්ද ?
    (1) A හා B (2) A හා D (3) B හා C (4) B හා D

11. සමාජ පරිණාමය පිළිබඳ අදහස් දැක්වෙන, එමිල් ඩුර්කයිම් විසින් රචිත කෘතිය කුමක්ද ?
    (1) සමාජයේ ශ්‍රම විභජනය. (2) ප්‍රොතෙස්තන්ත්‍ර ආචාර ධර්ම හා ධනවාදයේ සාරය
    (3) සමාජ ස්ථිතිකත්වය (4) යථානුභූත දර්ශනය

12. කාල් මාක්ස් දැක්වූ සමාජ පරිණාමය පිළිබඳ විවරණය අනුව සමාජ විෂමතාවන්ගෙන් තොර සමාජ අවධි පමණක් නිවැරදි ව දැක්වෙන වරණය කුමක් ද?
    (1) පූර්ව කොමියුනිස්ට් අවධිය, සමාජවාදී අවධිය, සුපිරි කොමියුනිස්ට් අවධිය
    (2) පූර්ව කොමියුනිස්ට් අවධිය, වැඩවසම් අවධිය, සුපිරි කොමියුනිස්ට් අවධිය
    (3) වහල් අවධිය, වැඩවසම් අවධිය, ධනවාදී අවධිය
    (4) වැඩවසම් අවධිය, ධනවාදී අවධිය, සුපිරි කොමියුනිස්ට් අවධිය

- පහත සඳහන් A, B, C හා D යන සිද්ධි යුගල අධ්‍යයනය කර අංක 13 – 14 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  - A - (i) නූගත්කම
    (ii) සමාජ ප්‍රශ්න
  - B - (i) දෙමාපිය දූදරු සම්බන්ධය
    (ii) සමාජ අපගාමී චර්යා
  - C - (i) නව තාක්ෂණික මෙවලම් භාවිතය
    (ii) මානව ශ්‍රමයට ඇති ඉල්ලුම
  - D - (i) සමාජ විද්‍යා පර්යේෂණ
    (ii) සමාජය පිළිබඳ නිවැරදි දැනුම

13. පළමුවැන්නේ (i) වැඩි වීම දෙවැන්නේ (ii) වැඩි වීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක වන්නේ,
    (1) A සහ B ය. (2) A සහ D ය. (3) B සහ C ය. (4) B සහ D ය.

14. පළමුවැන්නේ (i) වැඩි වීම දෙවැන්නේ (ii) අඩු වීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක තෝරන්න.
    (1) A සහ B (2) A සහ C (3) B සහ C (4) C සහ D

15. සමාජ වෙනස් වීම කෙරෙහි බලපෑම් කරන දිගුකාලීන සාධක ඇතුළත් **නොවන** වරණය කුමක් ද?
    (1) ගෝලීයකරණය (2) මෝස්තරකරණය (3) බටහිරකරණය (4) කාර්මීකරණය

16. ව්‍යුහීය ප්‍රභේදය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද ?
    (1) දියුණු රටවල බිහි වූ තාක්ෂණය නොදියුණු රටවලට ව්‍යාප්ත කිරීමයි.
    (2) ප්‍රබල සංස්කෘතියක අංග ලක්ෂණ දුබල සංස්කෘතිවලට පවරා දීමයි.
    (3) පුද්ගලයා වෙත පැවරී ඇති කාර්ය කොටස් සුවිශේෂ ආයතනයන් වෙත පවරා දීමයි.
    (4) සංස්කෘතීන් දෙකක් ගැටීමෙන් බිහි වන නව සංස්කෘතියයි.

17. නීතියේ ආධිපත්‍යය යන සංකල්පය වඩාත් හොඳින් අර්ථ නිරූපණය කර ඇති වරණය තෝරන්න.
    (1) නීතියට සියලු දෙනා අවනත විය යුතු බවයි. (2) නීතිය සියලු දෙනාට ම පොදු විය යුතු බවයි.
    (3) නීතිය කඩ කිරීම දඬුවම් ලැබීමට හේතු වන බවයි. (4) නීතිය සැමට ඉහළින් පවතින බවයි.

18. සාම්ප්‍රදායික නිෂ්පාදන රටාව බිඳවැටීම කෙරෙහි බලපෑම් කළ ප්‍රධාන සාධකය මින් කුමක් ද?
    (1) නාගරීකරණය (2) කාර්මිකකරණය (3) නවීකරණය (4) වාණිජකරණය

19. වැවයි දාගැබයි ගමයි පන්සලයි යන සංකල්පය මෙරට ජන ජීවිතයේ ජනප්‍රිය වීම කෙරෙහි බලපෑම් කළ ප්‍රබල සාධකය මින් කුමක් ද ?
    (1) වැව් හා දාගැබ් ඉදිකිරීමේ තාක්ෂණය මෙරට පැවතීම
    (2) වැව් හා දාගැබ් ඉදිකිරීම එකල රජවරුන්ගේ වගකීමක් වීම
    (3) හෙළ සංස්කෘතිය බුදු දහමේ ආභාසයෙන් පෝෂණය වීම
    (4) වැව් හා දාගැබ් ඉදිකිරීමට මෙරට සාමකාමී පරිසරයක් තිබීම
20. ශ්‍රී ලාංකේය සමාජ වෙනසකට හේතු වූ බණ කතා සාහිත්‍යයට අයත් **නොවන** කෘතිය දැක්වෙන වරණය තෝරන්න.
    (1) කව්සිළුමිණ (2) ජාතක පොත (3) බුත්සරණ (4) අමාවතුර
21. විමානවත්ථු පේතවත්ථු යන සංකල්පයේ සමාජ විද්‍යාත්මක අගය වඩාත් හොඳින් නිරූපිත වරණය කුමක් ද ?
    (1) පව් කිරීමට ඇති ලැජ්ජාව හා විපාක සඳහා ඇති බය
    (2) සමාජ යහපත සඳහා ධර්මානුකූලව ක්‍රියා කළ යුතු බව
    (3) ධර්මයේ ගැඹුර තම බුද්ධි මට්ටම අනුව තේරුම් ගත යුතු බව
    (4) ස්වයං පාලනය දෙලොව දියුණුවට හේතු වන බව
22. "අති නවීන තාක්ෂණයකින් යුතුව නිපදවා ඇති මෝටර් රථයක් භාවිත කරන්නෙක් එය ධාවනයට පෙර රාහු කාලය බැලීම සිදු කරයි." මෙම ලක්ෂණය නිරූපණය වන සංස්කෘතික සංරචකය නම්,
    (1) සංස්කෘතික අපගමනයයි. (2) සංස්කෘතික ලැග්මයි.
    (3) සංස්කෘතික ගැටුමයි. (4) සංස්කෘතික විසරණයයි.
23. දුෂ්සමාජානුයෝජනය හේතුවෙන් ආක්‍රමණශීලී පෞරුෂයක් ගොඩනැගෙන බවට කරුණු වඩාත් හොඳින් දැක්වෙන බෞද්ධ මූලාශ්‍රය වන්නේ,
    (1) ගුත්තිල ජාතකයයි. (2) වෙස්සන්තර ජාතකයයි.
    (3) සත්තිගුම්භ ජාතකයයි. (4) කුස ජාතකයයි.

- පහත දැක්වෙන කරුණු ඇසුරින් 24 හා 25 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

  A - විශ්වාස හා ආකල්ප
  B - යන්ත්‍ර සූත්‍ර
  C.- වැව් අමුණු
  D - ජනවහර හා ප්‍රතිමාන
  E.- සිරිත් විරිත්
  F - ආයුධ

24. අභෞතික සංස්කෘතියට අයත් අංග පමණක් ඇතුළත් වරණය තෝරන්න.
    (1) A, B හා C (2) A, D හා E (3) B, C හා D (4) B, E හා F
25. භෞතික සංස්කෘතියට අයත් අංග පමණක් දැක්වෙන පිළිතුර වන්නේ,
    (1) A, C හා E ය. (2) B, C හා F ය. (3) B, E හා F ය. (4) C, D හා F ය.
26. පුද්ගල පෞරුෂ සංවර්ධනයේ දී, ප්‍රාථමික සමාජානුයෝජන කාර්ය සඳහා ඉතා වැදගත්ම ආයතනය කුමක් ද ?
    (1) පෙර පාසල (2) මිතුරු කණ්ඩායම් (3) ජනමාධ්‍ය (4) මානව පවුල
27. සමාජ විද්‍යාත්මක වශයෙන් ප්‍රබල සාධකයක් වන නිදහස් අධ්‍යාපන ක්‍රමය, මෙරටට හඳුන්වා දීම කෙරෙහි ප්‍රමුඛ කාරයභාරයක් සිදු කරන ලද්දේ කවුරුන් විසින් ද?
    (1) සී. ඩබ්. ඩබ්. කන්නන්ගරතුමා (2) අනගාරික ධර්මපාලතුමා
    (3) හෙන්රි ස්ටීල් ඔල්කට්තුමා (4) ටොරින්ටන් ආණ්ඩුකාරතුමා
28. මෙරට පැරණි තාක්ෂණය පිළිබඳ ගවේෂණ අනාවරණ අනුව, ශ්‍රී ලංකාවේ ඉපැරණි සභ්‍යත්වය තරම් දැනුමකින් යුතු ලෝකයේ වෙනත් ශිෂ්ටාචාරයක් හමු නොවන බව දැක්වූයේ,
    (1) එමර්සන් ටෙනන්ට් ය. (2) ඊ. ආර්. ලීච් ය.
    (3) නූර් යාල්මාන් ය. (4) රොබට් නොක්ස් ය.
29. ශ්‍රී ලංකා රාජ්‍ය බ්‍රිතාන්‍ය යටත්විජිතයක් බවට පත් වූ යේ, ක්‍රි. ව.
    (1) 1615 දී ය. (2) 1715 දී ය. (3) 1815 දී ය. (4) 1915 දී ය.

- පහත සඳහන් මූලාශ්‍රය හොඳින් අධ්‍යයනය කර 30 – 31 වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

  A - ලංකාවතාර සූත්‍ර

  B - මහාවංසය

  C.- රාජ තරංගනී

  D - චූලවංසය

  E.- සමන්තපාසාදිකාව

30. ශ්‍රී ලාංකේය සමාජයේ ප්‍රභවය හා විකාශය පිළිබඳව තොරතුරු අන්තර්ගත දේශීය සාහිත්‍ය මූලාශ්‍රය පමණක් ඇතුළත් වරණය තෝරන්න.
    (1) A, B හා C (2) B, C හා D (3) B, D හා E (4) C, D හා E

31. ශ්‍රී ලංකේය සමාජ පරිණාමය සම්බන්ධව පර්යේෂණයක නිරත පර්යේෂකයෙකුට තොරතුරු ලබා ගත හැකි විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය වනුයේ,
    (1) A හා C ය. (2) B හා C ය. (3) C හා D ය. (4) D හා E ය.

32. ආරෝපිත දිශානතියට අදාළ නිදසුන් පමණක් දැක්වෙන වරණය තෝරන්න.
    (1) සිංහල, බෞද්ධ, ගුරුවරයා (2) කතෝලික, ස්ත්‍රිය, නීතිඥ
    (3) දෙමළ, වෙල්ලාල, ගායකයා (4) මුස්ලිම්, පුරුෂයා, ඉස්ලාම්

33. සමාජ සමූහයක් ලෙස සැලකිය හැකි පිළිතුර මින් කුමක් ද?
    (1) ගොවි සංවිධානයේ සාමාජිකයින් (2) දුම්රියේ ගමන් කරන මගීන්
    (3) මුහුදු වෙරළේ සිටින මිනිස් එකතුව (4) බස් නැවතුමක සිටින ජනතාව

34. බ්‍රාහ්මණ සමාජයේ ඇති කුල ස්තරායණයට සාපේක්ෂව බෞද්ධ සමාජයේ දැක්වෙන ස්තර සංකල්පය කුමක් ද?
    (1) කර්මය (2) සිව්වණක් පිරිස
    (3) සතරබ්‍රහ්මවිහරණ (4) සතර පාරාජිකා

35. බෞද්ධ සිද්ධස්ථානවල අපාය හා දිව්‍යලෝකය සිතුවම් හා මූර්ති මෙන් ම කැටයම් ආදිය දක්නට ලැබෙයි. ඒවායෙහි සමාජ විද්‍යාත්මක වටිනාතම වඩාත් ම නිවැරදිව සඳහන් වරණය කුමක් ද?
    (1) අපාය හා දිව්‍යලෝක ඇති බව පෙන්වා දීම
    (2) ස්වයං පාලනයේ වටිනාකම පෙන්වා දීම
    (3) අතීතයේ විවිධ දඬුවම් පැවති බව පෙන්වා දීම
    (4) සෞන්දර්ය රසාස්වාදය ඇති කිරීම.

- පහත සඳහන් කරුණු හොඳින් අධ්‍යයනය කර 36 වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

  A - දඩ පැනවීම

  B - හිස ගසා දැමීම

  C.- දඬුකඳේ ගැසීම

  D - වත්කම් දේපල තහනම් කිරීම

  E.- කස පහර දීම

36. ශ්‍රී ලංකාවේ පැරණි ග්‍රාමීය සමාජය තුළ ප්‍රාදේශීය පාලකයන්ට හිමිව තිබූ දණ්ඩන බලතල පමණක් නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?
    (1) A, B හා C (2) A, C හා D (3) B, C හා D (4) B, D හා E

37. ශ්‍රී ලංකාවේ රාජාධිකරණයට පමණක් හිමිව තිබූ දණ්ඩන බලතල නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,
    (1) A හා C ය. (2) A හා D ය. (3) B හා E ය. (4) C හා D ය.

- පහත සඳහන් සිද්ධිය ඇසුරින් අංක 38 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  ශ්‍රී ලංකාවේ නීතිය හා අධිකරණ පද්ධතිය පිළිබඳ ගවේෂණය කළ සුමංගල පිරිවෙනේ පහ ශ්‍රේණියේ ඉගෙනුම ලබන සමිත හිමියන් අනාවරණය කර ගත් මූලික තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

  A - ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ජනතාවගේ සුබසිද්ධිය උදෙසා නීති පනවනු ලබන සුවිශේෂ ආයතනයක් පවතින බව

  B - රාජ්‍ය විසින් නීතිය හා සාමය ආරක්ෂා කිරීම ප්‍රධාන වගකීම ලෙස පවරා පිහිටුවා ඇති ආයතනයක් පවතින බව

  C.- නීතියේ පාලනයට අනුව සැකකරුවෙකු ලෙස අත්අඩංගුවට පත් වූ අයෙකු, වරදකරුවෙකු හෝ නිවැරදිකරුවෙකු බවට පත් කිරීමේ බලතල සහිත ආයතන විශේෂයක් පවතින බව

38. සමිත හිමියන් A අක්ෂරය යටතේ අනාවරණය කර ගත් නීති පනවනු ලබන සුවිශේෂ ආයතනය වන්නේ,

    (1) පාර්ලිමේන්තුවයි. (2) පොලීසියයි.

    (3) ශ්‍රේෂ්ඨාධිකරණයයි. (4) මහාධිකරණයයි.

39. සමිත හිමියන් අනාවරණය කර ගත් B අක්ෂරයට අනුව රාජ්‍ය විසින් වගකීම පවරා තිබෙන ආයතනය කුමක් ද?

    (1) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (2) පොලීසිය

    (3) සුරා බදු දෙපාර්තමේන්තුව (4) අධිකරණය

40. සමිත හිමියන්ගේ අනාවරණයට අනුව C අක්ෂරයේ බලතල අනුව පිහිටුවා ඇත්තේ,

    (1) පොලීසියයි. (2) පාර්ලිමේන්තුවයි. (3) අධිකරණයයි. (4) බන්ධනාගාරයයි.

* * *

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය

| 08 | S | I, II |
|---|---|---|

## මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය -2023
## 05 ශ්‍රේණිය
## (8) සමාජ විද්‍යාව - II

- **පළමුවන** ප්‍රශ්නය සහ තවත් **ප්‍රශ්න හතරක්** ද තෝරාගෙන, **ප්‍රශ්න පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1. i. සමාජ සමූහ වර්ග **දෙකක්** සඳහන් කරන්න.
 ii. සමාජ විද්‍යාව ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන **දෙකක්** ලියන්න.
 iii. බෞද්ධ සමාජ විද්‍යාවේ ප්‍රධාන ලක්ෂණ **දෙක** මොනවා ද?
 iv. "තත්ත්වය හා කාර්යභාරය" සංකල්පයට අනුව කාර්යභාරය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
 v. රණකාමී සමාජ ක්‍රමයක දක්නට ලැබෙන ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.
 vi. කෙටි කාලීන ව සමාජය වෙනස් වීම කෙරෙහි බලපාන සාධක **දෙකක්** සඳහන් කරන්න.
 vii. ශ්‍රී ලාංකේය සමාජයේ දක්නට ලැබෙන උපසංස්කෘති **දෙකක්** සඳහන් කරන්න.
 viii. සමබර පෞරුෂයක් ගොඩනැගීම කෙරෙහි බලපාන සාධක **දෙකක්** ලියන්න.
 ix. සමාජ සංස්ථා **දෙකක්** නම් කරන්න.
 x. අවිධිමත් සමාජ පාලන ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.
 (ලකුණු $02 \times 10 = 20$යි)

2. i. "සමාජ විද්‍යාව" නිර්වචනය කරන්න. (ලකුණු 02යි)
 ii. සමාජ විද්‍යාව විෂයේ ප්‍රභවය කෙරෙහි බලපෑ ප්‍රධාන සාධක **තුන** නම් කරන්න. (ලකුණු 03යි)
 iii. බෞද්ධ දර්ශනය හා සමාජ විද්‍යාව අතර දක්නට ලැබෙන පොදු ලක්ෂණ **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

3. i. ඔගස්ට් කොම්ට් දැක්වූ සමාජය අධ්‍යයනය කිරීමේ දී අවධානය යොමු කළ යුතු අංශ **දෙක** කුමක් ද? (ලකුණු 02යි)
 ii. මැක්ස් වෙබර් දැක්වූ ආධිපත්‍යයේ ආකාර **තුන** මොනවා ද? (ලකුණු 03යි)
 iii. සමාජ අනුකලනය සඳහා අන්තර් ක්‍රියාවේ වැදගත්කම සිගාලෝවාද සූත්‍රයේ එන සදිසා සංකල්පයේ කරුණු **දෙකක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05යි)

4. i. එමිල් ඩුර්කයිම් දැක්වූ සමාජ පරිණාමයට බලපාන ප්‍රධාන සාධක **දෙක** මොනවා ද? (ලකුණු 02යි)
 ii. නාගරීකරණයේ යහපත් ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)
 iii. මහින්දාගමනය ශ්‍රී ලාංකේය සමාජ පරිණාමයට හේතු වූ ආකාරය කරුණු **දෙකක්** ඇසුරින් අගයන්න. (ලකුණු 05යි)

5. i. "සමාජ සචලතාව" යනු කුමක් ද? (ලකුණු 02යි)
 ii. කාර්මීකරණය නිසා ශ්‍රී ලංකේය සමාජයට බලපා ඇති අයහපත් ප්‍රතිවිපාක **තුනක්** ලියන්න. (ලකුණු 03යි)
 iii. බුදු දහමේ ඉගැන්වීම් උපයෝගී කර ගෙන ධාර්මික රාජ්‍ය පාලනයක් ගොඩනැගිය හැකි ආකාරය නිදසුන් **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

6. i. සංස්කෘතිය යන සංකල්පය අර්ථකථනය කරන්න. (ලකුණු 02යි)
 ii. සංස්කෘතික සංරචකයන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)
 iii. ගෝලීය ප්‍රවණතා හමුවේ ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතියට සිදු වූ බලපෑම් කරුණු **දෙකක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05යි)

7. i. සමාජයක් යනු කුමක් ද? (ලකුණු 02යි)
 ii. සමාජ යහපත සඳහා භික්ෂූන් වහන්සේලාට පැවරී ඇති කාර්යයන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)
 iii. සමාජ සාධාරණත්වය සඳහා සතරබ්‍රහ්මවිහරණ උපකාරී වන බව කරුණු **දෙකක්** ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 05යි)

8. i. සමාජ පාලනයක් අවශ්‍ය වන්නේ ඇයි? හේතු **දෙකක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 02යි)
 ii. නීතියේ ප්‍රධාන ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)
 iii. ස්වයං පාලනය සඳහා භාවනාව උපයෝගී කර ගත හැකි ආකාරය වඩාත්ම සුදුසු අනුස්සති **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

* * *

[ සියලුම හිමිකම් ඇවිරිණි]
[KOg; gjpg;Gupik cilaJ]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය / Ministry of Education - Division of Piriven Education / fy;tp mikr;R - gpupntdhf;; fy;tpg; gpupT

# පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2024

05 ශ්‍රේණිය

(08) සමාජ විද්‍යාව - I, II

| 08 | S | I, II |
|---|---|---|

පැය තුන යි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## සමාජ විද්‍යාව I පත්‍රය

**සැලකිය යුතුයි :**

* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40 ක්** ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යෙදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

1. ''සමාජ විද්‍යාව, සමාජ සම්බන්ධතා පිළිබඳ විද්‍යාව වේ.'' යන නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් ද?
   (1) හැරී එම්. ජොන්සන් ය. (2) රොබට් පාර්ක් ය.
   (3) කිංස්ලි ඩේවිස් ය. (4) ඒ.ඩබ්ලිව්. ස්මෝල් ය.

2. සමාජ විද්‍යාව විෂය ලොවට හඳුන්වා දීම සඳහා පුරෝගාමී ව ක්‍රියා කළේ කවුද?
   (1) කාල් මාක්ස් ය. (2) මැක්ස් වෙබර් ය.
   (3) ඔගස්ට් කොම්ට් ය. (4) හර්බට් ස්පෙන්සර් ය.

3. මානව සමාජය පිළබඳ ව ඉතා ගැඹුරින් අධ්‍යයනය කිරීමට හැකි විෂය ක්ෂේත්‍රය කුමක් ද?
   (1) රසායන විද්‍යාව. (2) සමාජ විද්‍යාව.
   (3) භෞතික විද්‍යාව. (4) ජීව විද්‍යාව.

4. අනාගත සමාජයේ පාලකයින් අධර්මිෂ්ඨ හා අඥාන වූ කල අධර්මිෂ්ඨ මනුෂ්‍යයෝ විනිශ්චයකරුවන් වන බවත් ඔවුන් අල්ලස් ගෙන නීතිය අවනීතිය කරන බවත් එවැනි අධාර්මික චර්යාවන් හේතුවෙන් සමාජය පරිහානිය කරා වෙනස් වන බව දැක්වෙන බෞද්ධ ජාතක දේශනාව නම්,
   (1) මහා සුපින ජාතකය යි. (2) සත්තිගුම්භ ජාතකය යි.
   (3) සාම ජාතකය යි. (4) කුස ජාතකය යි.

5. මානව සමාජයෙහි කුල ස්තරායණය ඉතා ප්‍රබල ලෙස අගය කරන ආගමික ඉගැන්වීම් ඇතුළත් වන්නේ,
   (1) ක්‍රිස්තියානි දහමෙහි ය. (2) හින්දු දහමෙහි ය.
   (3) ඉස්ලාම් දහමෙහි ය. (4) බුදු දහමෙහි ය.

- පහත සඳහන් සමාජ ලක්ෂණ ඉතා හොඳින් අධ්‍යයනය කර 6වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A - ආරෝපිත දිශානතික ලක්ෂණ.
B - සංකීර්ණ ශ්‍රම විශේෂායණය.
C - පොදු අරමුණු පැවතීම.
D - නිලබල රටාවක් හෙවත් ධුරාවලී ක්‍රමයක් පැවතීම.
E - මානව නිදහස අගය කිරීම.
F - සමාජ සම්බන්ධතා මගින් සමාජ පාලනය වීම.

[2 වැනි පිටුව බලන්න.

6. පැරණි මානව සමාජයෙහි දක්නට **නො ලැබෙන** සමාජ ලක්ෂණ පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) A, B හා C ය. (2) D, E හා F ය. (3) A, C හා F ය. (4) B, D හා E ය.

7. බහු ජාතික සමාජයක් විසංවිධානය වීම කෙරෙහි බලපෑම් ඇති කරන සාධකය ඇතුළත් වරණය තෝරන්න.
(1) තම සංස්කෘතිය ශ්‍රේෂ්ඨ යැ යි ආත්ම කේන්ද්‍රීය ව සිතීම.
(2) අන්තර්සංස්කෘතික සහජීවනයෙන් කටයුතු කිරීම.
(3) විවිධ සංස්කෘතීන්වල ලක්ෂණ අධ්‍යයනය කිරීම.
(4) සහකම්පනයෙන් යුතු ව කටයුතු කිරීම.

8. සත්ත්වයකුගේ පරිණාමය මගින් සමාජ ප්‍රභවය සිදු වූ බව විස්තර කෙරෙන බෞද්ධ සූත්‍ර දේශනාව වන්නේ,
(1) චක්කවත්තිසීහනාද සූත්‍රය යි. (2) අග්ගඤ්ඤ සූත්‍රය යි.
(3) මහා පරිනිබ්බාන සූත්‍රය යි. (4) සිගාලෝවාද සූත්‍රය යි.

- ප්‍රශ්න අංක 09 – 10 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් සමාජ පරිණාමීය අවධි අධ්‍යයනය කරන්න.

A - දේවවාදී අවධිය
B - සාම්ප්‍රදායික ආධිපත්‍යය
C - පූර්ණ කොමියුනිස්ට් අවධිය
D - යාන්ත්‍රික ඒකාබද්ධතා අවධිය
E - අනුභාසාත්මක ආධිපත්‍යය
F - පූර්ව කොමියුනිස්ට් අවධිය

9. සමාජ ගැටුම් හා පන්ති විරහිත සමාජ අවධි නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) A හා B ය. (2) C හා D ය. (3) E හා F ය. (4) C හා F ය.

10. මැක්ස් වේබර් විසින් සමාජ විද්‍යාව විෂයට හඳුන්වා දෙන ලද සංකල්ප ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) B හා E ය. (2) A හා B ය. (3) D හා E ය. (4) C හා F ය.

11. රාජ්‍ය පාලකයා නිරතුරුව ම හොරකම හා දූෂණය අවම කර ගෙන ජනතාවගේ ආර්ථික සංවර්ධනය උදෙසා කටයුතු කළ යුතු බව කරුණු ඉදිරිපත් කරන බෞද්ධ සූත්‍ර දේශනාව මින් කුමක් ද?
(1) මහා මංගල සූත්‍රය යි. (2) කූටදන්ත සූත්‍රය යි.
(3) අග්ගඤ්ඤ සූත්‍රය යි. (4) සිගාලෝවාද සූත්‍රය යි.

12. මෙරට බෞද්ධ අධ්‍යාපන ක්‍රමයේ ඉතා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කිරීමේ අරමුණින් ඉදි කරන ලද ප්‍රථම පිරිවෙන නම්,
(1) පධානඝර පිරිවෙන යි. (2) ග්‍රන්ථාකාර පිරිවෙන යි.
(3) මහකාලප්‍රාසාද පිරිවෙන යි. (4) මයූරපාද පිරිවෙන යි.

- පහත සඳහන් සමාජ විද්‍යා න්‍යායන් අධ්‍යයනය කරන්න.

A - කෘත්‍යවාදී න්‍යාය
B - චර්යාවාදී න්‍යාය
C - ගට්ටනවාදී න්‍යාය

13. ඉහත දැක්වෙන න්‍යායන් ඉදිරිපත් කරන ලද සමාජ විද්‍යාඥයින් අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) එමිල් ඩූර්කයිම්, මැක්ස් වේබර්, කාල් මාක්ස්
(2) කාල් මාක්ස්, මැක්ස් වේබර්, එමිල් ඩූර්කයිම්
(3) එමිල් ඩූර්කයිම්, කාල් මාක්ස්, මැක්ස් වේබර්
(4) මැක්ස් වේබර්, කාල් මාක්ස්, එමිල් ඩූර්කයිම්

14. රාජාණ්ඩු පාලන ක්‍රමයක් පැවතීම, පරපුරෙන් නිලතල හිමි වීම, ආරෝපිත දිශානතිය, සාමූහික මානසිකත්වය යන සමාජ ලක්ෂණ පැවතියේ,
(1) නීතිමය ආධිපත්‍යයෙහි ය (2) සාම්ප්‍රදායික ආධිපත්‍යයෙහි ය
(3) අනුභාසාත්මක ආධිපත්‍යයෙහි ය (4) යථානුභූත ආධිපත්‍යයෙහි ය

15. රෝදය, යකඩ, වාෂ්ප බලය, පෙට්‍රෝලියම් ආදිය සොයා ගැනීම සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය මින් කුමක් ද?
(1) සමාජ දරිද්‍රතාව ඇති වීමේ බලවේග බවට පත් විය.
(2) සමාජ සම්ප්‍රදායන් පරිහානියට හේතු විය.
(3) සමාජ පරිණාමීය ක්‍රියාවලියේ ප්‍රධාන බලවේග බවට පත් විය.
(4) සමාජ ධූරාවලියේ කුල ක්‍රමය නිර්මාණය වීමට හේතු විය.

[3 වැනි පිටුව බලන්න.

- පහත සඳහන් සූත්‍ර හා ඒවායේ අන්තර්ගත ඉගැන්වීම් ඉතා හොඳින් අධ්‍යයනය කර 16වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

| **(අ) තීරුව** | **(ආ) තීරුව** |
| --- | --- |
| (1) කූටදන්ත සූත්‍රය | (A) මානව අන්තර් සම්බනන්ධතා ක්‍රියාවලිය සවිමත් කිරීමට මාර්ගෝපදේශ |
| (2) සිගාලෝවාද සූත්‍රය | (B) රස තෘෂ්ණාවෙන් ආධ්‍යාත්මික සුවය නැති වන ආකාරය |
| (3) වාසෙට්ඨ සූත්‍රය | (C) ජීව විද්‍යාත්මක පදනමින් නිර්මිත කුල ස්තරායණය බැහැර වන අයුරු |
| (4) අග්ගඤ්ඤ සූත්‍රය | (D) පාලකයා විසින් ආර්ථික සංවර්ධනය ඇති කිරීමට ක්‍රියා කළ යුතු අයුරු |

16. ඉහත (අ) තීරුව (ආ) තීරුව සමග වඩාත් නිවැරදි අනුපිළිවෙළින් ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර වන්නේ,
    (1) A, B, C හා D ය. (2) B, C, D හා A, ය.
    (3) C, D, A, හා B ය. (4) D, A, C හා B ය.

17. නිලබල සංවිධාන ක්‍රමයක් තුළ දක්නට **නො ලැබෙන** ලක්ෂණය මින් කුමක් ද?
    (1) අධිකාරිමය ධූරාවලියක් පැවතීම
    (2) අපෞද්ගලික සම්බන්ධතා පැවතීම
    (3) නීති රීති පද්ධතියක් පැවතීම
    (4) හිතවත්කම් මත තනතුරු පිරිනැමීම.

18. ද්වන්දාත්මක භෞතිකවාදය හා ඓතිහාසික භෞතිකවාදය යන න්‍යායන් සමාජ විද්‍යා විෂය ධාරාවට හඳුන්වා දෙනු ලැබුයේ,
    (1) කාල් මාක්ස් විසින් ය. (2) මැක්ස් වේබර් විසින් ය. (3) එමිල් ඩූර්කයිම් විසින් ය. (4) රැල්ෆ් ලින්ටන් විසින් ය.

- පහත සඳහන් සිද්ධි යුගල ඉතා හොඳින් අධ්‍යයනය කර 19 සහ 20 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - (i) සමාජ විද්‍යා පර්යේෂණ
    (ii) නව දැනුම් සම්භාරය
B - (i) ඒක පුද්ගල ආදායම
    (ii) දිළිඳු බව
C - (i) සෞඛ්‍ය පහසුකම්
    (ii) පුද්ගල ආයු අපේක්ෂාව
D - (i) ආර්ථික දරිද්‍රතාව
    (ii) පෝෂණ මට්ටම

19. පළමුවැන්නේ (i) වැඩි වීම දෙවැන්නේ (ii) වැඩි වීම කෙරෙහි බලපාන නිවැරදි සිද්ධි යුගල දෙක වන්නේ,
    (1) A සහ B ය. (2) B සහ C ය. (3) C සහ D ය. (4) A සහ C ය.

20. පළමුවැන්නේ (i) අඩු වීම දෙවැන්නේ (ii) වැඩි වීම කෙරෙහි බලපාන වඩාත් නිවැරදි සිද්ධි යුගල දෙක වන්නේ,
    (1) A සහ B ය. (2) C සහ D ය. (3) A සහ C ය. (4) B සහ D ය.

21. "පේතවත්ථු - විමානවත්ථු" දේශනාවේ සමාජ විද්‍යාත්මක වැදගත්කම වඩාත් නිවැරදි ලෙස දැක්වෙන වරණය තෝරන්න.
    (1) සමාජ පාලනයට හේතු වන බව නිසා ය. (2) දෙව් ලොව යැමට හේතු වන බව නිසා ය.
    (3) අපායගාමී වීමට හේතු වන බව නිසා ය. (4) සමාජ විෂමතාවට හේතු වන බව නිසා ය.

22. බ්‍රිතාන්‍ය මානව විද්‍යාවේ පුරෝගාමියා ලෙස හඳුන්වනු ලබන්නේ,
    (1) ඔගස්ට් කොම්ට් ය. (2) ඊ.බී ටයිලර් ය.
    (3) බී. මැලිනොවුස්කි ය. (4) සිසාරෝ ලොම්බ්‍රෝසෝ ය.

23. සමාජානුයෝජන ක්‍රියාවලියේ දී ප්‍රාථමික සමාජානුයෝජනය වඩාත් හොඳින් සිදු කෙරෙනුයේ,
    (1) පාසල මගිනි. (2) පන්සල මගිනි.
    (3) මානව පවුල මගිනි. (4) සම වයස් කණ්ඩායම් මගිනි.

[4 වැනි පිටුව බලන්න.

24. බුදු දහමේ ඉගැන්වෙන "අභය දානය" නම් සංකල්පයේ සමාජ විද්‍යාත්මක අගය දැක්වෙන අදහස මින් කවරක ද?
(1) සුපහන් සිතින් අන්‍යයන් සමග එක් ව දන් දිය යුතු බව කියවෙන නිසා ය.
(2) මියගිය ඥාතිවරුන් වෙනුවෙන් පින් පෙත් අනුමෝදන් කළ යුතු බව කියවෙන නිසා ය.
(3) නිර්භීත ව තමා සතු සම්පත් දන් දිය යුතු බව කියවෙන නිසා ය.
(4) සියලු සතුන්ට ජීවත් වීමට ඇති අයිතිය ආරක්ෂා කළ යුතු බව කියවෙන නිසා ය.

25. යම්කිසි සංස්කෘතියක පවතින අංග තවත් සංස්කෘතියකට ව්‍යාප්ත වීම හැඳින්වෙන්නේ,
(1) සංස්කෘතික විසරණය ලෙස යි.
(2) සංස්කෘතික සම්පර්කය ලෙස යි.
(3) සංස්කෘතික ලැග්ම ලෙස යි.
(4) සංස්කෘතික ගැටුම ලෙස යි.

- පහත සඳහන් සංස්කෘතීන් හා සංස්කෘතික උත්සව ඉතා හොඳින් අධ්‍යයනය කර 26වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| (1) - | බෞද්ධ සංස්කෘතිය | A - | නත්තල් උත්සවය |
| (2) - | හින්දු සංස්කෘතිය | B - | රාමසාන් |
| (3) - | ඉස්ලාම් සංස්කෘතිය | C - | දළදා පෙරහැර |
| (4) - | ක්‍රිස්තියානි සංස්කෘතිය | D - | තෛපොංගල් |

26. ඉහත සංස්කෘතීන් අනුපිළිවෙළට සංස්කෘතික උත්සව නිවැරදි ව ගැළපූ විට දැක්වෙන නිවැරදි වරණය තෝරන්න.
(1) A, B, C හා D ය. (2) C, D, B හා A ය. (3) C, B, A හා D ය. (4) C, D, A හා B ය.

- පහත සඳහන් වන කෘතීන් අධ්‍යයනය කර 27වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A - අල්- කුර්ආන් C - භගවත් ගීතාව.
B - ධම්මපදය D - බයිබලය.

27. ඉහත දැක්වෙන ආගමික කෘතීන්වලට අනුගතව චර්යාවන් ගොඩනගා ගත් ආගමික සංස්කෘතීන් අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) බෞද්ධ සංස්කෘතිය, ඉස්ලාම් සංස්කෘතිය, හින්දු සංස්කෘතිය, ක්‍රිස්තියානි සංස්කෘතිය
(2) ඉස්ලාම් සංස්කෘතිය, බෞද්ධ සංස්කෘතිය, හින්දු සංස්කෘතිය, ක්‍රිස්තියානි සංස්කෘතිය
(3) ඉස්ලාම් සංස්කෘතිය, හින්දු සංස්කෘතිය, බෞද්ධ සංස්කෘතිය, ක්‍රිස්තියානි සංස්කෘතිය
(4) ඉස්ලාම් සංස්කෘතිය, හින්දු සංස්කෘතිය, ක්‍රිස්තියානි සංස්කෘතිය, බෞද්ධ සංස්කෘතිය

28. ශ්‍රී ලාංකේය සමාජ පිළිබඳ ව තොරතුරු අනාවරණය කෙරෙන දේශීය මූලාශ්‍රය පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) මහාවංසය, චූලවංසය, සමන්තපාසාදිකාව, බෝධිවංසය
(2) රාජරත්නාකරය, ලංකාවතාරසූත්‍ර, රාජතරංගනී, බෝධිවංසය
(3) පූජාවලිය, බෝධිවංසය, ලංකාවතාරසූත්‍ර, චූලවංසය
(4) මහාවංසය, සමන්තපාසාදිකාව, රාජතරංගනී, පූජාවලිය

29. තණකොළවල පවා දෙවියන් වාසය කරන බව ආදිතම ශ්‍රී ලාංකිකයන් විශ්වාස කළ බව දැක්වෙන මූලාශ්‍රය කුමක් ද?
(1) බෝධිවංසය
(2) සද්ධර්මාලංකාරය
(3) සද්ධර්මරත්නාවලිය
(4) පූජාවලිය

30. පුද්ගලයා සමාජගත කරන සමාජයේ කුඩා ම තැනුම් ඒකකය නම්,
(1) පාසල යි
(2) පිරිවෙන යි
(3) මානව පවුල යි
(4) පෙර පාසල යි

31. දෙමාපිය - දූදරු, ගුරු - සිසු, අඹු - සැමි යන සම්බන්ධතා සමාජ විද්‍යාවෙහි වඩාත් හොඳින් අර්ථ නිරූපණය කර ඇත්තේ,
(1) සමාජ සංස්ථා සංකල්පයෙහි ය.
(3) සමාජ සමූහ සංකල්පයෙහි ය.
(2) තත්ත්වය හා කාර්යභාරය සංකල්පයෙහි ය.
(4) සමාජ ක්‍රියා සංකල්පයෙහි ය.

32. සිගාලෝවාද සූත්‍රය මගින් සමාජ කණ්ඩායම් හයක් දැක්වෙන අතර ඔවුනොවුන් අතර ඉටු කළ යුතු යුතුකම් හා අයිතිවාසිකම් ද විස්තර කර ඇත. මෙම සංකල්පය හැඳින්වෙන්නේ,
(1) සදිසා නමස්කාරය ලෙස යි.
(2) කර්ම ක්ලේෂ ලෙස යි.
(3) අපායමුඛ ලෙස යි.
(4) අගති ලෙස යි.

[5 වැනි පිටුව බලන්න.

33. දකුණු ඉන්දීය ආක්‍රමණිකයින්ගේ බලපෑම ප්‍රබල ලෙස වැව් අමුණු ඇතුළු වාරිමාර්ග පද්ධතිය බිඳ දැමීම කෙරෙහි එල්ල වූයේ මෙරට,
   (1) කෘෂිකර්මය මූලික වූ ස්වයංපෝෂිත ආර්ථිකය බිඳ දැමීමට යි.
   (2) ඔවුන්ගේ යටත්විජිතයක් බවට පත් කර ගැනීමට යි.
   (3) ස්වාභාවික පරිසර පද්ධතියට හානි පැමිණවීමට යි.
   (4) බෞද්ධ භික්ෂූන් වහන්සේලා ප්‍රධාන රටවැසියන් බිය වැද්දීමට යි.

34. "මෙම දීපයෙහි යම් යහපත් ගමක් ඇතොත් එහි විහාරයක් හා දේවාලයක් ඇත." යනුවෙන් ශ්‍රී ලාංකේය සමාජ ව්‍යුහය පිළිබඳ ගැඹුරු විග්‍රහයක් ඉදිරිපත් කරන ලද්දේ,
   (1) රොබට් බ්‍රවුන්රිග් විසින් ය.
   (2) රොබට් නොක්ස් විසින් ය .
   (3) රොබට් පාර්ක් විසින් ය.
   (4) හර්බට් ස්පෙන්සර් විසින් ය.

35. පැරණි ශ්‍රී ලාංකේය සමාජයෙහි අන්තර්ගත වූ ලක්ෂණ පමණක් ඇතුළත් වඩාත් නිවැරදි පිළිතුර කුමක් ද?
   (1) විස්තාරිත පවුල් ක්‍රමය, වෘත්තීය ප්‍රමුඛ වූ කුල ක්‍රමය, ආරෝපිත තත්ත්වය ප්‍රධාන වීම
   (2) සාධිත තත්ත්වය ප්‍රධාන වීම, බද්ධ පවුල් ක්‍රමය, පිතෘ මූලික පවුල් ක්‍රමය
   (3) න්‍යෂ්ටික පවුල් ක්‍රමය, ආරෝපිත තත්ත්වය ප්‍රධාන වීම, පවුලේ ප්‍රධානියා වැඩිමහලු පිරිමියා වීම
   (4) ස්වාභාවික වස්තූන් දේවත්වයෙන් පිදීම, සංකීර්ණ ශ්‍රම විභජනය, මාතෘවාසික පවුල

36. ශ්‍රී ලාංකේය අද්‍යතන සමාජයෙහි බහුල වශයෙන් දක්නට ලැබෙන පවුල් විශේෂය කුමක් ද?
   (1) විස්තෘත පවුල
   (2) න්‍යෂ්ටික පවුල
   (3) පිතෘවාසික පවුල
   (4) මාතෘවාසික පවුල

- පහත සඳහන් කාර්යභාරයන් ඉතා හොඳින් අධ්‍යයනය කර 37වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A - අපරාධ පිළිබඳ ව පරීක්ෂණ පැවැත්වීම
B - නීත්‍යානුකූල ව බලය ලැබූ රාජ්‍යය ආරක්ෂා කිරීම
C - වැරදිකරුවන්ට දඬුවම් ලබා දීම
D - නීති කඩකරන්නන් අධිකරණය හමුවට ඉදිරිපත් කිරීම
E - නීති විරෝධි කටයුතු වැළැක්වීම

37. ඉහත සඳහන් කාර්යභාරයන් අතරින් පොලිසිය සතු කාර්යභාරයක් ඇතුළත් **නො වන** වඩා නිවැරදි පිළිතුර තෝරන්න.
   (1) A, B, C හා D ය.
   (2) A, B, D හා E ය.
   (3) A, C, D හා E ය.
   (4) B, C, D හා E ය.

38. සමාජ පාලනයේ දී ආගමික නීතිය මූලික වශයෙන් යොදා ගැනෙන රටවල් පමණක් ඇතුළත් වරණය කුමක් ද?
   (1) ඉන්දුනීසියාව හා නෙදර්ලන්තය
   (2) ඉරානය හා සවුදි අරාබිය
   (3) ඉරානය හා ප්‍රංශය
   (4) ඉරානය හා එංගලන්තය

39. මාතලේ කවටයාමුණ, වැවුරුකන්නල හා පන්නිපිටිය දෙව්රම්වෙහෙර යන විහාරස්ථානවල මෙන් ම බොහෝ බෞද්ධ විහාරස්ථානවල අපාය පිළිබඳ නිර්මාණ දැක ගත හැකි ය. ඒවායෙහි සමාජ විද්‍යාත්මක අගය කුමක් ද?
   (1) ස්වයං ශික්ෂණයකින් සමාජය පාලනය කිරීම යි.
   (2) අපාය ඇති බව සමජ ගත කිරීම යි.
   (3) අපගාමී චර්යාවන් ප්‍රතික්ෂේප කිරීම යි.
   (4) බෞද්ධ දර්ශනයෙහි එන මූලික සංකල්පයක් ප්‍රකට කිරීම යි.

40. ස්වයං පාලනය උදෙසා ව්‍යාපාදය නම් නීවරණ ධර්මය බැහැර කිරීම සඳහා උපයෝගී කර ගැනීමට වඩාත් සුදුසු භාවනා ක්‍රමය වන්නනේ මින් කුමක් ද?
   (1) මෙත්තානුස්සති භාවනාව
   (2) බුද්ධානුස්සති භාවනාව
   (3) අසුභානුස්සති භාවනාව
   (4) මරණානුස්සති භාවනාව

* * *

[6 වැනි පිටුව බලන්න

[ සියලුම හිමිකම් ඇවිරිණි]
[KOg; gjpg;Gupik cilaJ]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය / Ministry of Education - Division of Piriven Education / fy;tp mikr;R - gpupntdhf; fy;tpg; gpupT

# පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2024

## 05 ශ්‍රේණිය

## (8) සමාජ විද්‍යාව - II

| 08 | S | I, II |
|---|---|---|

- **පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් ද තෝරා ගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

1. i. එමිල් ඩූර්කයිම් විසින් ඉදිරිපත් කරන ලද මානව සමාජ පරිණාමීය අවධි **දෙක** නම් කරන්න.
   ii. සමාජ විද්‍යාව ඉගෙනීමෙන් ඔබට ඇති ප්‍රයෝජන **දෙකක්** නම් කරන්න.
   iii. බෞද්ධ සමාජ විද්‍යාව තුළ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ **දෙක** නම් කරන්න.
   iv. කෙටිකාලීන ව සමාජය වෙනස් වීම කෙරෙහි බලපෑම් කරන සාධක **දෙකක්** ලියන්න.
   v. නවීකරණයේ ප්‍රධාන අංශය **දෙකක්** ලියන්න.
   vi. බෞද්ධ හා හින්දු සංස්කෘතියට පොදු වටිකමින් යුතු ආගමික ඉගැන්වීම් **දෙකක්** නම් කරන්න.
   vii. ශ්‍රී ලංකා සමාජයේ දක්නට ලැබෙන උපසංස්කෘතීන් **දෙකක්** නම් කරන්න.
   viii. මානව පවුලේ මූලික කාර්යයන් **දෙකක්** ලියන්න.
   ix. සමාජය පාලනය සඳහා උපයෝගී කර ගනු ලබන ප්‍රධාන සමාජ පාලන යාන්ත්‍රණ **දෙක** නම් කරන්න.
   x. නීතිය තුළ හඳුනා ගත හැකි ප්‍රධාන ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

2. i. සමාජය විද්‍යාත්මක ව අධ්‍යයනය කිරීම සඳහා ඔගස්ට් කොම්ට් විසින් හඳුන්වා දෙන ලද ප්‍රධාන අංශයන් **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)
   ii. මිනිසා සමාජ සත්ත්වයෙකු බවට පත් කරන සමාජ සංස්ථා **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   iii. බුදු දහමේ සමාජ විද්‍යාත්මක පදනම සාධක **දෙකක්** ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි)

3. i. සමාජ විද්‍යාව පිළිබඳ නිර්වචනයක් ලියන්න. (ලකුණු 02 යි)
   ii. සමාජ විද්‍යාවේ විෂය ක්ෂේත්‍ර **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   iii. බුදු දහමේ මූලික ඉගැන්වීමක් වන හේතුඵල වාදයේ සමාජ විද්‍යාත්මක වටිනාකම කරුණු **දෙකක් ඇසුරින්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

4. i. සාම්ප්‍රදායික ශ්‍රී ලංකේය සමාජයේ දක්නට ලැබෙන යාන්ත්‍රික ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)
   ii. සමාජ නවීකරණයේ අංග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   iii. මැක්ස් වෙබර්ගේ සාම්ප්‍රදායික ආධිපත්‍ය සංකල්පයට අනුව මෙරට ජන සමාජයේ දක්නට ලැබුණු ලක්ෂණ **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

5. i. කාර්මීකරණයේ යහපත් ලක්ෂණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
   ii. නාගරීකරණය නිසා ශ්‍රී ලංකේය සමාජයට සිදු වූ අහිතකර බලපෑම් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)
   iii. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයට අනුව පුද්ගලයාගේ මෙලොව දියුණුව සඳහා හේතු වන කරුණු **දෙකක්**පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

[7 වැනි පිටුව බලන්න.

6. i. සංස්කෘතියේ ප්‍රධාන බෙදීම් **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)
   ii. සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට ඉවහල් වන බෞද්ධ ඉගැන්වීම් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   iii. විහාරස්ථාන කේන්ද්‍ර කර ගෙන ආරම්භ වූ දහම් පාසල් අධ්‍යාපනයේ වැදගත්කම කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

7. i. සමාජයක් යනු කුමක් දැ යි අර්ථ විවරණය කරන්න. (ලකුණු 02 යි)
   ii. ශ්‍රී ලාංකේය සමාජයට 1977 දී හඳුන්වා දෙන ලද විවෘත ආර්ථික ප්‍රතිපත්තිය නිසා සමාජට සිදුවූ බලපෑම් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   iii. සමාජ සාධාරණත්වය තහවුරු කිරීමට උපයෝගි කර ගත හැකි සප්ත අපරිහානිය ධර්ම **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

8. i. ශ්‍රේෂ්ඨාධිකරණය සතු අධිකරණ බලතල **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   ii. අපරාධවල ස්වභාවය අනුව බෙදා දක්වා ඇති ප්‍රධාන වර්ග **තුන** මොනවා ද? (ලකුණු 03 යි)
   iii. පංච නීවරණ ධර්ම බැහැර කළා වූ සමාජයක් නිර්මාණය කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

* * *

# සමාජ විද්‍යාව

## අවසාන වාර ප්‍රශ්න පත්‍ර - 5 ශ්‍රේණිය

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය 2018

## Primary Piriven Year End Tearm Test - 2018

**05 ශ්‍රේණිය/Grade 05**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව **I, II** | කාලය : පැය තුන යි

**Sociology I, II** | **Time : Three Hours**

සමාජ විද්‍යාව **I**

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න. (මෙම කොටස සඳහා ලකුණු 40ක් හිමි වේ.)
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

01. ''සමාජ විද්‍යාව යනු සමාජ සම්බන්ධතා පිළිබඳ විද්‍යාව'' යන අදහස දැක්වූ සමාජ විද්‍යාඥයා වන්නේ,

i. කිංස්ලි ඩේවිස් ය. ii. එච්. පී. ෆෙයාචයිල්ඩ් ය.
iii. ඒ. ඩබ්ලිව්. ස්මේල් ය. iv. රොබට් පාර්ක් ය.

02. සමාජ විද්‍යා විෂය ගොඩනැගීම සඳහා දායක වූ මුල් කාලීන බටහිර සමාජ විද්‍යාඥයන් ඇතුළත් පිළිතුර වන්නේ,

i. ඔගස්ට් කොම්ට්, කිංස්ලි ඩේවිස්, කාල් මාක්ස්, ගරා පෝල්, හොබ් හවුස් ය.
ii. ඔගස්ට් කොම්ට්, හර්බට් ස්පෙන්සර්, එමිල් ඩර්කයිම්, මැක්ස් වේබර්, කාල් මාක්ස් ය.
iii. ජෝන් කැල්වින්, ඔගස්ට් කෙම්ට්, සිසාරෝ ලොම්බ්‍රෝසෝ, කාල් මාක්ස්, හොබ් හවුස් ය.
iv. ඔගස්ට් කොම්ට්, හර්බට් ස්පෙන්සර්, ලියනාඩෝ ඩාවින්චි, රැල්ෆ් ලින්ටන්, කාල් මාක්ස් ය.

03. අනාගත සමාජ වෙනස්වීම ගැන අනාවැකි පවසන බෞද්ධ ජාතක කතාවකි.

i. මහා සුපින ජාතකය ii. වෙස්සන්තර ජාතකය
iii. සම්බුලා ජාතකය iv. ඉල්ලීස ජාතකය

04. වෙනස්වීම නම් ක්‍රියාවලියේ ප්‍රධාන ආකාර තුන වන්නේ,

i. ස්වාභාවික වෙනසවීම, භෞතික වෙනස්වීම, රසායනික වෙනස්වීම යි.
ii. භෞතික වෙනස්වීම, අභෞතික වෙනස්වීම, ස්වාභාවික වෙනසවීම යි.
iii. ආර්ථික වෙනස්වීම, දේශපාලනික වෙනස්වීම, සමාජීය වෙනස්වීම යි.
iv. ස්වාභාවික වෙනසවීම, ජීව විද්‍යාත්මක වෙනස්වීම, සමාජීය වෙනස්වීම යි.

05. සමාජ ප්‍රශ්න විසඳීම සඳහා උපයෝගී කර ගත හැකි කේන්ද්‍රීය බෞද්ධ සංකල්පය වන්නේ,

i. හේතුඵල වාදය යි. ii. සතර අගතිය යි.
iii. ත්‍රිලක්ෂණය යි. iv. ආර්ය අෂ්ඨාංගික මාර්ගය යි.

06. බෞද්ධ සමාජ විද්‍යාවේ ප්‍රධාන ලක්ෂණ දෙක වන්නේ,

i. ආධ්‍යාත්මික පදනම, ව්‍යහාරික පදනම	ii. න්‍යායාත්මක පදනම, ස්වභාවික පදනම

iii. ව්‍යහාරික පදනම, අනෝමිය පදනම	iv. න්‍යායාත්මක පදනම, ව්‍යහාරික පදනම

07. සමාජ පරිණාමය දේවවාදී අවධිය, පාර භෞතික අවධිය, යථානුභූත අවධිය ලෙස වර්ග කළ සමාජ විද්‍යාඥයා කවුද?

i. ඔගස්ට් කොම්ට්	ii. එමිල් ඩුර්කයිම්

iii. මැක්ස් වේබර්	iv. හර්බට් ස්පෙන්සර්

08. පාසල් ගුරුවරයෙකු, විශ්වවිද්‍යාල කථිකාචාර්ය වරයෙකු මෙන් ම පසුව මහාචාර්ය වරයෙකු ලෙස ද ක්‍රියා කළ සමාජ විද්‍යාඥයා වන්නේ,

i. ඔගස්ට් කොම්ට් ය.	ii. හර්බට් ස්පෙන්සර් ය.

iii. එමිමිල් ඩුර්කයිම් ය.	iv. කාල් මාක්ස් ය.

09. සරල තත්ත්වයක සිට සංකීර්ණ තත්ත්වයක් දක්වා සමාජයේ වෙනස් වන බව ප්‍රකාශ කළ සමාජ විද්‍යාඥයා කවුද?

i. බී. මැලිනොවුස්කි	ii. හර්බට් ස්පෙන්සර්

iii. කාල් මාක්ස්	iv. රොබට් නොක්ස්

10. සමාජ පරිණාමය පිළිබඳ අදහස් දක්වන කාල් මාක්ස් ප්‍රධාන න්‍යායන් දෙකක් මුල් කරගෙන අදහස් දක්වා ඇත. එවානම්,

i. ද්වන්ධාත්මක භෞතික වාදය හා ඓතිහාසික භෞතික වාදය යි.
ii. රණකාමී සමාජය හා කාර්මික සමාජය යි.
iii. භෞතික වාදය හා අභෞතික වාදය යි.
iv. පාර භෞතික වාදය හා අනෝමීයත්වය යි.

11. දිගු කාලීන සමාජ වෙනස්වීම් යටතේ නවීකරණයේ අංග ඇතුළත් පිළිතුර තෝරන්න.

i. අධ්‍යාපන නවීකරණය, ජනමාධ්‍ය නවීකරණය, ආහාර නවීකරණය, ප්‍රවාහන නවීකරණය

ii. ආර්ථික නවීකරණය, මත්ද්‍රව්‍ය නවීකරණය, දේශපාලන නවීකරණය, අධ්‍යාපන නවීකරණය

iii. ආර්ථික නවීකරණය, දේශපාලන නවීකරණය, අධ්‍යාපන නවීකරණය, ප්‍රවාහන නවීකරණය,

iv. අධ්‍යාපන නවීකරණය, දේශපාලන නවීකරණය, ආර්ථික නවීකරණය, යටිතල නවීකරණය

12. ඇතෙකුගේ අඩි සලකුණු අනුව ඇතාගේ ප්‍රමාණය තේරුම් ගැනීමට උත්සහා ගැනීමත් එම ආකාරයෙන් ධර්මයේ ගැඹුර දකිමින් විවිධ මිත්‍යා විශ්වාසයන්හි එල්බගෙන සිටින පිරිසකට තුලනාත්මක අධ්‍යාපනයක් තුළින් සත්‍ය අවබෝධ කර ගැනීම සඳහා මඟ පෙන්වන සූත්‍රය කුමක් ද?

i. චුල්ල හත්ථි පදෝපම සූත්‍රය	ii. පණ්ඩිත සූත්‍රය

iii. දේවදූත සූත්‍රය.	iv. චක්ක වත්ති සීහනාද සූත්‍රය

13. ග්‍රාමීය ප්‍රදේශ අර්ධ නාගරික ප්‍රදේශ බවට පත්වී නාගරික ප්‍රදේශ බවට පත් වන බව ප්‍රකාශ කළ සමාජ විද්‍යාඥයා වන්නේ,

i. මැක්ස් වේබර් ය.	ii. හර්බට් ස්පෙන්සර් ය.

iii. කාල් මාක්ස් ය.	iv. මැක්සිම් මැරියම් ය.

14. ''ප්‍රොතෙස්තන්ත්‍ර ආචාර ධර්ම හා ධනවාදයේ හරය'' කිනම් සමාජ විද්‍යාඥයාගේ කෘතියක් ද?

i. මැක්ස් වේබර් ii. එමිල් ඩුර්කයිම්

iii. ඔගස්ට් කොම්ට් iv. හර්බට් ස්පෙන්සර්

15. පහත ''අ'' තීරුවේ සමාජ විද්‍යාඥයින් හා ''ආ'' තීරුවේ සංකල්ප අනුපිළිවෙලින් ගැලපූ විට නිවැරදි පිළිතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?

| (අ) | (ආ) |
|---|---|
| 01. තොන්ස්ටන් සෙලින් | A සංස්කෘතික විසරණය |
| 02. රූත් බෙනඩික්ට් | B සංස්කෘතික ලැග්ම |
| 03. ඩබ්ලිව්. එෆ්. ඔග්බර්න් | A සංස්කෘතික ගැටුම |

i. A, B, C ii. B, C, A

iii. C, A, B iv. A, C, B

16. සංස්කෘතිය සම්බන්ධයෙන් රේමන්ඩ් ෆර්ත් නැමැති සමාජ විද්‍යාඥයාගේ නිර්වචනය මින් කුමක් ද?

i. දෙන ලද ජීවන රටාවක් ඇතුළත පුද්ගලයින් සමූහයක් සංවිධානය වන ආකාරය, සංස්කෘතිය යි.

ii. මිනිසාගේ මනෝ කායික අවශ්‍යතා සපුරාගැනීමට ඇති කර ගත් දෙය, සංස්කෘතිය යි.

iii. මිනිසා පරම්පරාවෙන් පරම්පරාවට දයාද වශයෙන් ගෙන යන ජීවන රටා සමුදාය සංස්කෘතිය යි.

iv. සමාජිකයෙකු වශයෙන් ලබා ගන්නා දැනුම විශ්වාස, කලාව, සිරිත් විරිත්වල එකතුව සංස්කෘතිය යි.

17. නූතන සමාජ හා සංස්කෘතික විපර්යාසයන් කෙරෙහි බලපාන ප්‍රබලතම සමාජ වෙනස්වීමේ කාරකය කුමක් ද?

i. බටහිරකරණය ii. ගෝලීයකරණය

iii. කාර්මීකරණය iv. නාගරීකරණය

18. පුද්ගලයාගේ පෞරුෂත්වය, මනෝ විශ්ලේෂණවාදය පදනම් කරගෙන විග්‍රහ කළ මනෝ විද්‍යාඥයා වන්නේ,

i. ඊ. බී. ටයිලර් ය. ii. ජීන් පියාජේ ය.

iii. මාග්‍රට්මීඩ් ය. iv. සිග්මන් ප්‍රොයිඩ් ය.

19. පැරණි ශ්‍රී ලංකීය සමාජයේ ව්‍යුහය සකස්වී තිබුණේ වැව, ගම, පන්සල කේන්ද්‍රය කරගෙන ය. ඒ පිළිබඳ අධ්‍යනය කළ සමාජ මානව විද්‍යාඥයින් කාණ්ඩය ඇතුළත් පිළිතුර කුමක් ද?

i. ඊ. ආර්. ලිච්, නූර් යාල්මාන්, නිව්ටන් ගුණසිංහ, ගණනාථ ඔබේසේකර

ii. ජීන් පියාජේ, මාග්‍රට්මීඩ්, ඊ. බී. ටයිලර්, ගණනාථ ඔබේසේකර

iii. ඔගස්ට් කොම්ට්, එමිල් ඩුර්කයිම්, මැක්ස් වේබර්, කාල් මාක්ස්

iv. ජීන් පියාජේ, ඊ. ආර්. ලිච්, නූර් යාල්මාන්, ගණනාථ ඔබේසේකර

20. සමාජ විද්‍යාත්මකව ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික ගම හඳුනාගැනීම සම්බන්ධයෙන් රචිත කෘති ඇතුළත් පිළිතුර තෝරන්න.

i. අපේ සංස්කෘතිය හා මිහිකත ii. ලංකා ජනතාව හා ස්වර්ණභූමි

iii. ලංකා ජනතාව හා අපේ සංස්කෘතිය iv. ලක් වැසි හා අපේ සංස්කෘතිය

21. පහත සඳහන් ප්‍රකාශ අතරින් ශ්‍රී ලාංකික සමාජයේ වෙනස්කම් සඳහා බලපෑ හේතු ඇතුළත් පිළිතුර වන්නේ,

A ඉඩම් ප්‍රතිපත්ති
B විවෘත ආර්ථික ප්‍රතිපත්ති
C සාම්ප්‍රදායික නීතිය
D සමාජ සුභසාධනය

i. A, B, C ii. B, C, D iii. C, D, A iv. A, B, D

22. ශ්‍රී ලංකාවට විවෘත්ත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දුන් වර්ෂය වන්නේ,

i. 1967 දී ය. ii. 1968 දී ය.
iii. 1977 දී ය. iv. 1978 දී ය.

23. සාධාරනත්වය හා යුක්තිය වෙනුවෙන් සමාජය පුහුණු කිරීමේ දී බුදුදහම උපයෝගිකරගත හැකි ද්විත්ව ප්‍රවේශයන් වන්නේ,

i. දාර්ශනික ප්‍රවේශය හා උපයෝගීතාවාදී ප්‍රවේශය යි.
ii. දාර්ශනික ප්‍රවේශය හා අන්තර්ජාතික ප්‍රවේශය යි.
iii. අන්තර්ජාතික ප්‍රවේශය හා උපයෝගීතාවාදී ප්‍රවේශය යි.
iv. භෞතික ප්‍රවේශය හා අභෞතික ප්‍රවේශය යි.

24. පහත සඳහන් ප්‍රකාශ අතරින් සමාජය පිළිබඳ විග්‍රහය වඩාත් පැහැදිලි වන ප්‍රකාශය කුමක් ද?

i. අන්තර් ක්‍රියාකාරිත්වය සහිත පොදු ලැදියාවක් හා එකඟතාවයක් රහිත ගොනුවක්
ii. අන්‍යෝන්‍ය අන්තර් ක්‍රියාකාරීත්වයන් සහිත පොදු ලැදියාවක, පොදු එකඟතාවක් සහිත ගොනුවක්
iii. සමාජිකයන් පිරිසක් එක්වීමක් හා පොදු එකඟතාවක් රහිත ගොනුවක්
iv. සමාජික පිරිසකගේ එකතුවක් මෙන් ම අන්තර් අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වයක් නොමැති ගොනුවක්

25. අතීතයේ ශ්‍රී ලංකාවේ අයබදු රැස්කිරීම් ආදී ආර්ථික කටයුතු පිළිබඳ සඳහන් ව ඇති ප්‍රකට සෙල් ලිපියක් වන්නේ,

i. දඹුලු සෙල්ලිපිය යි. ii. සීතාවක සෙල්ලිපිය යි.
iii. මිහින්තලා සෙල්ලිපිය යි. iv. බදුලු සෙල්ලිපිය යි.

26. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රප්තිය හා එකතුකර ගනු ලැබූ වර්ෂය කුමක් ද?

i. 1985 ii. 1981 iii. 1948 iv. 1977

27. නීතිය ක්‍රියාත්මක වීමේ නිමිති අනුව වර්ග කළ හැකි ප්‍රධාන කාණ්ඩ දෙක වන්නේ,

i. සිවිල් නීතිය හා දණ්ඩ නීතිය යි. ii. සිවිල් නීතිය හා අපරාධ නීතිය යි.
iii. අපරාධ නීතිය හා දණ්ඩ නීතිය යි. iv. ආරක්ෂක නීතිය හා අපරාධ නීතිය යි.

28. ශ්‍රී ලංකාවේ පවතින අධිකරණ පද්ධතියේ මට්ටම් පහ නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

i. මහේස්ත්‍රාත් අධිකරණය, යුධ අධිකරණය, දිසා අධිකරණය, අභියාචනාධිකරණය, ශ්‍රේෂ්ඨාධිකාරණය
ii. මහේස්ත්‍රාත් අධිකරණය, දිසා අධිකරණය, මහාධිකරණය, අභියාචනාධිකරණය, ශ්‍රේෂ්ඨාධිකරණය
iii. යුධ අධිකරණය, දිසා අධිකරණය, මහාධිකරණය, ශ්‍රේෂ්ඨාධිකාරණය, අභියාචනාධිකරණය
iv. යුධ අධිකරණය, දිසා අධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණය, අභියාචනාධිකරණය, ශ්‍රේෂ්ඨාධිකරණය

29. බන්ධනාගාර ගත කරන වරදකරුවන් එහි රඳවන ප්‍රධාන අරමුණු දෙක වන්නේ,

i. පුනරුත්තාපනය හා අධ්‍යාපනය යි.
ii. දණ්ඩනය හා නීතිය.
iii. පුනරුත්තාපනය හා නීතිය
iv. පුනරුත්තාපනය හා දණ්ඩනය යි.

30. වයස අවුරුදු 22න් පහළ තරුණ වරදකරුවන් පුනරුත්තාපනය සඳහා ඇතුළත් කර ගන්නා, තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථාන පිහිටි ස්ථාන නිවැරදිව දැක්වෙන වරණය කුමක්ද?

i. බදුල්ල තල්දෙන හා අම්පාර වල්ලන්සේන මධ්‍යස්ථානය
ii. බදුල්ල තල්දෙන හා බන්ඩාරවෙල කොස්දෙණිය මධ්‍යස්ථානය
iii. අම්පාර වල්ලන්සේන හා බන්ඩාරවෙල කොස්දෙණිය මධ්‍යස්ථානය
iv. කොළඹ වැලිකඩ හා මහනුවර බෝගම්බර මධ්‍යස්ථානය

31. පහත සූත්‍ර අතරින් පාලකයා හා පාලිතයන් දෙපාර්ශවය ම ඒකාබද්ධ ව කටයුතු කිරීම සමාජය තුළ අපරාධකාරී චර්යා වළකාලීමට උපකාරීවන බව සඳහන් සූත්‍රයන් ඇතුළත් පිළිතුර තෝරන්න.

A - සිඟාලෝවාද සූත්‍රය
B - පරාභව සූත්‍රය
C - චක්කවත්තී සීහනාද සූත්‍රය
D -. දම්සක් පැවතුම් සූත්‍රය

i. A,B,C
ii. A,B,D
iii. A,C,D
iv. B,C,D

32. සමාජ සාධාරණත්වය හා යුක්තිය තහවුරු කිරීම සඳහා වසල සූත්‍රය මගින් පෙන්වා දෙන බෞද්ධ සමාජ විද්‍යාත්මක ඉගැන්වීම වන්නේ,

i. පුද්ගලයෙකු ආරෝපිත තත්ත්වය මත නොව සාධිත තත්ත්වය මත සමාජ පිළිගැනීමට ලක් විය යුතු බවයි.
ii. පුද්ගලයෙකු සාධිත තත්ත්ව මත නොව ආරෝපිත තත්ත්ව මත සමාජ පිළිගැනීමට ලක්විය යුතු බවයි.
iii. පුද්ගලයෙකු සතු ගුණ දහම් හා උපතින් අත්පත් කරගත් සාධක මත සමාජ පිළිගැනීමට ලක් විය යුතු බවයි.
iv. පුද්ගලයෙකු පරම්පාරවෙන් පරම්පරාවට රැගෙන යන සාධක මත සමාජ පිළිගැනීමට ලක්විය යුතු බවයි.

33. පහත සඳහන් ප්‍රකාශ අතරින් සමාජ ප්‍රශ්නයක් නිවැරදිව හඳුනාගත හැකි ප්‍රකාශ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

A සමාජයේ සැලකිය යුතු මිනිසුන් ගණනාවකට බලපෑම.
B බොහෝ අංශවලින් මිනිසුන්ගේ සාමාන්‍ය පැවැත්ම උදෙසා අහිතකර හා හානිකර තත්ත්වයන් පැවතීම.
C ඒ පිළිබඳ යම්කිසි ක්‍රියාමාර්ග නොගැනීම.
D ක්‍රියාමාර්ග ගත හැක්කේ සාමූහික සමාජ ක්‍රියාකාරීත්වය ඇසුරෙන් වීම.

i. A,B,C ය.
ii. C,D,B ය.
iii. B,C,D ය.
iv. A,B,D ය.

34. දත්ත රැස්කිරීමේ උපකරණවල තිබිය යුතු ගුණාංග ඇතුළත් පිළිතුර කුමක් ද?

i. වලංගුවක, විශ්වාසයතාව, වාස්තවිත භාවය, ප්‍රායෝගික බව
ii. වලංගුවක, විශ්වාසයතාව, වාස්තවිත භාවය, රහස්‍ය බව
iii. වලංගුවක, රහස්‍ය බව, විශ්වාසයතාව, පෞද්ගලික බව
iv. පෞද්ගලික බව, රහස්‍ය බව, වලංගුතාව, ප්‍රායෝගික බව

35. සිවිල් සේනාධීර හා ශාමින්ද වනසිංහ විසින් දත්ත රැස්කිරීමේ දී මූලික වශයෙන් අවධානයට යොමු කළ යුතු කරුණු තුනක් පෙන්වා දී ඇත. එම කරුණු නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

A ප්‍රමාණවත් දත්ත තිබේදැයි නිගමනය

B දැනසිටි දත්ත පිළිබඳ ව සොයා බැලීම

C ගැටලුවට අදාළ නොවන තොරතුරු සොයා බැලීම

D ප්‍රාථමික හා ද්විතියික මූලාශ ගැඹුරින් හැදෑරීම

i. A,B,C ii. B,C,D iii. A,B,D iv. A,C,D

36. අවශ්‍ය දත්ත හඳුනා ගැනීම, ඒ සඳහා අවශ්‍ය උපකරණ පිළියෙල කිරීම, එම උපකරණ ක්‍රියාත්මක කොට අවශ්‍ය දත්ත රැස් කිරීම, තොරතුරු බවට ඒවා පත් කිරීම, වාර්තා කිරීම දත්ත රැස්කිරීමේ ක්‍රියාවලිය ෆැන්කෙල් හා වොලන් හා වොලන් හැඳින්වූයේ කිනම් නමකින් ද?

i. මූලාශ්‍ර ii. උපකරණකරණය

iii. පර්යේෂණ iv. දත්තකරණය

37. ජීවන අත්දැකීම් නම් ක්‍රම වේදය භාවිත කරමින් ශ්‍රී ලංකාවේ යාචකයා පිළිබඳව සමාජ විද්‍යාත්මක පර්යේෂණයක් සිදු කළ ශ්‍රී ලංකික සමාජ විද්‍යාඥයා වන්නේ,

i. මහාචාර්ය නන්දසේන රත්නපාල මහතා ය.

ii. මහාචාර්ය ඩබ්ලිව්. එස්. කරුණාරත්න මහතා ය.

iii. මහාචාර්ය ටෙනිසන් පෙරේරා මහතා ය.

iv. මහාචාර්ය ගණනාථ ඔබේසේකර මහතා ය.

38. පර්යේෂණයක් පැවැත්වීමේ දී භාවිතා කරන ලිඛිත මූලාශ්‍ර ගණයට පමණක් ඇතුළත් වරණය තෝරන්න.

A ජනකථා B සෙල්ලිපි C දේශාටන වාර්තා D ප්‍රතිමා

i. A,B,C ii. A,C,D iii. B,C,D iv. A,D,E

39. පර්යේෂණ වාර්තා සැකසීමේ දී යොමු කළ යුතු කරුණු ඇතුළත් වර්ණය වන්නේ,

A භාෂා විලාසය

B පැටලිලි සහිත වඩා දිගු වූ වාක්‍ය භාවිතය

C අනවශ්‍ය පිරවුම් පද රහිත බව

D වර්ණනා විරහිත බව

E වගු, රූප සටහන්, ප්‍රස්තාරවල නිවැරදි ස්ථානගත කිරීම

i. A,B,C,D ය. ii. B,C,D, E ය. iii. A, B, D,E ය. iv. A,C,D,E ය.

40. පර්යේෂණයක් සඳහා දත්ත රැස්කිරීමේ යනුවෙන් අදහස් කරන්නේ,

i. පර්යේෂණයට අදාළ ගැටළුව පිළිබඳව හැදෑරීමේ ක්‍රියාවලිය යි.

ii. අධ්‍යනයන කරනු ලබන ගැටලුවට අදාළ තොරතුරු රැස් කිරීමේ ක්‍රියාවලිය යි.

iii. ගැටළුව සොයා ඒ සඳහා අවවාද අනුශාසනා දීමේ ක්‍රියාවලිය යි.

iv. ගැටළුවට බලපාන බාහිර බලපෑම් සොයා බැලීමේ ක්‍රියාවලිය යි.

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය 2018

## Primary Piriven Year End Tearm Test - 2018

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**05 ශ්‍රේණිය/**Grade **05**

සමාජ විද්‍යාව I,II
Sociology I, II

**සමාජ විද්‍යාව II**

සැලකිය යුතුයි

» පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
» පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
» මෙම කොටසට ලකුණු 60ක් හිමි වේ.

01)

i. මැක්ස් වේබර් විසින් පෙන්වා දුන් වේබේරියානු සමාජ විද්‍යාවේ විෂය ක්ෂේත්‍ර දෙකක් ලියන්න.

ii. "සමාජ විද්‍යාව යනු සමාජය පිළිබඳව ප්‍රධාන විද්‍යාවයි" යනුවෙන් අර්ථ දැක්වූ සමාජ විද්‍යාඥයා කවු ද?

iii. සමාජ පරිණාමය සම්බන්ධව දැක්වෙන බෞද්ධ සූත්‍ර දෙකක් සඳහන් කරන්න.

iv. සමාජ පරිණාමය සම්බන්ධ අදහස් දැක් වූ සමාජ විද්‍යාඥයින් දෙදෙනෙකු නම් කරන්න.

v. බ්‍රිතාන්‍ය මානව විද්‍යාවේ පියා කවුද?

vi. සප්ත අපරිහානීය ධර්ම වලින් දෙකක් ලියන්න.

vii. මැක්ස් වේබර් දැක් වූ ආධිපත්‍යයේ අවස්ථා තුන සඳහන් කරන්න.

viii. සමාජ ප්‍රශ්නයක් යනු සමාජීය තත්ත්වයක් හෝ සමාජ අවසථාවක්" බව ප්‍රකාශ කළ සමාජ විද්‍යාඥයා කවුද?

ix. මූලාශ්‍ර ප්‍රධාන කාණ්ඩ දෙකකට බෙදිය හැකිය. ඒ මොනවා ද?

x. බෞද්ධ සමාජය තුළ දැකිය හැකි ශ්‍රාවක සමූහ ප්‍රධාන කාණ්ඩ දෙක කුමක් ද?

(ලකුණු 2 x 10 = 20)

02 i. සමාජය විද්‍යාත්මකව හැදෑරීමේ දී අවධානය යොමු කළ යුතු අංශ දෙකක් පිළිබඳව ඔගස්ට් කොම්ට් නැමැති සමාජ විද්‍යාඥයා අවදානය යොමු කර ඇත. එම අංශ දෙක මොනවා ද?

ii. සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රයේ වර්ධනයට එමිල් ඩුර්ක්හයිම් ගෙන් සිදු වූ සේවය පැහැදිලි කරන්න.

iii. න්‍යායාත්මක පදනම මත යමක් විද්‍යාත්මකව අධ්‍යනය කරනු ලබන ආකාරය, බුදු දහමේ සඳහන් සූත්‍ර ඇසුරින් විග්‍රහ කරන්න.

(ලකුණු 2+ 3 +5 = 10)

03 i. සමාජ පරිණාමය යන්න අර්ථ දක්වන්න.

ii. සරල තත්ත්වයක් පැවති සමාජය සංකීර්ණ තත්ත්වයකට පරිණාමය වීම සඳහා ප්‍රධාන සාධක දෙකක් හේතු වන බව එමිල් ඩුර්ක්හයිම් පෙන්වා දී ඇත. ඒ සාධක දෙක හඳුන්වන්න.

iii. සමාජ වෙනස්වීම පිළිබඳ සඳහන් බෞද්ධ ඉගැන්වීම් දෙකක් විස්තර කරන්න.

(ලකුණු 2+ 3 +5 = 10)

04 i. දිගු කාලීන සමාජය වෙනස්වීමේ කාරක දෙකක් නම් කරන්න.

ii. යටත් විජිතකරණය නිසා ශ්‍රී ලාංකේය සමාජයේ ඇති වූ වෙනස්කම් තුනක් සඳහන් කරන්න.

iii. සමාජ සාධාරණත්වය හා යුක්තිය ඇති කිරීම සඳහා බෞද්ධ සමාජ විද්‍යාත්මක සංකල්ප උපයෝගී කර ගත හැකි ආකාරය නිදසුන් දෙකක ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2+ 3 +5 = 10)

05 i. සංස්කෘතිය හැඳින්වීමට නිර්වචනයක් සපයන්න.

ii. සංස්කෘතික විසරණය සිදු වන ආකාරය පැහැදිලි කරන්න.

iii. ගෝලීය ප්‍රවණතා හමුවේ ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතියට එල්ලවී ඇති බලපෑම නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2+ 3 +5 = 10)

06 i. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන සමාජ ප්‍රශ්ණ දෙකක් නම් කරන්න.

ii. "අපරාධය" යන්න අර්ථ දක්වන්න.

iii. අපරාධ ඇති වීමට බලපාන හේතු දෙකක් විස්තර කරන්න.

(ලකුණු 2+ 3 +5 = 10)

07 i. සැලසුමකට අනුව පර්යේෂණයක් සිදු කිරීමෙන් අත්වන ප්‍රයෝජන දෙකක් ලියන්න.

ii. පර්යේෂණයක ඇති වැදගත්කම් තුනක් ලියන්න.

iii. දත්ත රැස්කිරීමේ දී මතුවිය හැකි ගැටලු දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 2+ 3 +5 = 10)

08 i. අපරාධ ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට වර්ග කළ හැකිය. ඒ මොනවා ද?

ii. දිසා අධිකරණය මගින් විභාග කොට තීන්දු දිය හැකි නඩු තුනක් සඳහන් කරන්න.

iii. සමාජ පාලනය සඳහා පොලීසියේ කාර්යභාරය පැහැදිලි කරන්න.

(ලකුණු 2+ 3 +5 = 10)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2019

## Primary PirivenYear End Tearm Test - 2019

**05 ශ්‍රේණිය/Grade 05**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව I, II
sociology Science I, II

කාලය : පැය තුන යි
**Time : Three Hours**

### සමාජ විද්‍යාව I

සැලකිය යුතුයි :

i. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම කොටසට ලකුණු 40ක් හිමි වේ.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.

iii. ඔබට සපයන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට අදාළ කවය තුළ (X) ලකුණ යොදන්න.

iv. මෙම පිළිතුරු පත්‍රයේ පිටුපස, ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

01. "සමාජ විද්‍යාව යනු සමාජය පිළිබඳ ව හදාරන විද්‍යාව යි" යනුවෙන් නිර්වචනය කරනු ලැබුවේ,

i. කිංස්ලි ඩේවිස් ය.
ii. ඔගස්ට් කොම්ට් ය.
iii. ජී.ඩබ්. ස්මෙල් ය .
iv. එමිල් දුර්කයිම ය.

02. සමාජ විද්‍යාව බිහි වීමට පසුබිම වූයේ

i. ගැමි සමාජය යි.
ii. වහල් සමාජය යි.
iii. නාගරික සමාජය යි
iv. ගෝත්‍රික සමාජය යි.

03. ඔගස්ට් කොම්ට් විසින් දක්වා ඇති මානව සමාජ ප්‍රගමනයට අදාළ අවධි නිවැරදිව සඳහන් වන පිළිතුර කුමක් ද?

i. දේවවාදී අවධිය, රණකාමී අවධිය, කාර්මික අවධිය
ii. ප්‍රාථමික අවධිය, පාර භෞතික අවධිය, යථානුභූත අවධිය
iii. රණකාමී අවධිය, කාර්මික අවධිය, යථානුභූත අවධිය
iv. දේවවාදී අවධිය, පාර භෞතික අවධිය, යථානුභූත අවධිය

04. හර්බට් ස්පෙන්සර් දක්වා ඇති මානව සමාජ පරිණාමයට අදාළ අවධි වන්නේ,

A : රණකාමී අවධිය
B : දේවවාදී අවධිය
C : ධනවාදී අවධිය
D : කාර්මික අවධිය

i. A සහ C ය.
ii. A සහ D ය.
iii. B සහ C ය.
iv. B සහ D ය.

05. සමාජ ප්‍රභවය, විකාශනය, දියුණුව, සහ පිරිහීම දක්වෙන බෞද්ධ සූත්‍රය වන්නේ,

i. අග්ගඤ්ඤ සූත්‍රය යි
ii. චක්කවත්ති සීහනාද සූත්‍රය යි
iii. වසල සූත්‍රය යි
iv. පරාභව සූත්‍රය යි

06. යුරෝපයේ කාර්මික විප්ලවය සිදු වූ කාල වකවානුව වන්නේ,

i. ක්‍රි.ව. 1770 සිට 1840 දක්වා ය.
ii. ක්‍රි.ව. 1760 සිට 1830 දක්වා ය.
iii. ක්‍රි.ව. 1775 සිට 1880 දක්වා ය.
iv. ක්‍රි.ව. 1760 සිට 1835 දක්වා ය.

07. ප්‍රොතෙස්තන්ත ආචාරධර්ම හඳුන්වා දෙනු ලැබුවේ,

i. මැක්ස් වෙබර් ය.
ii. ජෝන් ස්ටුවර්ට් මිල් ය.
iii. විල්බට් මුවර් ය.
iv. ජොන් කැල්වින් ය.

08. සමාජ පරිණාමය පිළිබඳ කාල් මාක්ස්ගේ ආකෘතියේ දක්වෙන පන්ති විරහිත සමාජ පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?

i. ප්‍රාග් කොමියුනිස්ට් අවධිය, සමාජවාදී අවධිය, සුපිරි කොමියුනිස්ට් අවධිය
ii. වහල් අවධිය, වැඩවසම් අවධිය, සමාජවාදී අවධිය
iii. ධනවාදී අවධිය, සමාජවාදී අවධිය, සුපිරි කොමියුනිස්ට් අවධිය
iv. වැඩවසම් අවධිය, ධනවාදී අවධිය, ප්‍රාග් කොමියුනිස්ට් අවධිය

09. ශ්‍රී ලංකාවට පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ලැබෙන්නට බල පෑ ආසන්න ම සාධකය වූයේ,

i. [illegible]
ii. කාර්මීකරණය යි
iii. යටත්විජිතකරණය යි
iv. නාගරිකරණය යි

10. පහත සඳහන් කරුණු සලකා බලන්න.

A : ශ්‍රම විභජනය ඉහළ යාම
B : මිනිස් ශ්‍රමය වෙනුවට යන්ත්‍ර සූත්‍ර ආදේශ කිරීම
C : සාම්ප්‍රදායික සංස්කෘතික සබඳතා වර්ධනය වීම
D : ගෘහස්ත කර්මාන්ත මහා පරිමාණ කර්මාන්ත බවට පත්වීම

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් කාර්මීකරණය නිසා ඇති වූ ප්‍රතිඵල නිවැරදිව දක්වෙන පිළිතුර තෝරන්න.

i. A,B සහ C
ii. A,B සහ D
iii. A,C සහ D
iv. B, C සහ D

11. "මහරජ ඔබ මේ රටේ භාරකරුවා මිස අයිතිකරුවා නොවේ." යනුවෙන් ප්‍රකාශ කළ හිමි නම වන්නේ,

i. එස් මහින්ද හිමි ය.
ii. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ය.
iii. බලංගොඩ ආනන්ද මෛත්‍රී හිමි ය.
iv. මිහිඳු මහරහතන් වහන්සේ ය.

12. පහත 'අ' යටතේ සඳහන් සංස්කෘතීන් 'ආ' යටතේ සඳහන් ආගමික උත්සව හා අනුපිළිවෙළින් ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?

| අ | ආ |
|---|---|
| 1. හින්දු සංස්කෘතිය | A : නත්තල් උත්සවය |
| 2. ඉස්ලාම් සංස්කෘතිය | B : දීපවාලි උත්සවය |
| 3. බෞද්ධ සංස්කෘතිය | C : රාමසාන් උත්සවය |
| 4. ක්‍රිස්තියානි සංස්කෘතිය | D : වෙසක් උත්සවය |

i. A B D C　　ii. C B D A　　iii. B C D A　　iv. B A D C

13. සාම්ප්‍රදායික ගම පිළිබඳ පැහැදිලි කරන "ලංකා ජනතාව " නම් කෘතියේ කතුවරයා කවුද?

i. පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි　　ii. නිව්ටන් ගුණසිංහ

iii. රොබට් නොක්ස්　　iv. ආචාර්ය නන්දදේව විජේසේකර

14. පහත 'අ' තීරුවේ සමාජ විද්‍යාඥයින් සහ 'ආ' තීරුවේ එම සමාජ විද්‍යාඥයින් භාවිතා කරන ලද අධ්‍යයන ප්‍රවේශයන් දක්වේ.

| අ | ආ |
|---|---|
| 1. ඔගස්ට් කොම්ට් | A : සමාජ කරුණු |
| 2. එමිල් ඩුවර්කයම් | B : අවධි තුනේ පිළිය |
| 3. කාල් මාක්ස් | C : [illegible] |
| 4. මැක්ස් වෙබර් | D : පරා[illegible]ය |

'අ' තීරුවේ නම 'ආ' තීරුවට ගැලපූ පසු ලැබෙන නිවැරදි පිළිතුර වන්නේ,

i. A B D C　　ii. B A D C　　iii. B C D A　　iv. D C B A

15. නව සමාජ ප්‍රවනතා තුනක් සහ ඒ කෙරේ බලපෑ හේතු තුනක් පහත දක්වේ.

| සාධකය | හේතුව |
|---|---|
| 1. ප්‍රජාතාන්ත්‍රිකරණය | A : සංක්‍රමණිකයන්ගේ පැමිණීම |
| 2. නාගරීකරණය | B : යටත් විජිත බිහිවීම |
| 3. බටහිරකරණය | C : ප්‍රංශ විප්ලවය |

එක් එක් සාධකය සඳහා වඩාත් බලපෑම් ඇති කළ හේතුව ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

i. A B C　　ii. A C D　　iii. C A B　　iv. C B A

16. නාගරික සමාජ හා සම්බන්ධයෙන් නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.

i. විස්තෘත පවුල් ක්‍රමයක් දක්නට ලැබීම

ii. මානව අයිතිවාසිකම්වලට මුල්තැන ලැබීම

iii. සිරිත් විරිත්වලට වඩා නීතිය බලවත් වීම

iv. ජනමාධ්‍ය භාවිතය ඉහළ තලයක තිබීම

17. බටහිර මනෝ විද්‍යාවේ පියා ලෙස සලකනු ලබන්නේ,

i. රූත් බෙනඩික් ය.
ii. මාග්‍රට් මීඩ් ය.
iii. ඩබ්. එෆ්. මැග්බර්න් ය.
iv. සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් ය.

18. සංස්කෘතියේ ප්‍රධාන කොටස් දෙක ඇතුළත් වරණය කුමක් ද?

i. මහා සංස්කෘතිය හා උප සංස්කෘතිය
ii. භෞතික සංස්කෘතිය හා අභෞතික සංස්කෘතිය
iii. සාරධර්ම සංස්කෘතිය හා භෞතික සංස්කෘතිය
iv. අභෞතික සංස්කෘතිය හා යථාර්ථවාදි සංස්කෘතිය

19. භෞතික දියුණුවට සාපේක්ෂව අදහස් සහ සම්ප්‍රදාය වෙනස්වීමේ වේගය පසුබෑම හඳුන්වන්නේ,

i. සංස්කෘතික ලැග්ම ලෙස ය.
ii. සංස්කෘතික විසරනය ලෙස ය.
iii. සංස්කෘතික ගැටුම ලෙස ය.
iv. සංස්කෘතික සම්පර්කය ලෙස ය.

20. සාම්ප්‍රදායික ලංකා සමාජයේ පැවති සමානුපාතික ශ්‍රම හුවමාරු ක්‍රමය හැඳින්වූයේ,

i. රාජකාරී ක්‍රමය ලෙස ය
ii. ශ්‍රම සංචලතාව ලෙස ය.
iii. අත්තම් ක්‍රමය ලෙස ය
iv. අධ්‍යාත්මික සම්බන්ධතා ලෙස ය

21. "සාමාජිකයා විසින් අත්පත් කරගනු ලබන දැනුම, විශ්වාස ඇතුළු සියලු දෙය හා ඔහු විසින් නිර්මාණය කරනු ලබන සියලු දෙය සංස්කෘතියට" ඇතුළත් වන බව තම නිර්වචනය මගින් පැහැදිලි කළ මානව විද්‍යාඥයා කවුද?

i. ඊ.බී. ටයිලර්
ii. බී. මැලිනොව්ස්කි
iii. රැල්ෆ් ලින්ටන්
iv. මාග්‍රට් මීඩ්

22. පහත සඳහන් සංකල්ප අතරින් කෙටි කාලීන සමාජ වෙනස් වීම කෙරෙහි බලපාන සාධක පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

A : නවීකරණය
B : දේශපාලන විරෝධතා ව්‍යාපාර
C : මෝස්තර ව්‍යාපාර
D : සංස්කෘතික සහයෝගිතා ව්‍යාපාර

i. CBD
ii. ABD
iii. ABC
iv. BCD

23. පර්යේෂණයක් පැවැත්වීමේ දී භාවිත කරන ලිඛිත මූලාශ්‍ර පමණක් ඇතුළත් වරණය තෝරන්න.

i. ජනකතා , සෙල්ලිපි , දේශාටන වාර්තා
ii. ජනකතා , ගුහා චිත්‍ර , ප්‍රතිමා
iii. ජනකතා , සෙල්ලිපි , ප්‍රතිමා
iv. පර්යේෂණ වාර්තා , ශාස්ත්‍රීය ග්‍රන්ථ , පරිපාලන වාර්තා

24. ශ්‍රී ලාංකික ජන සමාජයේ පැවති උතුම් ආචාර ධර්මයන් වන ආගන්තුක සත්කාරය , පරෝපකාරය විස්තර කෙරෙන එදා හෙළ දිව ග්‍රන්ථය රචනා කළේ කවුරුන් ද?

i. නන්දසේන රත්නපාලයන් ය. ii. එස්. මහින්ද හිමියන් ය.

iii. රොබට් නොක්ස් ය. iv. අනගාරික ධර්මපාලයන් ය.

25. ශ්‍රී ලංකාවේ අධිකරණ ව්‍යුහය ආයතන කීයකින් යුක්ත වේ ද?

i. හතරකි. ii. හයකි.

iii. පහකි. iv. හතකි.

26. නීතිය ක්‍රියාත්මක වීමේ නිමිති අනුව ප්‍රධාන කාණ්ඩ කීයකට බෙදා දැක්විය හැකි ද?.

i. දෙකකි. ii. හතරකි.

iii. තුනකි. iv. එකකි.

27. පහත සඳහන් ක්‍රියාමාර්ග අතුරින් ඒඩ්ස් රෝගය නිවාරණය සඳහා විහාරස්ථානය මුල් කොට ගෙන ගත හැකි ක්‍රියාමර්ග නිවැරදිව දක්වෙන පිළිතුර තෝරන්න.

A : ඒඩ්ස් රෝගය පිළිබඳව සමාජය දැනුවත් කිරීම.

B : පංචශීල ප්‍රතිපත්තිය ආරක්ෂා කිරීමට සමාජය බල ගැන්වීම.

C : පවුල් සමූහය ශක්තිමත් කිරීම සඳහා පුද්ගල ආකල්ප පුවර්ධනය කිරීම

D : ඒඩ්ස් රෝගීන් සහිත පවුල්වලට ආධාර ලබා දීම.

i. A , B පමණි ii. A,B,C පමණි

iii. A,B,D පමණි iv. B,C,D පමණි

28. විජයාගමනය සිදු වූයේ කිනම් සියවසේ දී ද?

i. ක්‍රි.පූ. 3 වන සියවසේ දී ය. ii. ක්‍රි.පූ. 2 වන සියවසේ දී ය.

iii. ක්‍රි.පූ. 6 වන සියවසේ දී ය. iv. ක්‍රි.පූ. 4 වන සියවසේ දී ය.

29. පණ්ඩුකාභය රජු සමයේ කන්න තුනක් ගොවිතැන් කළ බව සඳහන් වන්නේ කුමන සෙල් ලිපියෙහි ද?

i. තෝණිගල සෙල්ලිපිය ii. රජගල සෙල්ලිපිය

iii. සංගමුව සෙල්ලිපිය iv. ගල්පොත සෙල්ලිපිය

30. ලංකාවේ පාසල්වල අධ්‍යාපනය ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වා ගෙන යා යුතු බව නිර්දේශ කරන ලද්දේ කිනම් වර්ෂයක දී ද?

i. ක්‍රි.ව. 1818 දී ය. ii. ක්‍රි.ව. 1833 දී ය

iii. ක්‍රි.ව. 1820 දී ය. iv. ක්‍රි.ව. 1815 දී ය

31. පංච මහාවාදයට නායකත්වය ලබාදෙන ලද්දේ කිනම් භික්ෂූන් වහන්සේ ද?

i. රත්මලානේ ධම්මාලෝක හිමි

ii. බලංගොඩ ආනන්ද හිමි

iii. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

iv. වලානේ ශ්‍රී සිද්ධාර්ථ හිමි

32. කර්නල් හෙන්රි ස්ටිල් ඕල්කට් තුමා කිනම් ජාතිකයෙක් ද?

i. ඔස්ට්‍රේලියානු ජාතිකයෙකි.

ii. බ්‍රිතාන්‍ය ජාතිකයෙකි.

iii. ජර්මන් ජාතිකයෙකි.

iv. ඇමෙරිකානු ජාතිකයෙකි.

33. තම යටත් විජිත ආක්‍රමණ ක්‍රියාවලිය සාධාරණීකරණය කිරීම සඳහා බටහිර ජාතීන් විසින් ප්‍රචලිත කරන ලද මතය වන්නේ මින් කුමක් ද?.

i. ගැටුම් අවම කර ලෝක සාමය ඇති කිරීම.

ii. පෙරදිග ම්ලේච්ඡ ජාතීන් ශිෂ්ඨත්වයට පත් කිරීම ය.

iii. අධිරාජ්‍ය පුළුල් කිරීම.

iv. කතෝලික ආගම ප්‍රචාරය කිරීම යි.

34. පර්යේෂණයක දත්ත රැස් කිරීම සඳහා යොදා ගනු ලබන වඩාත් ප්‍රශස්ත නිරීක්ෂණ ක්‍රමය වන්නේ,

A : වක්‍ර නිරීක්ෂණය

B : සෘජු නිරීක්ෂණය

C : සහභාගී නිරීක්ෂණය

i. A ය. ii. A ය. iii. C ය. iv. A, B ය.

35. සමාජ ගැටලු විසඳා ගැනීමට ගත හැකි වඩාත් සුදුසු ක්‍රියා මාර්ගය වන්නේ,

i. සමාජ ගැටලු සඳහා නිසි පිළියම් යෙදීම යි

ii. සමාජ ගැටලු පිළිබඳ සමාජය දැනුවත් කිරීම යි

iii. නීතිය සෘජුව ක්‍රියාත්මක කිරීම යි

iv. ආචාරශීලි සමාජයක් ගොඩනැගීම ය

36. සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතික වශයෙන් වෙනස්කම් රැසකට මග පාදන ලද විවෘත ආර්ථික ප්‍රතිපත්තිය මෙරට සමාජයට හඳුන්වාදුන් වර්ෂය කුමක් ද?

i. 1972 දී ය. ii. 1977 දී ය. iii. 1983 දී ය. iv. 1994 දී ය.

37. ශ්‍රී ලංකාව සමඟ සම්බන්ධතා පැවැත් වූ රටවල් කිහිපයක් x තීරුවේ ද එම රටවලින් ලැබුණු සංස්කෘතික දායාද කිහිපයක් y තීරුවේ ද දක්වේ.

| x | y |
|---|---|
| 1. ඉන්දියාව | A : රෝම ලන්දේසි නීති ක්‍රමය |
| 2. පෘතුගාලය | B : කච්චේරි ක්‍රමය |
| 3. ඕලන්දය | C : තෝම්බු ක්‍රමය |
| 4. බ්‍රිතාන්‍යය | D : ආයුර්වේදය |

ඉහත y තීරුවේ සඳහන් රටවල් x තීරුවට ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න

i. A, B, C, D

ii. B, A, C, D

iii. C, A, D, B

iv. D, C, A, B

38. ස්වයං විනයක් ඇති කර ගැනීමට බාධාකාරී වන්නේ,

i. පාපයට බිය වීමයි.

ii. අල්පේච්ඡ බව යි.

iii. බහු භාණ්ඩික වීමයි.

iv. සැහැල්ලු පැවතුම් ඇති බව යි.

39. එදිනෙද සිදුවන දේ පිළිබඳ සොයා බැලීම සඳහා කරනු ලබන පර්යේෂණ වර්ගය කුමක් ද?

i. ප්‍රායෝගික පර්යේෂණ

ii. සහසම්බන්ධතා පර්යේෂණ

iii. ඓතිහාසික පර්යේෂණ

iv. අත්හදා බැලීමේ පර්යේෂණ

40. වෙසක් උත්සවය ජාත්‍යන්තර නිවාඩු දිනයක් බවට පත් කිරීම සඳහා මූලිකත්වය ගෙන ක්‍රියා කරන ලද්දේ,

i. ඩී.බී. ජයතිලක මහතා ය.

ii. ලක්ෂ්මන් කදිරගාමර් මහතා ය.

iii. මහින්ද රාජපක්ෂ මහතා ය.

iv. ආනන්ද කුමාරස්වාමි මහතා ය.

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2019

## Primary Piriven Year End Term Test - 2019

**05 ශ්‍රේණිය/Grade 05**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව I, II
sociology Science I, II

**සමාජ විද්‍යාව II**

සැලකිය යුතු යි :

i. පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

01.

i බෞද්ධ සමාජ විද්‍යාවේ ප්‍රධාන ලක්ෂණ දෙක සඳහන් කරන්න.

ii. සමාජ ශාස්ත්‍ර දෙකක් නම් කරන්න.

iii. ආගමික ජීවිතයේ මූලික ස්වරූපය හා ශ්‍රම විභජනය යන ග්‍රන්ථ දෙක රචනා කළ ප්‍රංශ ජාතික සමාජ විද්‍යාඥයා කවරෙක් ද?

iv. චාල්ස් ඩාවින්ට පෙර පරිණාමය ගැන කරුණු දක් වූ බ්‍රිතාන්‍ය ජාතික සමාජ විද්‍යාඥයා නම් කරන්න.

v. යාන්ත්‍රික හා ඓන්ද්‍රිය ඒකාබද්ධතා සංකල්පය ඉදිරිපත් කළ ප්‍රංශ සමාජ විද්‍යාඥයා නම් කරන්න.

vi සිගාලෝවාද සූත්‍රයෙන් හැඳින්වෙන යුතුකම් හා වගකීම් දෙකක් ඉදිරිපත් කරන්න.

vii ශ්‍රී ලංකා සමාජයේ දක්නට ලැබෙන සමාජ ගැටලු දෙකක් සඳහන් කරන්න.

viii බෞද්ධ සමාජ සංස්ථාව නිර්මාණය වන්නේ සැලුම් ගනු ලබන්නේ කවර අංග හතර එකතු වීමෙන් ද?

ix බුදු දහම "විභජ්ජවාදී" ධර්මයක් ලෙස හඳුන්වන්නේ කුමක් නිසා ද?

x ශ්‍රී ලාංකික සමාජ සංවර්ධනය උදෙසා බුදු දහමින් ලබා ගත හැකි ප්‍රයෝජන දෙකක් ලියා දක්වන්න.

(ලකුණු 2 × 5 = 10)

### II කොටස

02

i ඔගස්ට් කොම්ට් පෙන්වා දී ඇති සමාජයක් විද්‍යාත්මකව හැදෑරීමේ දී අවධානය යොමු කළ යුතු ප්‍රධාන අංග දෙක කමක් ද?.

ii සමාජ විද්‍යාවේ විෂය ක්ෂේත්‍රයේ සංවර්ධනයට මැක්ස් වෙබර් විසින් හඳුන්වා දුන් සංකල්ප තුනක් සඳහන් කරන්න.

iii අල්ලාගෙන සිටීමට වඩා අතහැරීමෙන් මිනිසාට ලබා ගත හැකි ප්‍රයෝජන කවරේ ද. යන්න බුදු දහම ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3+ 5 = 10)

03

i 'භික්ෂුව' යනුවෙන් හඳුන්වනු ලබන්නා තුළින් පිළිබිඹු විය යුතු ලක්ෂණ දෙකක් ලියන්න.

ii සමාජ පාලනය සඳහා භික්ෂූන් වහන්සේලාගෙන් සිදුවිය යුතු කාර්යයන් තුනක් සඳහන් කරන්න.

iii අල්පේච්ඡ බව හීන වීමෙන් ශ්‍රී ලාංකික සමාජය මුහුනපාන ගැටළු මොනවා දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3+ 5 = 10)

04

i සංස්කෘතිය යන්න අර්ථකථනය කරන්න.

ii බෞද්ධ සාරධර්ම තුනක් සඳහන් කරන්න.

iii බෞද්ධ සංස්කෘතිය වෙනස්වීම කෙරෙහි බලපාන සාධක දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

05

i ශ්‍රී ලංකාවේ සමාජ විකාශය පිළිබඳව ඓතිහාසික තොරතුරු ලබා ගත හැකි දේශීය කෘති 02 ක් නම් කරන්න.

ii ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ගැමි සමාජය යාන්ත්‍රික ඒකාබද්ධතාව සහිත සමාජයකි '. මෙම ප්‍රකාශය සනාථ කිරීම සඳහා නිදසුන් 03 ක් සපයන්න.

iii යුක්තිගරුක සමාජයක් ගොඩ නඟා ගැනීම සඳහා බෞද්ධ ඉගැන්වීම් උපයෝගී කර ගත හැකි ආකාරය නිදසුන් 02 ක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

06

i වරදකරුවන් බන්ධනාගාරගත කිරීමෙන් අපේක්ෂා කරන ප්‍රධාන අරමුණු 02 මොනවා ද?

ii පර්යේෂණවලින් සමාජයට අත්වන ප්‍රයෝජන තුනක් ලියන්න.

iii මතින් වැළකීම සඳහා බුදුන් වහන්සේ දේශනා කළ ඉගැන්වීම 02 ක් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

07

i පර්යේෂකයෙකු තුළ තිබිය යුතු ගුණාංග දෙකක් සඳහන් කරන්න.

ii දත්ත රැස් කිරීමේ දී සළකා බැලිය යුතු මූලික කරුණු තුනක් සඳහන් කරන්න.

iii දත්ත රැස් කිරීමේදී උද්ගත විය හැකි ගැටළු කවරේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

08

i සමාජ ස්ථරායනය යනුවෙන් අදහස් වන්නේ කුමක් දැයි පෙන්වා දෙන්න.

ii ශ්‍රී ලංකාවේ සමාජ විෂමතාවයට බලපාන සාධක තුනක් සඳහන් කරන්න.

iii යුක්තිය හා සමාජ සාධාරණත්වය උදෙසා බුද්ධ චරිතයෙන් ගත හැකි ආදර්ශය නිදසුන් ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2020

# Primary Piriven Year End Test - 2020

**05 ශ්‍රේණිය/Grade 05**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව I, II
sociology Science I, II

කාලය : පැය තුන යි
Time : Three Hours

## සමාජ විද්‍යාව I

සැලකිය යුතු යි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම කොටසට ලකුණු 40ක් හිමිවේ.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට අදාළ කවය තුළ (X) ලකුණ යොදන්න.

iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

01. "සමාජ විද්‍යාව යනු මානව සමාජය පිළිබඳ ව අධ්‍යයනය කිරීමයි" යනුවෙන් සමාජ විද්‍යාව නිර්වචනය කළ සමාජ විද්‍යාඥයා කවුද?

1. එමිල් ඩුර්කයිම්
2. එලිසබත් ජේ. විල්කින්ස්
3. මැක්ස් වෙබර්
4 හර්බට් ස්පෙන්සර්

02. සමාජය අධ්‍යයනය කිරීමේ දී සමාජ ස්ථිතිකත්වය හා සමාජ ගතිකත්වය පිළිබඳ අවධානය යොමු කළ සමාජ විද්‍යාඥයා වන්නේ,

1. ඔගස්ට් කොම්ට් ය.
2. හර්බට් ස්පෙන්සර් ය.
3. එමිල් ඩුර්කයිම් ය.
4. මැක්ස් වෙබර් ය.

03. සමාජීය විද්‍යා විෂය කාණ්ඩයට අයත් නොවන විෂයයක් වන්නේ,

1. මානව විද්‍යාව
2. මනෝ විද්‍යාව
3. ඉතිහාසය
4. පරිසර විද්‍යාව

04. පෞරුෂය හැඩගැසීමේ දී සමාජානුයෝජන ක්‍රියාවලියේ බලපෑම මැනවින් විග්‍රහ කරන ජාතක කථාවක් වන්නේ මින කුමක්ද?

1. ඉල්ලීස ජාතකය
2. කුස ජාතකය
3. මහා සුපින ජාතකය
4. සත්තිකුම්භ ජාතකය

- අංක 5, 6, 7 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් ප්‍රකාශ උපයෝගී කරගන්න.

A - සරල සමාජ ක්‍රමයක් පැවතීම.
B - දැනුම මගින් ප්‍රගතිය සොයා යාම.
C - සාම්ප්‍රදායික සමාජ සම්බන්ධතා බිඳ වැටීම.
D - ස්වභාවික බලවේගයන් කෙරෙහි බිය මුසු ගෞරවයක් ඇති වී තිබීම.
E - කාර්මික සමාජයක් දක්නට ලැබීම.
F - මිනිසා සාම්ප්‍රදායික ජීවිතයක් පවත්වාගෙන යාම.
G - දියුණු තාක්ෂණය යොදා ගැනීම.
H - නිෂ්පාදන බලවේගයන්ගේ නව වෙනසක් ඇති වීම.
I - නිෂ්පාදනය මගින් ලාභ ලැබීම ප්‍රධාන අරමුණ වීම.

05. දේවවාදි අවධියේ දැකිය හැකි ලක්ෂණ ඇතුළත් පිළිතුර වන්නේ මින් කුමක් ද?

1. A, B, C 2. A, D, F 3. B, C, H 4. E, G, I

06. පාරභෞතික අවධියේ ලක්ෂණ ඇතුළත් පිළිතුර කුමක් ද?

1. A, B, C 2. A, G, I 3. B, C, H 4. B, G, I

07. යථානුභූත අවධියේ දී ඔබට දැකිය හැකි ලක්ෂණ ඇතුළත් පිළිතුර වන්නේ?

1. A, C, H 2. E, I,G 3. A,D,F 4. A, I,G

08. "සමාජයේ ශ්‍රම විභජනය" නැමැති කෘතිය රචනා කොට ඇති සමාජ විද්‍යාඥයා වන්නේ,

1. ඔගස්ට් කොම්ට් ය.
2. එමිල් ඩුර්කයිම් ය.
3. හර්බට් ස්පෙන්සර් ය.
4. මැක්ස් වෙබර් ය.

09. "පරිණාමය යනු ද්‍රව්‍යයන් එකට එක්වීම හා ඒ සමානම බලයක් ඇති කරමින් විසිරීමේ ස්වභාවය" ලෙස පරිණාමය පිළිබඳ අදහස් දැක් වූ සමාජ විද්‍යාඥයා වන්නේ,

1. එමිල් ඩුර්කයිම් ය.
2. ඔගස්ට් කොම්ට් ය.
3. හර්බට් ස්පෙන්සර් ය.
4. මැක්ස් වෙබර් ය.

10. "ප්‍රොතෙස්තන්ත්‍ර ආචාරධර්ම හා ධනවාදයේ සාරය" යන කෘතිය මගින් සමාජ නවීකරණය කෙරෙහි ආගමිඃ සාධක බලපාන බව පෙන්වා දෙනු ලැබුවේ,

1. මාටින් ලූතර් විසිනි.
2. විල්බට් මුවර් විසිනි.
3. ජෝන් කැල්වින් විසිනි.
4. මැක්ස් වෙබර් විසිනි.

11. ප්‍රාථමික කොමියුනිස්ට් අවධියේ සිට සුපිරි කොමියුනිස්ට් අවධිය දක්වා සමාජ පරිණාමය වන බව දැක් වූ සමාජ විද්‍යාඥයා කවුද?

1. කාල් මාක්ස්
2. හර්බට් ස්පෙන්සර්
3. මැක්ස් වෙබර්
4. ඔග්ස්ට් කොම්ට්

12. දිගු කාලීන ව සමාජය වෙනස්වීමට බල පාන සාධකය වන්නේ මින් කුමක් ද?

1. සංස්කෘතික සහයෝගිතා ව්‍යාපාරය
2. කාර්මීකරණය
3. දේශපාලන විරෝධතා ව්‍යාපාරය
4. මෝස්තර ව්‍යාපාර

13. සමාජය පැවැති තත්ත්වයට වඩා වෙනස් වූ තත්ත්වයකට හැඩගැස්වීම හඳුන්වන්නේ,

1. කාර්මීකරණය ලෙස ය.
2. නාගරීකරණය ලෙස ය.
3. බටහිරකරණය ලෙස ය.
4. නවීකරණය ලෙස ය.

- පහත සඳහන් ලක්ෂණ හොඳින් අධ්‍යයනය කරන්න

★ සුළු කර්මාන්ත වෙනුවට මහා පරිමාණ කර්මාන්ත ශාලා බිහි වීම.

★ යාන්ත්‍රීකරණයේ ප්‍රතිඵල නිසා ගොවි බිම් අහිමි වී යාම.

★ කර්මාන්ත ශාලාවල විශාල රැකියා ප්‍රමාණයක් බිහි වීම.

★ අපගාමී චර්යා පහළ වෙමින් සංකීර්ණ නාගරීකරණයක් සිදු වීම.

14. ඉහත සඳහන් ලක්ෂණ දැකිය හැකි සමාජය වෙනස් කරන බලවේගය කුමක් ද?

1. කාර්මීකරණය
2. නාගරීකරණය
3. බටහිරකරණය
4. නවීකරණය

15. සාධාරණ මාර්ගවලින් ධනය ඉපයීමත්, අවශ්‍යතා අනුව වැය කිරීමත්, ඉතිරිකිරීමත් පිළිබඳ ඉගැන්වීමක් සහිත ශ්‍රී ලාංකික සමාජයේ බලවත් වෙනසකට මග පාදන බෞද්ධ සූත්‍රය වන්නේ මින් කුමක් ද?

1. කූටදන්ත සූත්‍රය
2. සිඟාලෝවාද සූත්‍රය
3. මහා මංගල සූත්‍රය
4. චූල්ල හත්ථි පදෝපම සූත්‍රය

16. රාජ්‍ය පාලකයා ජනතාවගේ ආර්ථික සංවර්ධනය උදෙසා යථාර්ථවාදී ව ක්‍රියා කළ යුතු ආකාරය දක්වා ඇති බෞද්ධ සූත්‍රය මින් කුමක් ද?

1. සිඟාලෝවාද සූත්‍රය
2. මහා මංගල සූත්‍රය
3. කූටදන්ත සූත්‍රය
4. චූල්ලහත්ථි පදෝපම සූත්‍රය

17. සංස්කෘතික ගැටුම යනු,

1. ආගම් අතර ගැටුම යි.
2. පරම්පරා අතර ගැටුම යි.
3. රටවල් අතර ගැටුම යි.
4. ජාතීන් දෙකක් අතර ගැටුම යි.

18. "දෙන ලද ජීවන රටාවක් ඇතුළත පුද්ගලයන් සමූහයක් සංවිධානය වී ඇති ආකාරය සංස්කෘතිය යි." යෑ නිර්වචනය ඉදිරිපත් කර ඇති සමාජ විද්‍යාඥයා වන්නේ,

1. රේමන්ඩ් ෆර්ත් ය.
2. බී. මැලිනොව්ස්කි ය.
3. රැල්ෆ් ලින්ටන් ය.
4. ඊ. බී. ටයිලර් ය.

19. ඉස්ලාම් සංස්කෘතිය තුළ "පොහොසත් අය දුප්පත් අයට තමා සතු දෙයින් ප්‍රදානය කරන අනිවාර්ය දන් දී දක්වෙන අනිවාර්ය වගකීම වන්නේ,

1. කලීමාව යි.
2. සලාතය යි.
3. සකාතය යි.
4. උපවාසය යි.

- පහත දැක්වෙන කරුණු හොඳින් අධ්‍යයනය කරන්න.

A - වාරිකර්මාන්තය මත පදනම් වූ යහපත් කෘෂිකර්මික ආර්ථික රටාවක් පැවතීම

B - ආත්මාර්ථය මූලික කර ගත් පවුල් සංවිධාන රටාවක් පැවතීම

C - දළදා වහන්සේ රාජ්‍ය සංකේතය ලෙස පිළිගත් දේශපාලන ක්‍රමයක් පැවතීම

D - අටලෝ දහමින් අකම්පිත ජන විඥානයක් තිබීම

20. මේවා අතරින් බුදුදහමේ ආභාසය නිසා මෙරට ජන සමාජය තුළ ස්ථාපිත වූ කරුණු ඇතුළත් නිවැරදි වරණ කුමක් ද?

1. A, B හා C
2. A,C හා D
3. A, B හා D
4. B , C හා D

21. ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ උපරිමාධිකරණය ලෙස ක්‍රියා කරන ආයතනය වන්නේ,

1. මහාධිකරණය යි.
2. අභියාචනාධිකරණය යි.
3. පළාත්බද මහාධිකරණය යි.
4. ශ්‍රේෂ්ඨාධිකරණය යි.

22. දිසා අධිකරණයක දී විභාග නොවන නඩුවක් වන්නේ මින් කුමක් ද?

1. දික්කසාද නඩු
2. මැතිවරණ පෙත්සම්
3. මුදල් නඩු
4. බෙදුම් නඩු

23. පොලිසියට පැවරෙන බලතලවලට අයත් නොවන කරුණ ඇතුළත් වරණය තෝරන්න.

1. පෞද්ගලික ආරක්ෂාව පිළිබඳ බලතල
2. බලය පාලනය කිරීමේ බලතල
3. වරදකරුවන්ට දඬුවම් දීමේ බලතල
4. පරීක්ෂණ පැවැත්වීමේ බලතල

24. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලතල ඇති එකම අධිකරණ ආයතනය වන්නේ,

1. ශ්‍රේෂ්ඨාධිකරණය යි.
2. මහේස්ත්‍රාත් අධිකරණය යි.
3. අභියාචනාධිකරණය යි.
4. මහාධිකරණය යි.

25. "මේ දීපයෙහි යම් යහපත් ගමක් ඇතොත් එහි විහාරයක් හා දේවාලයක් ඇත." ශ්‍රී ලංකාවේ අතීත ගැමි සමාජය පිළිබඳ ඉහත ප්‍රකාශය ඇතුළත් ග්‍රන්ථය හා එහි රචකයා සඳහන් නිවැරදි පිළිතුර තෝරන්න.

1. අපේ සංස්කෘතිය . පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි
2. එදා හෙළදිව . රොබට් නොක්ස්
3. බෞද්ධ සමාජ පාලනය . ආචර්ය ප්‍රනීත් අබේසුන්දර
4. ලංකා ජනතාව . ආචාර්ය නන්දදේව විජේසේකර

26. පහත දැක්වෙන ප්‍රකාශවලින්, සමාජ පාලනය සඳහා කිතුනු දහම මගින් පෙන්වා දෙන දස පනතට අයත් ප්‍රකාශ ඇතුළත් වරණය කුමක් ද?

A තමාගේ මවු පියන්ට ගෞරව පූජා කරව
B ප්‍රාණඝාතය නොකරව
C - රූප වන්දනා කරව
D අදත්තාදානය නොකරව

1. A, B හා C ය.
2. A, B හා D ය.
3. A, C හා D ය.
4. B , C හා D ය.

27. යම් පුද්ගලයෙකුට අනුන්ගෙන් ලබන අධ්‍යාපනය තමාට තමාගෙන් ලැබෙන අධ්‍යාපනය යන ක්‍රම දෙකක් ඔස්සේ අධ්‍යාපනය ලබා ගත හැකි බවත්, මෙයින් වඩා වැදගත් වන්නේ තමාට තමාගෙන් ලැබෙන අධ්‍යාපනය බවත් ප්‍රකාශ කරන ලද්දේ,

1. අනගාරික ධර්මපාලතුමා විසිනි.
2. මහත්මා ගාන්ධි තුමා විසිනි.
3. එඩ්වඩ්. ගිබන් විසිනි.
4. ඇරිස්ටෝටල් පඬිවරයා විසිනි.

- පහත වගුවේ දැක්වෙන්නේ ශ්‍රී ලංකාවට පැමිණි විදේශීය ජාතිකයන් කිහිපයකි. "අ" තීරුවේ පැමිණි ප්‍රදේශ "ඇ" තීරුවේ ඔවුන්ගේ ආගම, "ආ" තීරුවේ ඔවුන්ගේ ආගමික ග්‍රන්ථ සඳහන් වේ. ඒ අනුසාරයෙන් 28, 29, 30 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| අ | ආ | ඇ |
|---|---|---|
| A - ඉන්දියාව | D - අල් කුරාණය | G - ක්‍රිස්තියානි |
| B - යුරෝපය | E - බයිබලය | H - හින්දු |
| C - අරාබිය | F - භගවත්ගීතාව | I - ඉස්ලාම් |

28. ඉංග්‍රීසින්ට පමණක් අදාළ කරුණු ඇතුළත් පිළිතුර තෝරන්න.

1. A, D, G
2. B, F, I
3. B, D, G
4. B, E, G

29. මුස්ලිම් ජාතිකයින්ට පමණක් අදාළ කරුණු ඇතුළත් පිළිතුර තෝරන්න.

1. A, D, H
2. B, E, I
3. C, D, I
4. C, D, H

30. ද්‍රවිඩ ජනතාවට පමණක් අදාළ කරුණු ඇතුළත් පිළිතුර කුමක් ද?

1. A, F, H  2. C, D, H  3. B, E, I  4. C, D, I

31. මිත්‍ර හා අමිත්‍ර සාමාජිකයන් කෙරෙහි ඇති වන ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය සහ පළිගැනීම යන චේතනාවලින් දුරස් වීම සඳහා සුදුසු භාවනා ක්‍රමය වන්නේ,

1. මෛත්තානුස්සති භාවනාව යි.
2. බුද්ධානුස්සති භාවනාව යි.
3. මරණානුස්සති භාවනාව යි.
4. අසුභානුස්සති භාවනවා යි.

32. පහත දැක්වෙන අර්බුදකාරී තත්ත්ව අතුරින් සමාජ ගැටලුවක් නොවන්නේ කුමක් ද?

1. සියදිවි නසා ගැනීම
2. පරම්පරා ගැටුම
3. මත් උවදුර
4. මානසික රෝග

33. පහත ප්‍රකාශ හොඳින් අධ්‍යයනය කරන්න.

A - සමාජයේ සැලකිය යුතු මිනිසුන් ගණනාවකට බලපෑම.

B - මිනිසුන්ගේ සාමාන්‍ය පැවැත්ම උදෙසා අහිතකර අප්‍රසන්න හානිකර තත්ත්වයක් පැවතීම.

C - මෙය සමාජයේ සාමාන්‍ය තත්ත්වයක් වීම.

D - සාමූහික සමාජ ක්‍රියාකාරිත්වය ඇසුරෙන් විසඳුම් සෙවීම.

මෙයින් සමාජ ගැටලුවකට අදාළ ප්‍රකාශ පමණක් ඇතුළත් වරණය කුමක් ද?

1. A, C හා D ය.
2. A, B හා C ය.
3. B, C හා D ය.
4. A , B හා D ය.

34. සියදිවි නසාගැනීම සඳහා බලපාන සාධකයක් නොවන්නේ මින් කුමක් ද?

1. විරැකියාව
2. දරා ගැනීමේ ශක්තිය නොමැති වීම.
3. අසීමිත ආශාවන් පාලනය කර ගත හැකි වීම.
4. දෙමාපියන්ගේ හා ගුරුවරුන්ගේ දැඩි පාලනය දරා ගැනීමට නොහැකි වීම.

35. සමාජ විද්‍යාවේ දී පර්යේෂණයක් ලෙස හඳුන්වනු ලබන්නේ,

1. විද්‍යාත්මක ක්‍රම අනුගමනය කරමින් නව ගැටලුවකට විසඳුම් සෙවීම යි.
2. කල්පිත ගොඩ නැගීම යි.
3. කල්පිත පරීක්ෂාව යි.
4. ප්‍රාථමික මූලාශ්‍රය පරීක්ෂාව යි.

- ප්‍රශ්න අංක 36 සිට 40 තෙක් ඇති ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ අතරින් වඩාත් ම නිවැරදි ප්‍රකාශය තෝරන්න.

36. 1. මිනිසාගේ ජීවිතයෙන් කොටසක් පමණක් සමාජ විද්‍යාවෙන් අධ්‍යයනය කරයි.
    2. සමාජ විද්‍යාඥයා සමාජය අධ්‍යයනය කිරීමේ දී ස්වාභාවික විද්‍යාවේ ඒ ආකාරයෙන් ම භාවිත කරයි.
    3. සමාජ විද්‍යාඥයා සමාජය අධ්‍යයනය කිරීමේ දී කිසිම අගතියකට පත් නොවී සමාජ යථාර්ථය පවතින ආකාරයෙන් අධ්‍යයනය කරයි.
    4. සමාජ විද්‍යාවේ දී සමාජය තුළ උද්ගත වී ඇති සමාජ ගැටලු පමණක් අධ්‍යයනය කරයි.

37. 1. යම් කෙනෙකු සමාජයේ සාමාජිකයෙකු වශයෙන් ලබාගන්නා දැනුම, විශ්වාසය, කලාව, සාරධර්ම, නීතිය, සිරිත් වෙනත් හැකියාවන් හා පුරුදු ආදියෙහි එකතුව සංස්කෘතිය යි.
    2. නාගරීකරනය යනු නගරවල කර්මාන්ත ඇතිවීම යි.
    3. නාගරීකරණය නිසා සමාජයේ ගැටලු ඇති නොවේ.
    4. මිනිසාගේ මනෝ කායික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති කරගත් දෙය සමාජය යි.

38. 1. සංස්කෘතික විසරණය යනු සංස්කෘතිය විනාශ වීම යි.
    2. මිනිසාට පමණක් නොව සතුන්ට ද සංස්කෘතියක් ඇත.
    3. ප්‍රාථමික සමාජයේ සංස්කෘතික විවිධත්වය බහුලය.
    4. භෞතික දියුණුවට සාපේක්ෂව සම්ප්‍රදායන් හා චාරිත්‍ර වරිත්‍ර වෙනස් නොවීම සංස්කෘතික ලැග්මයි.

39. 1. සමාජ පර්යේෂණයක ඇති වැදගත්කම ලෙස කල්පිත ගොඩ නැගීම පෙන්වා දිය හැක.
    2. ඓතිහාසික ගවේෂණය, විස්තරාත්මක ගවේෂණය, අත්හදා බැලීමේ ගවේෂණය ලෙස පර්යේෂණ ප්‍රධාන කොටස් තුනකට බෙදා දැක්විය හැකි ය.
    3. පර්යේෂණ සමාජයේ දියුණුවට හේතු නොවේ.
    4. ජනකථා, ලිඛිත මූලාශ්‍රයවලට උදාහරණයකි.

40. 1. නීතියෙන් තහනම් කළ හෝ නොකළ යුතු යමක් සිදු කිරීම අපරාධයක් ලෙස සලකන්නේ නැත.
    2. අපරාධ සඳහා කායික, පාරිසරික හා මනෝ විද්‍යාත්මක හේතු බලපානු ලබයි.
    3. යම් සමාජයක අපේක්ෂිත හැසිරීමේ නිරත වන පිරිස අපරාධ කරුවන් ලෙස සලකනු ලැබේ.
    4. ජනවාර්ගික අර්බුද සමාජ ප්‍රශ්නයක් නොවේ.

| | |
|---|---|
| | මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2020 |
| | **Primary Piriven Year End Test - 2020** |
| | **05 ශ්‍රේණිය/Grade 05** |
| සියලු ම හිමිකම් ඇවිරිණි<br>All Rights Reserved | සමාජ විද්‍යාව I, II<br>sociology Science I, II |

සමාජ විද්‍යාව II

සැලකිය යුතු යි :

i. පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් තෝරා ගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

01.
(i) "සමාජ සම්බන්ධතා පිළිබඳ විද්‍යාව" සමාජ විද්‍යාව ලෙස නිර්වචනය කළ සමාජ විද්‍යාඥයා කවුද?

(ii) "යථානුභූත දර්ශනය" නැමති ග්‍රන්ථය රචනා කළ දාර්ශනිකයා කවුද?

(iii) සමාජ අනෝමිය තත්ත්වය යනු කුමක් ද?

(iv) බුදු දහමේ සමාජ විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ අදහස් දැක් වූ ශ්‍රී ලාංකික සමාජ විද්‍යාඥයින් දෙදෙනෙකුගේ නම් ලියන්න.

(v) සදිසා සංකල්පය ඇසුරින් පුද්ගලයා සමාජය සමඟ පවත්වාගත යුතු සම්බන්ධතාව පැහැදිලි කරන බෞද්ධ සූත්‍රය කුමක් ද?

(vi) නාගරීකරණයේ යහපත් ලක්ෂණ දෙකක් දක්වන්න.

(vii) සංස්කෘතියේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

(viii) ශ්‍රී ලංකාවේ පැවති රාජකාරි ක්‍රමය අහෝසි කොට නිදහස් ශ්‍රම වෙළෙඳපොළක් ඇති කිරීමට කටයුතු කළ බටහිර ජාතිකයින් කවුද?

(ix) අපරාධවල ස්වභාවය අනුව වර්ගීකරණය කර ඇති අපරාධ වර්ග දෙකක් දක්වන්න.

(x) පර්යේෂණයන්හි දී තොරතුරු රැස් කිරීම සඳහා භාවිත කරන මූලාශ්‍රයන් දෙකක් සඳහන් කරන්න.

(ලකුණු $2 \times 10 = 20$)

## II කොටස

02

(i) සමාජ විද්‍යාව හැඳින්වීමට නිර්වචනයක් දක්වන්න.

(ii) සමාජ විද්‍යා විෂය ක්ෂෙත්‍රයේ සංවර්ධනය කෙරෙහි පුරෝගාමී වූ සමාජ විද්‍යාඥයන් තිදෙනෙකු නම් කරන්න.

(iii) බුදු දහමේ සමාජ විද්‍යාත්මක ලක්ෂණ උදාහරණ දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3+ 5 = 10)

03

(i) සමාජ වෙනස්වීම පිළිබඳ ව බුදු දහමේ දක්වෙන සංකල්ප දෙකක් සඳහන් කරන්න.

(ii) ඔගස්ට් කොම්ට් විසින් පෙන්වා දුන් සමාජ ප්‍රගතියේ අවධි තුන නම් කරන්න.

(iii) පහත සඳහන් මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න.

1. ශ්‍රම විභජනය
2. යාන්ත්‍රික ඒකාබද්ධතාවය
3. සමාජවාදී සමාජය
4. වැඩවසම් සමාජය

(ලකුණු 2 + 3+ 5 = 10)

04

(i) සංස්කෘතිය පිළිබඳ නිර්වචනයක් ලියන්න.

(ii) අභෞතික සංස්කෘතියට අයත් සංකල්ප තුනක් දක්වන්න.

(iii) ගෝලීය ප්‍රවණතා හමුවේ ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතියට සිදු වන බලපෑම කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

05

(i) හර්බට ස්පෙන්සර් පෙන්වා දුන් සමජ පරිණාමයේ අදියර දෙක දක්වන්න.

(ii) කාර්මීකරණයේ ප්‍රතිඵල ලෙස ඇති වී තිබෙන අයහපත් ප්‍රතිවිපාක තුනක් ලියන්න..

(iii) යහපත් සමාජ වෙනසක් උදෙසා බුදු දහම උපයෝගී කර ගත හැකි ආකාරය නිදසුන් දෙකක් ඇසුරින් පහදන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

06

(i) සමාජ පාලනය යනු කුමක් ද?

(ii) පන්සිල් ආරක්ෂා කිරීමේ දී අත්වන සමාජමය ප්‍රතිවිපාක තුනක් ලියන්න.

(iii) රටක ජාතික සංහිඳියාව ඇති කර ගැනීමට බුදු සමයෙන් ගත හැකි ප්‍රයෝජන නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

07

(i) සමාජ ගැටලු හඳුනා ගැනීමේ මූලික ලක්ෂණ දෙකක් ලියන්න.

(ii) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන සමාජ ගැටලු තුනක් ඉදිරිපත් කරන්න.

(iii) බුදුන් වහන්සේගේ දේශනාවට අනුව සමාජ ගැටලු නිවාරණය කර ගත හැකි ආකාරය නිදසුන් දෙකක් ඇසුරින් පහදන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

08

(i) සමාජ පර්යේෂණයක ප්‍රධාන අරමුණු දෙක නම් කරන්න.

(ii) පර්යේෂණ දත්ත රැස්කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් ලියන්න.

(iii) සමාජ විද්‍යාත්මක පර්යේෂණයක දී අනුගමනය කළ යුතු පියවර අතුරින් දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - பிரிவேனா கல்விக் கிளை
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**
Year End Term Test – 2021 (2022)

පැය තුනයි

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.**

**සමාජ විද්‍යාව - I, II** **5 ශ්‍රේණිය**

## සමාජ විද්‍යාව - I

**සැ.යු.**

- ❖ **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.**
- ❖ **අංක 01 - 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් වඩාත් නිවැරැදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**
- ❖ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
- ❖ **එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.**

(1) ''සමාජය පිළිබඳ ව ප්‍රධාන විද්‍යාව සමාජ විද්‍යාවයි'' යන නිර්වචනය ඉදිරිපත් කළේ කවුද?
(1) එමිල් ඩුර්ක්හයිම් (2) එච්. පී. ෆෙයාචයිල්ඩ් (3) කිංස්ලි ඩේවිස් (4) ඊ. බී. ටයිලර්

(2) සමාජ විද්‍යාවට අධ්‍යයන ක්‍රමවේදයක් හඳුන්වා දුන් මුල්ම සමාජ විද්‍යාඥයා කවුද?
(1) එමිල් ඩුර්ක්හයිම් (2) කාල් මාක්ස් (3) ඔගස්ට් කොම්ට් (4) සෙන්ට් සිමෝන්

(3) සමාජ විද්‍යාවේ අරමුණ ''සමාජ ක්‍රියාව'' අධ්‍යයනය කිරීම බව පෙන්වා දුන්නේ,
(1) ඔගස්ට් කොම්ට් ය. (2) මැක්ස් වෙබර් ය.
(3) එලිසබත් ජේ. විල්කින්ස් ය. (4) මාර්ටින් ලූතර් ය.

(4) ''බෞද්ධ දර්ශනය හා චරණ'' කෘතිය මගින් බුදුදහම සමාජ විද්‍යාත්මක පදනමක් ඔස්සේ ගොඩනැගී ඇති බව ප්‍රකාශ කළේ කවුද?
(1) නන්දසේන රත්නපාල (2) ප්‍රණීත් අභයසුන්දර
(3) දයා අමරසේකර (4) ඩබ්. එස්. කරුණාරත්න

(5) සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවය තර්කානුකූලව විවරණය කරන බෞද්ධ සූත්‍ර දේශනාව කුමක්ද?
(1) අග්ගඤ්ඤ සූත්‍රය (2) චක්කවත්තිසීහනාද සූත්‍රය
(3) ව්‍යග්ගපජ්ජ සූත්‍රය (4) සාමඤ්ඤඵල සූත්‍රය

(6) සමාජ ගැටළු සඳහා බලපා ඇති සාධක අධ්‍යයනය සඳහා උපයෝගී කරගත හැකි වඩාත්ම සුදුසු බුදුදහමේ කේන්ද්‍රීය සංකල්පය දැක්වෙන වරණය තෝරන්න.
(1) ත්‍රිලක්ෂණය (2) පුනර්භවය (3) කර්මය (4) හේතුඵල වාදය

(7) සමාජ වෙනස්වීම පිළිබඳ වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.
(1) ක්ෂණිකව සිදුවන ක්‍රියාවකි.
(2) දිගු කාලයක් තුළ අඛණ්ඩව සිදුවන වෙනස්වීම් සමුදායකි.
(3) විප්ලවයක් මගින් සිදුවන ක්‍රියාවලියකි.
(4) විවිධ අවස්ථාවන්වල දී පමණක් සිදුවන ක්‍රියාදාමයකි.

- ප්‍රශ්න අංක 08 - 10 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දක්වා ඇති සමාජ වර්ගීකරණයන් භාවිතයට ගන්න.

A - සාම්ප්‍රදායික ආධිපත්‍යය　　B - නීතිමය අධිපත්‍යය
C - වහල් අවධිය　　D - සමාජවාදී අවධිය
E - අනුභාසාත්මක ආධිපත්‍යය　　F - ප්‍රාථමික කොමියුනිස්ට් අවධිය

(8) මැක්ස් වෙබර් සමාජ විද්‍යාඥයාගේ ඉගැන්වීම් අන්තර්ගත නිවැරදි වර්ණය තෝරන්න.
(1) A , B හා C ය.　(2) A , B හා E ය.　(3) A , B හා F ය.　(4) B , C හා D ය.

(9) පන්ති විරහිත සමාජයක් දක්නට ලැබෙන නිවැරදි වර්ණය කුමක්ද?
(1) A හා B　(2) C හා D　(3) D හා F　(4) E හා F

(10) ඉහත "C" "D" "F" යන අවධි නිවැරදි අනුපිළිවෙළින් සකස් කළ පසු නිවැරදි ව දැක්වෙන වරණය වන්නේ,
(1) C , D හා F ය.　(2) C , F හා D ය.　(3) F , C හා D ය.　(4) F , D හා C ය.

(11) ප්‍රොතෙස්තන්ත්‍ර ආගමික ව්‍යාපාරය ඉදිරියට ගෙන යනු ලැබුවේ,
(1) මාටින් ලූතර් ය.　(2) ජෝන් කැල්වින් ය.
(3) සෙන්ට් සිමෝන් ය.　(4) ජෝන් ස්ටුවට් මිල් ය.

(12) පාලකයා රටේ අපරාධ අවම කර ගැනීමට ජනතාවගේ ආර්ථික සංවර්ධනය උදෙසා ක්‍රියා කළ යුතු බව පැවසෙන ප්‍රධාන බෞද්ධ සූත්‍රය මින් කුමක්ද?
(1) ව්‍යග්ගපජ්ජ සූත්‍රය　(2) කූටදන්ත සූත්‍රය　(3) සිඟාලෝවාද සූත්‍රය　(4) කසීභාරද්වාජ සූත්‍රය

(13) සංස්කෘතිය සමාජ ජීවිතයේ යථාර්ථය ස්පර්ශ කරන්නක් ලෙස සංස්කෘතිය පිළිබඳ අර්ථ දැක්වූයේ කවුද?
(1) රැඩ්ක්ලිෆ් බ්‍රවුන්　(2) රේමන්ඩ් පර්ත්　(3) බී. මැලිනොවුස්කි　(4) ඊ. බී. ටයිලර්

(14) විවාහ මංගල උත්සවයක සමාජ විද්‍යාත්මක වැදගත්කම වඩාත් හොඳින් නිරූපිත වරණය තෝරන්න.
(1) සිරිත් විරිත් නිරූපණය　(2) දුක හා සතුට නිරූපණය
(3) ආර්ථික ශක්තිය නිරූපණය　(4) සමාජ අන්තර් සබඳතා නිරූපණය

(15) ඉස්ලාම් සංස්කෘතිය තුළ දක්නට ලැබෙන ආගමික චාරිත්‍රය අන්තර්ගත පිළිතුර කුමක්ද?
(1) මක්කම හජ්ජි වන්දනාව　(2) නත්තල් දින දේව වන්දනාව
(3) ස්කන්ධ කුමාර වන්දනාව　(4) සබරි දේව වන්දනාව

(16) සත්තිගුම්බ ජාතක කතාව තුළින් පිළිබිඹු කෙරෙන සමාජ විද්‍යාත්මක සාධකය වන්නේ,
(1) තිරිසන් සතුන්ට ද ජීවත්වීමේ අයිතිය ඇති බව යි.
(2) මිතුරන් ඇසුරු කිරීම ඉතා වැදගත් බව යි.
(3) යහපත් හැසිරීම සමාජයක පැවැත්මට බලපාන බව යි.
(4) සමාජානුයෝජනය කෙරෙහි බාහිර පරිසරය තීරණාත්මක සාධකයක් බව යි.

(17) සමාජ සංස්ථා පිළිබඳ **සාවද්‍ය** පිළිතුර ඇතුළත් වර්ණය තෝරන්න.
(1) අධ්‍යාපන　(2) සමවයස් කණ්ඩායම　(3) දේශපාලන　(4) පවුල

(18) පෞරුෂත්වය, උපත හා සංවර්ධන මනෝ විශ්ලේෂණවාදය යන සංකල්පය වඩාත් ගැඹුරින් අධ්‍යයනය කළේ,
(1) සිග්මන් ෆ්‍රොයිඩ් ය.　(2) ෆර්ඩිනන්ඩ් ටෝනිස් ය.　(3) ඊ. බී. ටයිලර් ය.　(4) ෆ්‍රාන්ස් බෝආස් ය.

(19) ගීතිකා හා කැරොල් වැනි සංස්කෘතිකාංග ශ්‍රී ලාංකේය සමාජයට හුරු පුරුදු වූයේ,
(1) ජෛන ආගම මගිනි.　(2) ඉස්ලාම් ආගම මගිනි.
(3) බ්‍රාහ්මණ ආගම මගිනි.　(4) කිතුනු ආගම මගිනි.

(20) බ්‍රාහ්මණ ඉගැන්වීම්වලට අනුව මානව සමාජය තුළ කිසිදු අයිතිවාසිකමක් නොලැබූ වර්ණය නම්,
(1) බ්‍රාහ්මණ වර්ණය යි.　(2) ක්ෂත්‍රිය වර්ණය යි.
(3) වෛශ්‍ය වර්ණය යි.　(4) ශුද්‍ර වර්ණය යි.

(21) මානව සමාජය අධ්‍යයනය කිරීමේ දී අපට හමුවන කුඩාම සමාජ ඒකකය නම්,
(1) පුද්ගලයා යි. (2) මානව පවුල යි. (3) පෙර පාසල යි. (4) පන්සල යි.

(22) සමාජ පරිණාමයේ ප්‍රතිඵලයක් වශයෙන් නූතන සමාජවල බහුලව දක්නට ලැබෙන පවුල් ඒකකය වන්නේ,
(1) මාතෘවාසික පවුල් ඒකකය යි. (2) පීතෘවාසික පවුල් ඒකකය යි.
(3) න්‍යෂ්ටික පවුල් ඒකකය යි. (4) බිඳුණු පවුල් ඒකකය යි.

(23) බුද්ධ කාලයේ සමාජ පාලනය සඳහා සමූහාණ්ඩු පාලන ක්‍රමයක් පවත්වාගෙන ගිය රාජ්‍යය කුමක්ද?
(1) අංග රාජ්‍යය (2) මගධ රාජ්‍යය (3) කෝසල රාජ්‍යය (4) මල්ල රාජ්‍යය

(24) කිසියම් පනතක් නීතියක් බවට පත්වීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධකය වනුයේ,
(1) පාර්ලිමේන්තුව තුළ දී පළමු වර කියවා සම්මත වීමෙනි.
(2) ජනාධිපතිවරයා පනතට අත්සන් තැබීමෙනි.
(3) කැබිනට් මණ්ඩලය මගින් සම්මත වීමෙනි.
(4) කතානායකවරයා පනතට අත්සන් තැබීමෙනි.

(25) පොලීසිය විසින් ඉටු කළ යුතු ප්‍රමුඛ කාර්යභාරය වන්නේ,
(1) සමාජ විසංවිධානය වළක්වා ගැනීම යි. (2) නීති කඩ කරන්නන්ට දඬුවම් පැමිණවීම යි.
(3) නීතිය පිළිබඳ ප්‍රජා අවබෝධය පුළුල් කිරීම යි. (4) නීතිය හා සාමය ආරක්ෂා කිරීම යි.

(26) අම්පාර, වල්ලන්සේන හා බදුල්ල තල්දෙන යන ස්ථානවල පිහිටා ඇති විශෝධන මධ්‍යස්ථානවල රඳවා සිටින වරදකරුවන් වනුයේ,
(1) බාලවයස්කාර දරුවන් ය. (2) තරුණ වරදකරුවන් ය.
(3) මරණීය දණ්ඩනය නියම වූ වරදකරුවන් ය. (4) මත්ද්‍රව්‍ය ආශ්‍රිත වරදකරුවන් ය.

(27) සමාජ පාලනයේ දී ප්‍රධාන වශයෙන් ආගමික නීතිය යොදා ගනිමින් පාලනය ගෙනයනු ලබන රටවල් වන්නේ,
(1) සෞදි අරාබිය හා ඉන්දියාව යි. (2) ඉරානය හා ඉන්දුනීසියාව යි.
(3) ඉරානය හා පාකිස්ථානය යි. (4) ඉන්දුනීසියාව හා මැලේසියාව යි.

(28) සමාජ ගැටලුවක් නොවන්නේ මින් කුමක්ද?
(1) ජනවාර්ගික අර්බුදය යි. (2) ළමා අපයෝජනය යි.
(3) රැකියා වියුක්තිය යි. (4) ස්වභාවිකව මරණයට පත්වීම යි.

(29) අපරාධකරුවෙකුට දඬුවම් කළ යුතු වන්නේ එය පුද්ගලයකුට දෙන දඬුවමක් වශයෙන් නොව එමගින් සමාජ විස්ඥාණය වඩවාලීමට හැකියාවක් පවතින නිසා යැයි ප්‍රකාශ කරනු ලැබූයේ,
(1) බී. මැලිනොව්ස්කි ය. (2) එමිල් ඩුර්ක්හයිම් ය.
(3) ගරා පෝල් ය. (4) ක්ලක් හෝන් ය.

(30) සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර වර්තමානය වන විට අපරාධ ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වන ආකාරයක් දක්නට ලැබේ. ඒ සඳහා බලපෑම් කරන ප්‍රධාන සාධකය වන්නේ,
(1) ආර්ථික දරිද්‍රතාව යි. (2) විද්‍යාවේ දියුණුව යි.
(3) දේශපාලන හා යුධමය ත්‍රස්තවාදය යි. (4) ගෝලීයකරණය යි.

(31) වර්තමාන සමාජය තුළ අපරාධ විවිධ ස්වරූපයක් ගන්නා අතර එම අපරාධ සමූහය අතරට එක් වී ඇති නවමු අපරාධය වන්නේ කුමක්ද?
(1) ව්‍යාජ ලියකියවිලි මුද්‍රණය (2) අන්තර්ජාලය ආශ්‍රිත අපරාධ
(3) ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණය කිරීම (4) අසභ්‍ය ඡායාරූප නිෂ්පාදනය කිරීම

(32) දුස්සමායෝජන නම් සංකල්පය තුළින් නිරූපිත අර්ථ ගැන්වීම නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
(1) සමාජය සමග සහකම්පනයෙන් ක්‍රියා කිරීමට ඇති නොහැකියාව යි.
(2) සමාජය සමඟ අනුගත වීමේ හැකියාව යි.
(3) අධමයින් සමාජයෙන් නෙරපා හැරීමට ඇති හැකියාව යි.
(4) සමාජ අපගමන චර්යාව වර්ධනය කිරීමේ හැකියාව යි.

(33) ආරෝපිත තත්ත්වයකට නිදසුනක් නොවන වර්ණය තෝරන්න.

(1) කුලය (2) ස්ත්‍රී බව (3) පුරුෂ බව (4) පැවිදි බව

(34) සමාජ විද්‍යා පර්යේෂණ සම්බන්ධයෙන් දක්වා ඇති වඩාත් සුදුසු වර්ණය කුමක් දැයි තෝරන්න.

(1) සමාජය තුළ පවතින ගැටලුවලට විසඳුම් සෙවීම යි.

(2) විද්‍යාත්මක මූලධර්ම තුළින් සමාජ ප්‍රශ්නවලට විසඳුම් සෙවීම හා නව දැනුමක් සෙවීම යි.

(3) පුද්ගලයා කෙරෙහි සමාජ ප්‍රශ්න බලපාන අයුරු සෙවීම යි.

(4) සමාජ ප්‍රශ්න ඇතිවීම කෙරෙහි බලපාන සාධක සෙවීම යි.

(35) ශ්‍රී ලංකාවේ යාචකයින් සම්බන්ධ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් සිදුකර "ශ්‍රී ලංකාවේ යාචකයා" නම් කෘතිය සම්පාදනය කළේ,

(1) ආචාර්ය ප්‍රණීත් අභයසුන්දර ය. (2) මහාචාර්ය නන්දසේන රත්නපාල ය.

(3) ආචාර්ය දයා අමරසේකර ය. (4) ආචාර්ය ටෙරන්ස් පුරසිංහ ය.

(36) සමාජීය විද්‍යා පර්යේෂණයක් සිදු කිරීමේ දී පර්යේෂකයා විසින්,

(1) දත්ත රැස්කළ යුතුය.

(2) පුරාවිද්‍යාත්මක දත්ත පමණක් රැස්කළ යුතුය.

(3) ඓතිහාසික දත්ත පමණක් රැස්කළ යුතුය.

(4) ගැටළුවේ ස්වභාවය හා අරමුණුවලට අදාළ දත්ත රැස් කළ යුතුය.

(37) සමාජීය විද්‍යා පර්යේෂණයක් තුළින් ලබාගන්නා ප්‍රතිඵල ප්‍රයෝජනයට ගත හැකි ප්‍රධාන ආකාරයන් ගණන,

(1) දෙක කි. (2) තුන කි. (3) හතර කි. (4) පහ කි.

- **පහත දැක්වෙන කරුණු හොඳින් අධ්‍යයනය කරන්න.**

A. පර්යේෂණයට අදාළ විෂය පිළිබඳ පුළුල් දැනුමක් ලබාගත හැකිවීම.

B. අධ්‍යයනය කළ යුතු දිශානතිය පිළිබඳ අවබෝධයක් ලබාගත හැකිවීම.

C. පර්යේෂණයට ලක් නොවූ හිඩැස් හඳුනාගත හැකි වීම.

D. මූලාශ්‍රවල දැක්වෙන තොරතුරු එලෙසම තම පර්යේෂණයට යොදා ගැනීමට හැකි වීම.

(38) ඉහත කරුණු අතුරින් පර්යේෂණයක් සිදු කිරීමේ දී මූලාශ්‍ර භාවිතයෙන් ලැබිය හැකි ප්‍රයෝජන පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.

(1) A , B හා C (2) A , B හා D (3) A , C සහ D (4) B , C හා D

(39) සමාජ විද්‍යාත්මක පර්යේෂණයක ආරම්භක පියවර වන්නේ මින් කුමක්ද?

(1) උපන්‍යාස ගොඩනැගීම. (2) ගැටලුව හඳුනාගැනීම.

(3) නියැදිය තෝරා ගැනීම. (4) ක්‍රමවේදය තෝරා ගැනීම.

- **පහත සඳහන් කරුණු හොඳින් අධ්‍යයනය කරන්න.**

A. එය කුසලයක් දැයි විමසා බැලිය යුතුය.

B. එය වරදක් දැයි විමසා බැලිය යුතුය.

C. එය බුද්ධිමතුන්ගේ ගැරහීමට ලක්වන කරුණක් දැයි විමසා බැලිය යුතුය.

D. එය සිදු කිරීමෙන් හෝ පිළිගැනීමෙන් ලැබෙන ප්‍රතිඵලය දුක් සහගත දැයි විමසා බැලිය යුතුය.

E. එය තම පරම්පරාවේ පිළිගැනීමට ලක් වූ දෙයක් දැයි විමසා බැලිය යුතුය.

(40) ඉහත කරුණු අතුරෙන් කාලාම සූත්‍රයට අනුව යමක් පිළිබඳ තීරණයක් ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු අන්තර්ගත පිළිතුර තෝරන්න.

(1) A , B , C හා D (2) A , B , D හා E (3) A , C , D හා E (4) B , C , D හා E

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புஜரிமையுஜடையது]
All rights reserved]

දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - பிரிவேனா கல்விக் கிளை
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**
Year End Term Test – 2021 (2022)

**සමාජ විද්‍යාව - I, II** **5 ශ්‍රේණිය**

## සමාජ විද්‍යාව - II

**සැලකිය යුතුයි.**

- **පළමුවන** ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **හතරක්** ද තෝරාගෙන, **ප්‍රශ්න පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. (i) සමාජ විද්‍යාව විද්‍යාත්මක විෂයයක් ලෙස ගොඩ නැගීමට ක්‍රියා කළ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් **දෙදෙනෙකුගේ** නම් ලියන්න.
(ii) සමාජ ලෝකය පිළිබඳව අධ්‍යයනය කරන විෂයයන් **දෙකක්** නම් කරන්න.
(iii) එමිල් ඩුර්ක්හයිම් විසින් සමාජ විද්‍යාත්මක විග්‍රහයන් ඉදිරිපත් කළ ක්ෂේත්‍ර **දෙකක්** නම් කරන්න.
(iv) කාර්මීකරණයේ ප්‍රතිඵල **දෙකක්** ලියන්න.
(v) සංස්කෘතිය මගින් සිදු වන කාර්යයන් **දෙකක්** පෙන්වා දෙන්න.
(vi) රාජ්‍ය පාලනය සම්බන්ධ උපදේශයන් ඇතුළත් බෞද්ධ සූත්‍ර **දෙකක්** නම් කරන්න.
(vii) වරදකරුවන් බන්ධනාගාර ගත කිරීමෙන් අපේක්ෂිත ප්‍රධාන අරමුණු **දෙක** මොනවා ද?
(viii) ජනවාර්ගික ගැටුම් ඇතිවීමට බලපාන සාධක **දෙකක්** සඳහන් කරන්න.
(ix) මූලාශ්‍ර වර්ග කළ හැකි ප්‍රධාන කාණ්ඩ **දෙක** මොනවා ද?
(x) බෞද්ධ සමාජ ව්‍යුහයට අයත් ප්‍රධාන කාණ්ඩ **දෙක** නම් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

02. (i) සමාජ විද්‍යාවේ ප්‍රයෝජන **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)
(ii) සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රයේ සංවර්ධනයට මැක්ස් වේබර්ගෙන් සිදු වූ සේවාවන් **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)
(iii) සමාජ අන්තර් සම්බන්ධතා ඵලදායීව සිදු කිරීමට මග පෙන්වන බුදු දහමේ ඉගැන්වීම් **දෙකක්** අගය කරන්න. (ලකුණු 05 යි)

03. (i) කෙටි කාලීන ව සමාජ වෙනස්වීම කෙරෙහි බලපාන සාධක **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)
(ii) දිගු කාලීන ව සමාජ වෙනස් කරන බලවේග **තුනක්** පෙන්වා දෙන්න. (ලකුණු 03 යි)
(iii) ශ්‍රී ලාංකේය සමාජය වෙනස්වීමට මහින්දාගමනය බලපෑ ආකාරය ක්ෂේත්‍ර **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

04. (i) සංස්කෘතිය පිළිබඳ අර්ථකථනයක් සපයන්න. (ලකුණු 02 යි)

(ii) සංස්කෘතික විසරණය සඳහා බලපාන සාධක **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) පුද්ගල පෞරුෂ වර්ධනයට සංස්කෘතිය බලපාන ආකාරය නිදසුන් **දෙකක්** ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි)

05. (i) ශ්‍රී ලාංකේය සමාජයේ ඓතිහාසික විකාශනය පිළිබඳ තොරතුරු ගවේෂණය කළ හැකි දේශීය මූලාශ්‍ර **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාව යුරෝපා ජාතීන්ගේ ආධිපත්‍යයට ගොදුරුවීම නිසා ලාංකික සමාජය තුළ ඇති වූ වෙනස්කම් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) සමාජ සාධාරණත්වය හා යුක්තිය රජයන සමාජයක් ගොඩනගා ගැනීමට හේතු වන බෞද්ධ ඉගැන්වීම් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

06. (i) සමාජ පාලනය අවශ්‍ය වීමට බලපාන හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ ක්‍රියාත්මක උසාවි වර්ග **තුනක** නම් ලියන්න. (ලකුණු 03 යි)

(iii) පුද්ගලයා තුළ ස්වයං පාලනයක් ඇතිකර ගැනීමට මග පෙන්වන බෞද්ධ ඉගැන්වීම් **දෙකක්** අගය කරන්න. (ලකුණු 05 යි)

07. (i) සමාජයේ පවතින අර්බුදකාරී තත්ත්වයක් සමාජ ගැටලුවක් දක්වා වර්ධනය වීමට බලපාන හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) අපරාධ වැළැක්වීමට ගතහැකි ක්‍රියාමාර්ග **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) ජනවාර්ගික අර්බුද නිවාරණයට උපයෝගී කර ගත හැකි බෞද්ධ ඉගැන්වීම් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

08. (i) පර්යේෂණයක් සඳහා උපයෝගී කරගත හැකි මාතෘකා **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පර්යේෂණ වාර්තාවක් අධ්‍යයනයෙන් ලබාගත හැකි ප්‍රයෝජන **තුනක්** සඳහන් කරන්න.

(ලකුණු 03 යි)

(iii) දත්ත රැස් කිරීමේ උපකරණවල තිබිය යුතු ගුණාංග **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**
கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விக் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)**
Year End Term Test – 2022 (2023)

**පැය තුනයි**

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.**

**සමාජ විද්‍යාව - I, II** **5 ශ්‍රේණිය**

## සමාජ විද්‍යාව - I

**සැ.යු.**

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.**
- **අංක 01 - 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් වඩාත් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
- **එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.**

01. සමාජ විද්‍යාව විෂය අධ්‍යයනය කිරීමෙන් ප්‍රධාන වශයෙන් අපේක්ෂා කරනු ලබන්නේ මින් කුමක් ද?
    (1) සමාජය පිළිබඳ ව පුළුල් අවබෝධයක් ලබා ගැනීම
    (2) සමාජ ප්‍රශ්න පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීම
    (3) සංස්කෘතිය පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීම
    (4) සමාජ පරිණාමීය අවධි පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීම

02. මානව චර්යාවන් පිළිබඳ ව අධ්‍යයනය කරන චර්යාමය විද්‍යා විෂයන් පමණක් ඇතුළත් වරණය කුමක් ද?
    (1) ජීව විද්‍යාව හා ඉතිහාසය (2) සමාජ විද්‍යාව හා මනෝවිද්‍යාව
    (3) මනෝවිද්‍යාව හා භූගෝල විද්‍යාව (4) මානව විද්‍යාව හා ජීව විද්‍යාව

03. මිනිසුන්ගේ චර්යාත්මක හර පද්ධතියේ ඇති වන වෙනස් වීම අනාගත සමාජ වෙනස් වීම කෙරෙහි බලපාන ආකාරය ප්‍රකාශිත බෞද්ධ ජාතක කතාව නම්,
    (1) මහා සුපින ජාතකය යි. (2) කලන්දක ජාතකයයි.
    (3) සම්මෝදමාන ජාතකය යි. (4) ඉල්ලීස ජාතකය යි.

04. සමාජ විද්‍යාවේ දී අධ්‍යනය කරන "තත්ත්වය හා කාර්යභාර්ය" සංකල්පය මැනවින් විග්‍රහ කෙරෙන බෞද්ධ සූත්‍ර දේශනාව මින් කුමක් ද?
    (1) ඉන්දක සූත්‍රය (2) පරාභව සූත්‍රය (3) අග්ගඤ්ඤ සූත්‍රය (4) සිඟාලෝවාද සූත්‍රය

05. සමාජ සමූහවලට ආවේණික ලක්ෂණයක් **නො වන්නේ** මින් කුමක් ද?
    (1) නිරන්තර අන්තර් ක්‍රියා පැවැත්වීම (2) ක්‍රියා හා ප්‍රතික්‍රියා පැවතීම
    (3) සාමූහික හැඟීමක් පැවතීම (4) පෞද්ගලික අරමුණු මත ම ක්‍රියා කිරීම

06. කාල් මාක්ස් දැක්වූ සමාජ පරිණාම විග්‍රහට අනුව පන්ති විරහිත සමාජ පමණක් නිරූපිත වරණය තෝරන්න.

(1) සමාජවාදී අවධිය, ධනවාදී අවධිය හා වැඩවසම් අවධිය.

(2) ප්‍රාග් කොමියුනිස්ට් අවධිය, වැඩවසම් අවධිය හා සමාජවාදී අවධිය.

(3) පූර්ව කොමියුනිස්ට් අවධිය, සමාජවාදී අවධිය හා සුපිරි කොමියුනිස්ට් අවධිය.

(4) වැඩවසම් අවධිය, ධනවාදී අවධිය හා ප්‍රාග් කොමියුනිස්ට් අවධිය.

07. සමාජීය විද්‍යා විෂයන් කිහිපයක් "අ"තීරුවේ ද ඒවායින් අධ්‍යයනය කරනු ලබන කරුණු "ආ"තීරුවේ ද දැක්වේ.

| "අ" | "ආ" |
|---|---|
| (1) ඉතිහාසය | A - පුද්ගලයින්ගේ සමාජ චර්යාවන් |
| (2) දේශපාලන විද්‍යාව | B - ප්‍රාථමික සමාජයේ මානව සමාජ සබඳතා |
| (3) මානව විද්‍යාව | C - සාමාජිකයින්ගේ රජ්‍ය පාලන චර්යාවන් |
| (4) සමාජ විද්‍යාව | D - මානවයාගේ ඓතිහාසික සමාජ පසුබිම |

ඉහත "අ" තීරුවේ දැක්වෙන සමාජීය විද්‍යා විෂයන් "ආ" තීරුවේ කරුණු සමග ගැළපූ විට ලැබෙන වඩාත් ම නිවැරදි වරණය තෝරන්න.

(1) A , B , C හා D (2) B , C , D හා A (3) C , D , A හා B (4) D , C , B හා A

08. සංවර්ධිත රටවල භාවිත වන දියුණු තාක්ෂණය හා සම්පත් ඌන සංවර්ධිත සමාජවලට යොමු කිරීමෙන් එම සමාජ දියුණු කිරීමට අදාළ සමාජ වෙනස් කරන බලවේගය වන්නේ,

(1) නවීකරණය යි. (2) නාගරීකරණය යි. (3) කාර්මීකරණය යි. (4) බටහිරකරණය යි.

➢ **ප්‍රශ්න අංක 9 සහ 10 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත කරුණු උපයෝගී කර ගන්න.**

(A) සමාජ ස්ථිතිකත්වය (B) සමාජ ගතිකත්වය

(C) යාන්ත්‍රික ඒකාබද්ධතාව (D) රණකාමී සමාජය

(E) කාර්මික සමාජය (F) ඓන්ද්‍රීය ඒකාබද්ධතාව

09. සමාජය අධ්‍යයනය කිරීම සඳහා ඔගස්ට් කොම්ට් විසින් හඳුන්වා දුන් සංකල්ප ඇතුළත් වරණය තෝරන්න.

(1) A හා B (2) C හා D (3) C හා F (4) E හා F

10. එමිල් ඩුර්කයිම් පෙන්වා දුන් සමාජ පරිණාම අවධි නිවැරදි ව දැක්වෙන වරණය කුමක් ද?

(1) A හා D (2) C හා E (3) C හා F (4) D හා F

➢ සමාජ වෙනස් වීම කෙරෙහි බලපෑම් කරන සාධක කිහිපයක් පහතින් දැක්වේ.

(A) දේශපාලන විරෝධතා (B) නවීකරණය

(C) මෝස්තර ක්‍රියාකාරකම් (D) නාගරීකරණය

(E) සංස්කෘතික සහයෝගිතා

11. කෙටි කාලීන ව සමාජ වෙනස් වීම කෙරෙහි බලපෑම් කරන සාධක ඇතුළත් නිවැරදි වරණය තෝරන්න.

(1) A , B හා D (2) A , C හා E (3) B , C හා D (4) C , D හා E

12. සිතුම් පාසලේ දී විනය නීති උල්ලංඝනය කිරීම නිසා පන්ති භාර ගුරුතුමිය ඔහු තම පියා වන විදුහල්පතිතුමා වෙත යොමු කරන ලදි. මෙම සිදු වීමට අදාළ ව නිර්මාණය වන ගැටුම හැඳින්වෙන්නේ,

(1) භූමිකා ගැටුම ලෙස ය.
(2) සාරධර්ම ගැටුම ලෙස ය.
(3) ගුරු ශිෂ්‍ය ගැටුම ලෙස ය.
(4) පාසල් විනය ගැටුම ලෙස ය.

13. පුද්ගල ජීවිතය ගැටුමකින් තොර ව සාර්ථක ව පවත්වා ගෙන යාමට උපයෝගි කර ගත හැකි කරුණු කිහිපයක් "අ" තීරුවේ ද ඒවායේ මුඛ්‍ය අර්ථයන් "ආ" තීරුවේ ද දැක්වේ.

| "අ" | | "ආ" |
|---|---|---|
| (1) උට්ඨාන සම්පදා | A | සත්පුරුෂ උතුමන් ඇසුරු කිරීම |
| (2) ආරක්ඛ සම්පදා | B | උත්සාහයෙන් යුතු ව කාර්යයේ යෙදීම |
| (3) කල්‍යාණ මිත්තතා | C | සමතුලිත ව ධන පරිහරණය පවත්වා ගැනීම |
| (4) සමජීවිකතා | D | ඉපයූ ධනය ආරක්ෂා කර ගැනීම |

ඉහත "අ" තීරුවේ දැක්වෙන කරුණු "ආ" තීරුව සමග ගැළපූ විට ලැබෙන වඩාත් නිවැරදි පිළිතුර ඇතුළත් වරණය තෝරන්න.

(1) A , B , C හා D (2) A , D , C හා B (3) B , A , D හා C (4) B , D , A හා C

14. "වැවයි - දාගැබයි , ගමයි - පන්සලයි" යන සංකල්පය මෙරට සමාජය තුළ ගොඩනැගීම කෙරෙහි බලපෑම් කළ ප්‍රධාන සාධකය වන්නේ,

(1) රජවරු වැව් හා දාගැබ් ඉදි කිරීම යි.
(2) බුදු දහමින් ලැබුණු ආභාසය යි.
(3) ගොවිතැන් සරු වී වැව් සහ දාගැබ් ඉදි කිරීම යි.
(4) එකල ජනයා වැව් සහ දාගැබ් ඉදි කිරීම විනෝදාංශයක් සේ සැලකීම යි.

15. බටහිර සමාජ ධනවාදී ආකල්ප ගොඩනැගීම කෙරෙහි බලපෑම් කළ ප්‍රධාන සාධකය කුමක් ද?

(1) නව නිර්මාණ බිහි වීම
(2) කාර්මික අංශයේ දියුණුව
(3) ප්‍රොතෙස්තන්ත්‍ර ආචාරධර්ම
(4) දේශපාලන ප්‍රතිසංස්කරණ

16. බටහිර අධිරාජ්‍යවාදී පාලනයේ බලපෑමෙන් ඔවුන්ගේ සංස්කෘතිකාංග ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ ව්‍යාප්ත විය. සමාජ විද්‍යාවට අනුව මෙම සංසිද්ධිය හැඳින්වෙන්නේ,

(1) සංස්කෘතික ගැටුම යනුවෙනි.
(2) සංස්කෘතික ලැග්ම යනුවෙනි.
(3) සංස්කෘතික විසරණය යනුවෙනි.
(4) සංස්කෘතික අනුකූලතාව යනුවෙනි.

17. සංස්කෘතිය පරපුරෙන් පරපුරට සම්ප්‍රේෂණය කිරීමේ ප්‍රධාන මාධ්‍ය වන්නේ,

(1) ව්‍යවහාර භාෂාව යි. (2) ආගම යි. (3) ජනමාධ්‍ය යි. (4) පාසල යි.

18. ප්‍රාථමික සමාජයේ මානවයාගේ විශ්වාසයන්ට අනුව තමා අවට පරිසරයේ දක්නට ලැබෙන අව්ව, වැස්ස ආදි ස්වාභාවික සංසිද්ධීන් ඇති වන්නේ,

(1) ස්වභාව ධර්මයේ නියමයෙනි.
(2) මිනිසාගේ බලපෑමෙනි.
(3) දේව බලයෙනි.
(4) පාරිසරික සාධකවල බලයෙනි.

19. සංස්කෘතියේ ප්‍රධාන කොටස් **දෙක** ඇතුළත් වරණය තෝරන්න.

(1) දේශීය සංස්කෘතිය හා විදේශීය සංස්කෘතිය.
(2) ගැමි සංස්කෘතිය හා නාගරික සංස්කෘතිය
(3) භෞතික සංස්කෘතිය හා අභෞතික සංස්කෘතිය.
(4) මහා සංස්කෘතිය හා උප සංස්කෘතිය.

20. සමාජයේ ස්වභාවය තීරණය වීමට බලපාන ප්‍රධාන සාධකය මින් කුමක් ද?

(1) සාමාජිකයාගේ ස්වභාවයට සාපේක්ෂ ව
(2) ආගමික ඉගැන්වීම් අනුව
(3) දේශපාලන ස්වභාවයට සාපේක්ෂ ව
(4) උගත්කම අනුව

21. පුද්ගලයාට ඔහු අයත් සමාජයේ සංස්කෘතිය මුල් වරට අභ්‍යන්තරීකරණය කරනු ලබන්නේ කුමන සමාජ සමූහ වර්ගය මගින් ද?

(1) ද්විතීයික සමූහ (2) ප්‍රාථමික සමූහ (3) අනිච්ඡානුග සමූහ (4) මහා සමූහ

22. පුද්ගලයා විසින් සාධනය කර ගනු ලබන තත්ත්වයන් පමණක් නිවැරදි ව ඇතුළත් ව ඇති වරණය තෝරන්න.

(1) මව , ගුරුවරයා , පූජකයා (2) භික්ෂුව , පිරිමියා , කරනවැමියා

(3) වෛද්‍යවරයා , ගොවියා , ස්ත්‍රිය (4) සිංහලයා , ගායකයා , රහතන් වහන්සේ

23. වර්තමාන සමාජය තුළ සේවා යෝජකයන් හා සේවකයින් අතර විවිධ ගැටුම් නිර්මාණය වේ. මෙම ගැටුම් නිරාකරණය කර ගැනීම සඳහා මාර්ගෝපදේශ ලබා ගත හැකි බෞද්ධ සූත්‍රය මින් කුමක් ද?

(1) මහා පරිනිබ්බාණ සූත්‍රය (2) කාලාම සූත්‍රය

(3) වසල සූත්‍රය (4) සිගාලෝවාද සූත්‍රය

24. බෞද්ධ සූත්‍ර කිහිපයක් "අ" තීරුවේ ද එම සූත්‍රවල දැක්වෙන සමාජ සාධාරණත්වය සඳහා මග පෙන්වන ඉගැන්වීම් "ආ" තීරුවේ ද දැක්වේ.

| "අ" | "ආ" |
|---|---|
| (1) වසල සූත්‍රය | (A) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ වටිනාකම |
| (2) චක්කවත්තිසීහනාද සූත්‍රය | (B) සාධිත තත්ත්වය මත පුද්ගලයා ඇගයීමට ලක්විය යුතු බව |
| (3) චූල්ලහත්ථිපදෝපම සූත්‍රය | (C) යමක් පිළිගැනීමේ දී විමර්ශනාත්මක අධ්‍යයනයේ වැදගත්කම |

ඉහත "අ" තීරුවේ දැක්වෙන සූත්‍ර "ආ" තීරුවේ ඉගැන්වීම් සමග ගැළපූ විට ලැබෙන වඩාත් නිවැරදි වරණය තෝරන්න.

(1) A , B , C (2) A , C , B (3) B , A , C (4) B , C , A

25. ශ්‍රී ලංකාවේ පැරණි ජනාවාසයන්හි පැවති ඒකාබද්ධ පවුල් ක්‍රමය සම්බන්ධව **සාවද්‍ය** ප්‍රකාශය මින් කුමක් ද?

(1) කෘෂිකාර්මික කටයුතුවලට ශ්‍රමය හිඟ විය. (2) සමාජානුයෝජනය හොඳින් සිදු විය.

(3) ආර්ථික සහයෝගිතාව හොඳින් සිදු විය. (4) ජනාවාසයේ ආරක්ෂාව සුරක්ෂිත විය.

26. පුද්ගලයා පෘථිවි රසයට තණ්හාව ඇති කර ගැනීමත් සමග සමාජ පරිණාමය සිදු වූ අයුරු දැක්වෙන බෞද්ධ සූත්‍රය කුමක් ද?

(1) සිඟාලෝවාද සූත්‍රය (2) පරාභව සූත්‍රය (3) අග්ගඤ්ඤ සූත්‍රය (4) ව්‍යග්ගපජ්ජ සූත්‍රය

27. තීන්දු තීරණ ගැනීමේ දී නිදහස් චින්තනයෙන් හා විචරශීලී බුද්ධියෙන් යුතු ව ක්‍රියා කළ යුතු බව අවධාරණය කෙරෙන බෞද්ධ සූත්‍ර දේශනාව වන්නේ,

(1) අණන සූත්‍රය යි. (2) කූල සූත්‍රය යි. (3) පත්තකම්ම සූත්‍රය යි. (4) කාලාම සූත්‍රය යි.

➢ පහත දැක්වෙන A , B , C , D සිද්ධි යුගල අධ්‍යයනය කර 28 සහ 29 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A (i) ජන වර්ග අතර අන්‍යෝන්‍ය අවබෝධය
(ii) ජනවාර්ගික ගැටලු

B (i) මත්ද්‍රව්‍ය භාවිතය
(ii) බිඳුණු පවුල් නිර්මාණය

C (i) මාර්ග නීති උල්ලංඝනය
(ii) මාර්ග අනතුරු

D (i) කැලිකසළ ප්‍රතිචක්‍රීකරණය
(ii) පරිසර දූෂණය

28. අංක **(i)** හි වැඩි වීම, අංක **(ii)** හි වැඩි වීම කෙරෙහි බලපෑම් කරක සිද්ධි යුගලය අන්තර්ගත වරණය තෝරන්න.

(1) A හා B (2) A හා C (3) A හා D (4) B හා C

29. අංක **(i)** හි වැඩි වීම, අංක **(ii)** හි අඩු වීම කෙරෙහි බලපාන සිද්ධි යුගලය ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) A හා B (2) A හා C (3) A හා D (4) C හා D

30. විහාරස්ථානවල නිර්මාණය කර ඇති අපායේ අවස්ථා දැක්වෙන සිතුවම්වල සමාජ විද්‍යාත්මක වටිනාකම ප්‍රකාශ වන වරණය කුමක් ද?

(1) අපාය පිළිබඳ සමාජ දැනුම පුළුල් වීම (2) අපාගත වීමෙන් සිදු වන විපාක ප්‍රදර්ශනය වීම

(3) සමාජ පාලන උපකරණයක් වීම (4) විහාරස්ථානයේ අලංකාරය ඇති වීම

31. සමාජ ගැටලු රැසකට හේතු වන මත්ද්‍රව්‍ය භාවිතය සමාජයෙන් තුරන්කිරීම සඳහා වඩාත් සුදුසු ප්‍රායෝගික ක්‍රියාමාර්ගය වන්නේ මින් කුමක් ද?

(1) මිනිසුන් තුළ ස්වයං පාලන හැකියාව වර්ධනය කිරීම

(2) මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ට මරණ දඬුවම ලබා දීම

(3) මත්ද්‍රව්‍ය නීතියෙන් තහනම් කිරීම

(4) පොලීසිය මගින් මත්ද්‍රව්‍ය වෙළෙඳුන් අත්තඩංගුවට ගැනීම

32. සමාජ ගැටලුවක් හඳුනා ගැනීමේ දී විමසා බැලිය යුතු කරුණක් **නො වන්නේ** මින් කුමක් ද?

(1) පුද්ගලයෙකුට බලපාන ආකාරය සොයා බැලීම

(2) සමාජ විසංවිධානයට බලපාන්නේ ද යන්න විමසා බැලීම

(3) ගැටලුවට විසඳුම් තිබේ ද? යන්න සොයා බැලීම

(4) සමාජයට අහිතකර ලෙස බලපාන්නේ දැ යි විමසා බැලීම

33. ශ්‍රී ලංකාවේ වර්තමාන සමාජය තුළ බහුලව දක්නට ලැබෙන සොරකම, කොල්ලකෑම හා වංචා දූෂණ වැනි අපරාධ සිදුවීම කෙරෙහි බලපාන ප්‍රධාන හේතුව කුමක් ද?

(1) පාරිසරික ගැටලු උග්‍ර වීම. (2) ආර්ථික ගැටලු උග්‍ර වීම

(3) ආගමික ගැටලු උග්‍ර වීම. (4) ජනවාර්ගික ගැටලු උග්‍ර වීම

34. අපරාධ ක්ෂේත්‍රයට අලුතින් එක් වී ඇති අංගය මින් කුමක් ද?

(1) ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණය (2) ආයුධ වෙළෙඳාම

(3) අන්තර්ජාල ආශ්‍රිත අපරාධ (4) අසභ්‍ය ඡායාරූප නිෂ්පාදනය

35. පර්යේෂණ සැලැස්මක් යන්නෙහි අර්ථය වඩාත් හොඳින් නිරූපණය වන වරණය තෝරන්න.

(1) පරිසර විශ්ලේෂණ සිදු කරන ආකාරය දැක්වෙන සැලැස්මකි.

(2) නිශ්චිත කාල රාමුවකට යටත් වූ වැඩ සැලැස්මකි.

(3) තොරතුරු රැස් කර ගන්නා ආකාරය දැක්වෙන සැලැස්මකි.

(4) සම්පත් සපයා ගන්නා ආකාරය දැක්වෙන සැලැස්මකි.

36. සමාජ විද්‍යා පර්යේෂණයක් සඳහා ප්‍රවේශවීමේ දී පළමුවෙන් ම සිදු කළ යුතු කාර්ය වන්නේ,

(1) පර්යේෂණයට උචිත නියැදියක් තෝරා ගැනීම යි.

(2) පර්යේෂණයකට යෝග්‍ය ගැටලුවක් හඳුනා ගැනීම යි.

(3) පර්යේෂණයට අදාළ අරමුණු තීරණය කිරීම යි.

(4) පර්යේෂණ යෝජනාවක් පිළියෙළ කිරීම යි.

37. සිසුන්ගේ බුද්ධිය සම්බන්ධ ව සිදු කළ පර්යේෂණයක දී එක ම ශිෂ්‍ය කණ්ඩායමකට සමීප කාලයක් තුළ එක ම ප්‍රශ්න පත්‍රය දෙවතාවක් ලබා දුන් අතර සමාන ප්‍රතිඵලයක් ම ලැබුණි. මෙම දත්ත රැස් කිරීමේ උපකරණයේ පැවති ගුණාංගය කුමක් ද?
(1) වලංගුතාව (2) වාස්තවික බව (3) ප්‍රායෝගික බව (4) විශ්වසනීයතාව

➢ පහත සඳහන් සිද්ධිය ඇසුරින් 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මූලික පිරිවෙන් අවසාන විභාගයට පෙනී සිටින සිසුන්ගේ සාධන මට්ටම අසතුටුදායක් බව ගුරුවරුන් විසින් පරිවේණාධිපති හිමියන්ට වාර්තා කරන ලදී. අනතුරු ව පරිවේණාධිපති හිමියන් විසින් ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස පේමානන්ද හිමියන්ට පවරන ලදී. ඒ පිළිබඳ ව සරල පර්යේෂණයක නිරත වූ පේමානන්ද හිමියන් අනු ගමනය කළ කාර්යන් කිහිපයක් පහත දැක්වේ.

A. වසර තුනක සිසුන්ගේ ලකුණු වාර්තා, සටහන් පොත්, පැමිණීමේ ලේඛන ඇසුරින් දත්ත ලබා ගැනීම.
B. දින චරියාව, නේවාසිකාගාරය හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිසුන් දැනුවත් ව නිරීක්ෂණය කිරීම.
C. ඉගැන්වීම් කටයුතු නිරීක්ෂණයෙන් හා සාකච්ඡා මගින් ගුරුවරුන්ගෙන් තොරතුරු ලබා ගැනීම.
D. ලබා ගත් තොරතුරු විමර්ශනය කර නිගමන හා යෝජනා ඇතුළත් ලේඛනයක් සකසා පරිවේණාධිපති හිමියන්ට ලබා දීම.

38. පේමානන්ද හිමියන් A අක්ෂරය යටතේ ලබා ගත් දත්ත හැඳින්වෙන්නේ,
(1) ද්විතීයික දත්ත ලෙස ය. (2) ප්‍රාථමික දත්ත ලෙස ය.
(3) මූලාශ්‍ර දත්ත ලෙස ය. (4) පරීක්ෂණ දත්ත ලෙස ය.

39. B අක්ෂරය යටතේ දැක්වෙන නිරීක්ෂණ ප්‍රභේදය කුමක් ද?
(1) වක්‍ර නිරීක්ෂණය (2) ඍජු නිරීක්ෂණය
(3) සහභාගිත්ව නිරීක්ෂණය (4) විද්‍යාත්මක නිරීක්ෂණය

40. පේමානන්ද හිමියන් විසින් පරිවේණාධිපති හිමියන්ට ලබා දුන් නිගමන හා යෝජනා ඇතුළත් ලේඛනය පර්යේෂණ ක්‍රම විද්‍යාවේ දී හැඳින්වෙන්නේ කුමන නමකින් ද?
(1) පර්යේෂණ වාර්තාව (2) පර්යේෂණ යෝජනාව
(3) විශ්ලේෂණ වාර්තාව (4) පරීක්ෂණ වාර්තාව

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விக் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)**
Year End Term Test – 2022 (2023)

**සමාජ විද්‍යාව - I, II** **5 ශ්‍රේණිය**

## සමාජ විද්‍යාව - II

**සැලකිය යුතුයි.**
❖ **පළමුවන** ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **හතරක්** ද තෝරාගෙන, **ප්‍රශ්න පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. (i) සමාජ විද්‍යාව පිළිබඳ නිර්වචන මගින් ප්‍රකාශවන අදහස් **දෙකක්** සඳහන් කරන්න.
(ii) මැක්ස් වෙබර්ගෙන් සමාජ විද්‍යාව විෂයේ වර්ධනයට සිදු වූ සේවාවන් **දෙකක්** ලියන්න.
(iii) සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය සමාජයේ හමු වන යාන්ත්‍රික ඒකාබද්ධතාව ප්‍රකට වන ලක්ෂණ **දෙකක්** ලියන්න.
(iv) බටහිරකරණය නිසා ශ්‍රී ලාංකේය සමාජයේ ඇති වූ වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න.
(v) එක් සංස්කෘතියක් තවත් සංස්කෘතියකින් වෙනස් වීමට බලපාන සාධක **දෙකක්** සඳහන් කරන්න.
(vi) පුද්ගල පෞරුෂය සංවර්ධනය සඳහා සංස්කෘතිය මගින් සිදු කෙරෙන කාර්යන් **දෙකක්** ලියන්න.
(vii) පිරිවෙන් ශිෂ්‍යයා යන තත්ත්වයට අදාළ කාර්යන් **දෙකක්** ලියන්න.
(viii) සමාජ පාලනය නිසි පරිදි සිදු වීමෙන් සමාජයට අත් වන ප්‍රයෝජන **දෙකක්** සඳහන් කරන්න.
(ix) කැලිකසළ කළමනාකරණය නිසි අයුරින් සිදු නො කිරීම හේතුවෙන් සමාජය තුළ උද්ගත වන ගැටලු **දෙකක්** සඳහන් කරන්න.
(x) සමාජ විද්‍යා පර්යේෂණයක ප්‍රතිඵල ප්‍රයෝජනයට ගත හැකි ආකාර **දෙක** මොනවා ද?

(ලකුණු 2 x 10 = 20)

02. (i) සමාජ විද්‍යාවේ කාර්යන් **දෙකක්** ලියන්න. (ලකුණු 02)
(ii) සමාජ විද්‍යාවේ උපවිෂය ධාරාවන් **තුනක්** නම් කරන්න. (ලකුණු 03)
(iii) සමාජ අනුකලනයට මග පෙන්වන බෞද්ධ සමාජ අන්තර් ක්‍රියාවාදය සිඟාලෝවාද සූත්‍රයේ අන්තර්ගත සදිසා සංකල්පයේ කරුණු **දෙකක්** ඇසුරින් අගය කරන්න. (ලකුණු 05)

03. (i) හර්බට් ස්පෙන්සර් දැක්වූ සමාජ පරිණාමයේ අවධි **දෙක** මොනවා ද? (ලකුණු 02)
(ii) නවීකරණයේ අංග **තුනක්** නම් කරන්න. (ලකුණු 03)
(iii) ශ්‍රී ලංකේය සමාජයේ සුභ සිද්ධිය සැලසෙන දේශපාලන වෙනසක් ඇති කරීම සඳහා පාලකයින් විසින් දස රාජධර්ම අනුගමනය කිරීමේ අවශ්‍යතාව කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

04. (i) සංස්කෘතික ලැග්ම යනු කුමක් ද? (ලකුණු 02)

(ii) ජනප්‍රිය බුදුසමයට අයත් අංග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) සිංහල බෞද්ධ සංස්කෘතියේ පිළිගත් ධර්මතා වෙනස් වීම කෙරෙහි ගෝලීයකරණය බලපා ඇති ආකාරය කරුණු **දෙකක්** ඇසුරින් විශ්ලේෂණය කරන්න. (ලකුණු 05)

05. (i) සමාජයක් යනු කුමක් ද? (ලකුණු 02)

(ii) ග්‍රාමීය සමාජ පාලන ක්‍රියාවලියේ දී විහාරාධිපති ස්වාමීන් වහන්සේගෙන් සිදු විය යුතු කාර්යන් **තුනක්** ලියන්න. (ලකුණු 03)

(iii) විසංවිධානයෙන් තොර සමාජයක් ගොඩනගා ගැනීම සඳහා පංචශීලයේ වැදගත්කම කරුණු **දෙකක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

06. (i) ශ්‍රී ලංකාවේ නීතිය ක්‍රියාත්මක කරන ආයතන **දෙකක්** ලියන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ පැරණි සමාජයේ පැවති සමාජ පාලන ක්‍රම **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) සමාජ පාලනයෙහිලා අත්‍යවශ්‍ය ස්වයං ශික්ෂණය ඇති කර ගැනීමට බෞද්ධ භාවනාවෙහි වටිනාකම භාවනා ක්‍රම **දෙකක්** ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 05)

07. (i) සමාජ ගැටලු ඇති වීම කෙරෙහි බලපාන හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) අපරාධ වර්ග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) සමාජ ගැටලුවක් සඳහන් කර, එය නිවාරණයට මග පෙන්වන බෞද්ධ ඉගැන්වීම් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05)

08. (i) සමාජ විද්‍යාත්මක පර්යේෂණයක් සිදු කිරීමට යෝග්‍ය මාතෘකා **දෙකක්** යෝජනා කරන්න. (ලකුණු 02)

(ii) සමාජ විද්‍යාත්මක පර්යේෂණයක් සඳහා දත්ත රැස් කිරීමේ දී මතු විය හැකි ගැටලු **තුනක්** ලියන්න. (ලකුණු 03)

(iii) පර්යේෂණ වාර්තාවක ඇතුළත් විය යුතු පරිච්ඡේද පිළිවෙළ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය / Ministry of Education - Division of Piriven Education / கல்வி அமைச்சு - பிரிவெனாக் கல்விப் பிரிவு

| 08 | S | I, II |
|---|---|---|

# පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)

05 ශ්‍රේණිය

## (08) සමාජ විද්‍යාව - I, II

පැ තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

### සමාජ විද්‍යාව I පත්‍රය

**සැලකිය යුතුයි :**

* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40 ක්** ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. "සමාජ විද්‍යාව යනු සාමූහික චර්යාව පිළිබඳව අධ්‍යයනය වේ". යන නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,
(1) එමිල් ඩුර්කයිම් ය. (2) එල්. ටි. හොබ්හවුස් ය.
(3) කිංස්ලි ඩේවිස් ය. (4) රොබට් පාර්ක් ය.

2. සමාජ විද්‍යාවේ නියමුවා ලෙස හඳුන්වනු ලබන දාර්ශනිකයා කවුද?
(1) ඔගස්ට් කොම්ට් (2) සෙන්ට් සිමෝන්
(3) කාල් මාක්ස් (4) හර්බට් ස්පෙන්සර්

3. සමාජ විද්‍යාව විෂයෙහි අධ්‍යයනය කරන තත්ත්වය හා කාර්යභාරය යන සංකල්පය පුළුල් ලෙස විවරණය කෙරන බෞද්ධ සූත්‍ර දේශනාව වන්නේ මින් කුමක් ද?
(1) වසල සූත්‍රය (2) සිගාලෝවාද සූත්‍රය (3) පරාභව සූත්‍රය (4) මහා මංගල සූත්‍රය

4. ආරෝපිත දිසානතික ලක්ෂණ පමණක් නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
(1) ස්ත්‍රිය, කුලය, රජකම උරුම වීම (2) උපාසිකාව, කුලය, වාසගම
(3) පුරුෂයා, සාමණේර භික්ෂුව, පූජකයා (4) රජකම උරුම වීම, ගුරුවරයා, කුලය

5. සමාජ විද්‍යාව විෂය වර්ධනයට දායක වූ මැක්ස් වේබර්ගේ අධ්‍යයනයට යොමු වූ ප්‍රධාන විෂය ක්ෂේත්‍රයක් වන්නේ මින් කුමක් ද?
(1) සමාජ සමූහ (2) සමාජ සංස්ථා (3) සමාජ ක්‍රියා (4) ශ්‍රම විභජනය

* ප්‍රශ්න අංක 6ට පිළිතුරු සැපයීම සඳහා (අ) තීරුවේ දැක්වෙන සමාජයීය විද්‍යාඥයින් හා (ආ) තීරුවේ දැක්වෙන ඔවුන් රචනා කර ඇති කෘති උපයෝගී කර ගන්න.

| (අ) තීරුව | (ආ) තීරුව |
|---|---|
| (1) නන්දසේන රත්නපාල | (A) බෞද්ධ සමාජ පාලනය |
| (2) ප්‍රණීත් අභයසුන්දර | (B) බෞද්ධ සමාජ විද්‍යාව |
| (3) ඩබ්ලිව්. එස්. කරුණාරත්න | (C) බෞද්ධ දර්ශනය හා චරණය |

6. ඉහත (අ) තීරුවේ සමාජයීය විද්‍යාඥයින්ගේ අනුපිළිවෙළට (ආ) තීරුවේ දැක්වෙන කෘති ගැළපූ විට නිවැරදි වරණය තෝරන්න.
(1) A, B හා C (2) A, D හා C (3) B, A හා C, (4) B, C හා A

7. සමාජ විද්‍යාවේ දැනුමෙන් මිනිසාගේ සමාජ ජීවිතය වඩාත් පුළුල් ලෙස තේරුම් ගැනීමට හා විග්‍රහ කිරීමට හැකියාව ලැබී ඇත්තේ සමාජ විද්‍යා විෂයයේ ඇති කුමන ලක්ෂණය නිසා ද?
(1) සමස්ත සමාජ ජීවිතය ම අධ්‍යයනය කිරීම (2) මානව අන්තර්ක්‍රියාවන් අධ්‍යයනය කිරීම
(3) විද්‍යාත්මක පදනමකින් සමාජය අධ්‍යයනය කිරීම (4) සංස්කෘතික සාධක අධ්‍යයනය කිරීම

[2 වැනි පිටුව බලන්න.

- පහත දැක්වෙන සමාජ පරිණාම අවධි උපයෝගී කර ගෙන 09 සහ 10 වෙනි ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  A - ආභස්සර ජීවියෙකුගෙන් සත්ත්වයාගේ පරිණාමය සිදු වූ බව
  B - යුතුකම් ඉටු කිරීම අයිතිවාසිකම් තහවුරු වීමට හේතු වන බව
  C - දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව හා සමානාත්මතාවෙන් යුතු ව සමාජ සම්බන්ධතා පැවැත්විය යුතු බව
  D - මහජන සම්මතයෙන් පාලකයෙකු තෝරා පත් කර ගත් බව

8. අග්ගඤ්ඤ සූත්‍රයේ ඉගැන්වීම් පමණක් දැක්වෙන වරණය වන්නේ,
   (1) A හා B ය. (2) A හා D ය. (3) B හා C ය. (4) C හා D ය.

9. සිගාලෝවාද සූත්‍රයේ ඉගැන්වීම් පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද ?
   (1) A හා B (2) A හා D (3) B හා C (4) B හා D

10. සරල තත්ත්වයක සිට සංකීර්ණ තත්ත්වයක් දක්වා සමාජයේ සිදු වන වෙනස පෙන්වා දෙමින් හර්බට් ස්පෙන්සර් විසින් රචිත කෘතිය කුමක් ද ?
    (1) සමාජයේ ශ්‍රම විභජනය (2) ප්‍රොතෙස්තන්ත්‍ර ආචාර ධර්ම හා ධනවාදයේ සාරය
    (3) ප්‍රාග්ධනය (4) සමාජ පරිණාම පිළිබඳ නීතිය

11. කාල් මාක්ස් දැක්වූ සමාජ පරිණාමය පිළිබඳ විවරණය අනුව සමාජ විෂමතාවන් සහිත සමාජ අවධි පමණක් නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?
    (1) පූර්ව කොමියුනිස්ට් අවධිය, සමාජවාදී අවධිය, සුපිරි කොමියුනිස්ට් අවධිය
    (2) පූර්ව කොමියුනිස්ට් අවධිය, වැඩවසම් අවධිය, සුපිරි කොමියුනිස්ට් අවධිය
    (3) වහල් අවධිය, වැඩවසම් අවධිය, ධනවාදී අවධිය
    (4) වැඩවසම් අවධිය, ධනවාදී අවධිය, සුපිරි කොමියුනිස්ට් අවධිය

- පහත සඳහන් A, B, C හා D යන සිද්ධි යුගල අධ්‍යයනය කර අංක 12 සහ 13 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

  A - (i) ධර්ම ඥානය
  (ii) යහපත් චර්යා
  B - (i) ආර්ථික සංවර්ධනය
  (ii) දූප්පත්කම
  C - (i) ආගන්තුක සත්කාර
  (ii) විදේශිකයන්ගේ පැමිණීම
  D - (i) ධාර්මික පාලන සංකල්ප භාවිතය
  (ii) රාජ්‍ය අපරාධ

12. අංක (i) හි වැඩි වීම, අංක (ii) හි වැඩි වීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක වන්නේ,
    (1) A සහ B ය. (2) A සහ C ය. (3) B සහ C ය. (4) B සහ D ය.

13. අංක (i) හි වැඩි වීම, අංක (ii) හි අඩු වීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක තෝරන්න.
    (1) A සහ B (2) A සහ C (3) B සහ D (4) C සහ D

14. සමාජයෙහි උසස් තාක්ෂණයක් සහිත යාන්ත්‍රික මෙවලම් භාවිතය වර්ධනය වීම හා ව්‍යාප්ත වීම,
    (1) නාගරීකරණයයි. (2) නවීකරණයයි. (3) බටහිරකරණයයි. (4) කාර්මීකරණයයි.

15. යුරෝපා ජාතීන් සාම්ප්‍රදායික රාජාණ්ඩු පාලන ක්‍රමයෙන් මිදී ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු බිහි කර ගැනීමට පෙළඹවූ ප්‍රධාන සාධකය මින් කුමක් ද?
    (1) ඇමරිකානු විප්ලවය (2) රුසියානු විප්ලවය (3) ප්‍රංශ විප්ලවය (4) ඉංග්‍රීසි විප්ලවය

16. නූතන ලෝකය "විශ්ව ගම්මානයක්" බවට පත් වීම සඳහා බලපෑ ප්‍රධාන සාධකය වන්නේ,
    (1) අධ්‍යාපන නවීකරණයයි. (2) ප්‍රවාහන නවීකරණයයි.
    (3) දේශපාලන නවීකරණයයි. (4) ජනමාධ්‍ය නවීකරණයයි.

17. දෙවනපෑතිස් රජු විසින් තනවා පූජා කරන ලද පළමු පිරිවෙන මින් කුමක් ද?
    (1) දීඝවංකමණ පිරිවෙන (2) එලග්ග පිරිවෙන (3) සුනහාත පිරිවෙන (4) මහා කාළප්‍රසාද පිරිවෙන

18. "වැවයි දාගැබයි - ගමයි පන්සලයි" යන සංකල්පයට අයත් වැවෙන් සංකේතවත් වන්නේ,
    (1) ආර්ථික සශ්‍රීකත්වයයි. (2) සන්තුෂ්ටියයි. (3) විමුක්තියයි. (4) සාමකාමී බවයි.

19. **රැල්ප් ලින්ටන්ගේ** නිර්වචනයට අනුව සංස්කෘතිය යනු,
   (1) පරම්පරාවෙන් උරුම වූ ජීවන රටා සමුදායකි. (2) අවශ්‍යතා සපුරා ගැනීමට ඇති කර ගත් දෙයකි.
   (3) භෞතික හා අභෞතික අංගයන්ගේ එකතුවකි. (4) මිනිසුන්ගේ සමාජ කාර්යයන්වල එකතුවකි.

- ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ආගමික දර්ශන කිහිපයක් (අ) තීරුවේ ද ඒවාට සම්බන්ධ ප්‍රබල ග්‍රන්ථ කිහිපයක් (ආ) තීරුවේ ද දැක්වේ.

| (අ) | (ආ) |
|---|---|
| 1. බුදු දහම | A අල්-කුරානය |
| 2. හින්දු දහම | B ශුද්ධ බයිබලය |
| 3. ක්‍රිස්තියානි දහම | C භගවත් ගීතාව |
| 4. ඉස්ලාම් දහම | D ධම්මපදය |

20. ඉහත (අ) තීරුවේ ආගමික දර්ශන හා (ආ) තීරුවේ ග්‍රන්ථ ගැළපූ විට ලැබෙන නිවැරදි වරණය තෝරන්න.
   (1) A, B, C හා D (2) B, A, C හා D (3) D, A, B හා C (4) D, C, B හා A

21. ප්‍රාථමික සමාජ පිළිබඳව සිදු කළ අධ්‍යයනයක අනාවරණ අනුව පුද්ගල පෞරුෂ වර්ධනය සඳහා බාහිර පරිසරය යහපත් හා අයහපත් ලෙස බලපෑම් කරන බව පෙන්වා දෙන ලද මානව විද්‍යාඥයින් දෙදෙනා කවුද?
   (1) මාග්‍රට් මීඩ් හා රූත් බෙනඩික්ට් (2) රූත් බෙනඩික්ට් හා බී. මැලිනොව්ස්කි
   (3) රේමන්ඩ් ෆර්ත් හා මාග්‍රට් මීඩ් (4) රැල්ප් ලින්ටන් හා රූක් බෙනඩික්ට්

22. භෞතික සංස්කෘතියට අයත් අංග පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) කෞතුකාගාරවල ඇති සියලු ම භාණ්ඩ භෞතික සංස්කෘතියට අයත් අංග වේ.
   (2) පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති සියලු ම නිර්මාණ භෞතික සංස්කෘතියට අයත් අංග වේ.
   (3) මිනිසා තම පහසුව උදෙසා නිර්මාණය කර ගත් සියලු ම දේ භෞතික සංස්කෘතියට අයත් අංග වේ.
   (4) මිනිසා විසින් නිර්මාණය කර ඇති සියලු ම කලාවන් භෞතික සංස්කෘතියට අයත් අංග වේ.

- පහත සඳහන් කරුණු හොඳින් අධ්‍යයනය කර 23 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.
  A - රසායනික පොහොර හා කෘමිනාශක භාවිතයට යොමු වීම
  B - කෘෂිකාර්මික කටයුතු සඳහා යන්ත්‍ර සූත්‍ර භාවිතයට පෙළඹීම
  C - ගොවි ජනපද ව්‍යාපාරය අරම්භ වීම
  D - කෘෂි අස්වනු වර්ධනය වීම

23. හරිත විප්ලවය නිසා ශ්‍රී ලාංකේය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් පමණක් නිවැරදිව දක්වා ඇති වරණය කුමක් ද?
   (1) A, B හා C (2) A, B හා D (3) A , C හා D (4) B, C හා D

- පහත දැක්වෙන ලක්ෂණ ඇසුරින් 23 හා 24 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  A - විස්තෘත පවුල් ක්‍රමය
  B - වාණිජ භෝග වගාව
  C - පිරිවෙන් අධ්‍යාපනය
  D - ස්වයංපෝෂිත කෘෂි ආර්ථිකය
  E - න්‍යෂ්ටික පවුල් ක්‍රමය
  F - පාසල් අධ්‍යාපනය

24. පැරණි ශ්‍රී ලාංකේය සමාජ ව්‍යුහයේ ප්‍රබලව දක්නට ලැබුණු ලක්ෂණ පමණක් ඇතුළත් වරණය තෝරන්න.
   (1) A, C හා D (2) A, D හා E (3) B, C හා D (4) B, E හා F

25. නූතන ශ්‍රී ලාංකේය සමාජ ව්‍යුහයේ ප්‍රබලව දක්නට ලැබෙන ලක්ෂණ පමණක් දැක්වෙන පිළිතුර වන්නේ,
   (1) A, C හා E ය. (2) B, C හා F ය. (3) B, E හා F ය. (4) C, D හා F ය.

26. බ්‍රාහ්මණ ඉගැන්වීම්වලට අනුව ඉහළ සිට පහළට පිළිවෙළින් මානව සමාජය ස්තරගත කොට ඇති ආකාරය දැක්වෙන නිවැරදි වරණය කුමක් ද?
   (1) බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර (2) ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ශුද්‍ර, වෛශ්‍ය
   (3) ක්ෂත්‍රිය, වෛශ්‍ය, බ්‍රාහ්මණ, ශුද්‍ර (4) වෛශ්‍ය, ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, ශුද්‍ර

27. රක්ෂිත බන්ධනාගාරයක මූලික ම කාර්ය වන්නේ කුමක් ද?
(1) වරදට දඬුවම් කිරීම (2) පුනරුත්ථාපනය
(3) දණ්ඩනය හා පුනරුත්ථාපනය (4) සැකකරුවන් උසාවියට ඉදිරිපත් කිරීම

28. බෞද්ධ ඉගැන්වීම්වලට අනුව ස්වයං පාලනයක් ඇති කර ගැනීම සඳහා වඩාත් උචිත ක්‍රියාමාර්ගය කුමක් ද?
(1) දන්සල් පැවැත්වීම (2) සත්‍යක්‍රියා කිරීම
(3) ධර්ම සාකච්ඡා පැවැත්වීම (4) පංචශීලය පිළිපැදීම

29. "මෙම දීපයෙහි යම් යහපත් ගමක් ඇතොත් එහි විහාරයක් හා දේවාලයක් ඇත. එම ගම බැඳී යන පරිද්දෙන් ගෙවල් එකිනෙකට යා කොට පෙළට නිර්මාණය කර ඇත්තේ ය..." ශ්‍රී ලංකාවේ ගම පිළිබඳ මෙලෙස අර්ථ දක්වා ඇත්තේ කවුරුන් විසින් ද?
(1) එමර්සන් ටෙනන්ට් (2) ඊ. ආර්. ලීච්
(3) නූර් යාල්මාන් (4) රොබට් නොක්ස්

30. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයෙන් නිදහස ලබා ගත් වර්ෂය කුමක් ද?
(1) 1931 (2) 1947 (3) 1948 (4) 1972

- පහත සඳහන් කරුණු හොඳින් අධ්‍යයනය කර 31 වෙනි ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.
  A - නීති පැනවීමේ බලතල
  B - අත්අඩංගුවට ගැනීමේ බලතල
  C - කලහකාරී පිරිස් විසුරුවා හැරීමේ බලතල
  D - සෝදිසි කිරීමේ බල

31. ශ්‍රී ලංකාවේ පොලිසිය සතු බලතල නිවැරදි ව දක්වා ඇති වරණය කුමක් ද?
(1) A, B හා C (2) A, B හා D (3) A , C හා D (4) B, C හා D

32. ආර්ථික අපරාධ, ලිංගික අපරාධ, දේශපාලන අපරාධ හා විවිධ අපරාධ යනුවෙන් අපරාධ වර්ගීකරණය කරන ලද්දේ,
(1) ඩබ්ලිව්. ඒ. බොන්ගර් ය. (2) ගරා පෝල් ය. (3) මිල්ටන් ඉන්ගර් ය. (4) සිසාරෝ ලොම්බ්‍රෝසෝ ය.

33. ජනවාර්ගික ගැටුම් ඇති වීම් කෙරෙහි බලපෑම් **නොකරන** සාධකය ඇතුළත් නිවැරදි වරණය තෝරන්න.
(1) අන්‍යෝන්‍ය සුහදතාව වර්ධනය නොවීම (2) නීතිය සැමට ඉහළින් පැවතීම
(3) අයිතිවාසිකම් අහිමි වීම (4) සමාජ අසාධාරණ තත්ත්වයන්ට මුහුණ දීම

- පහත සඳහන් කරුණු ඉතා හොඳින් අධ්‍යයනය කර 34 වෙනි ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.
  A - සමාජයේ බහුතර පිරිසකට බලපෑම් කිරීම
  B - සමාජ පැවැත්මට හානිකර වීම
  C - සමාජය තුළින් ම පැන නැගීම
  D - පුද්ගලයෙකුට පමණක් බලපෑම
  E - ගැටලුවට පිළියම් යෙදීමේ හැකියාව තිබීම

34. සමාජ ප්‍රශ්නයකට ආවේණික ලක්ෂණ පමණක් දක්නට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?
(1) A, B, C හා D (2) A, B, C හා E (3) A, C, D හා E (4) B, C, D හා E

35. අපරාධ වැළැක්වීම සම්බන්ධව වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.
(1) පොලිසියට පමණි. (2) පුරවැසියන්ට පමණි.
(3) නීතියට පමණි . (4) සාමූහික ක්‍රියාවලියකින් පමණි.

- පහත සඳහන් කරුණු හොඳින් අධ්‍යයනය කර 36 වෙනි ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.
  A - රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
  B - සාම්ප්‍රදායික මතවාදවල සත්‍ය අසත්‍යතාව විමසීම
  C - නව දැනුම අනාවරණය කර ගැනීම
  D - ඓතිහාසික තොරතුරු සොයා බැලීම
  E - භෞතික සම්පත් ව්‍යාප්ත කිරීම

36. සමාජ විද්‍යා පර්යේෂණයකින් අපේක්ෂිත ප්‍රධාන අරමුණු පමණක් අන්තර්ගත නිවැරදි පිළිතුර කුමක් ද?
(1) A, B, C හා D (2) A, B, C හා E (3) A, B, D හා E (4) B, C, D හා E

- පහත සඳහන් කරුණු හොඳින් අධ්‍යයනය කර 37 වෙනි ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

  A - සෙල්ලිපි හා සන්නස්

  B - සමාජය හා මිනිසුන්

  C - දේශාටන හා චාරිකා සටහන්

  D - චිත්‍ර කලා හා සංඛ්‍යා ලේඛන

  E - නිල වාර්තා හා දිනපොත්

37. සමාජ විද්‍යා පර්යේෂණයක දී තොරතුරු රැස් කිරීමට භාවිත කරන ලිඛිත මූලාශ්‍ර පමණක් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

    (1) A, B, C හා D (2) A, B, C හා E (3) A, C, D හා E (4) B, C, D හා E

- පහත සඳහන් සිද්ධිය ඇසුරින් අංක 38 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

  පාසලේ උදෑසන පවත්වන ගුරු සිසු රැස්වීමේ දී දරුවන් නිතර නිතර ක්ලාන්ත ව බිම ඇද වැටීම හේතුවෙන් ඒ පිළිබඳව සොයා බලා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස විදුහල්පතිතුමා ජයලත් මහත්මාට පවරන ලදී. එහි දී එතුමා සිදු කළ ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

  A - අවශ්‍ය දත්ත හඳුනා ගැනීම, දත්ත ලබා ගැනීමට අවශ්‍ය උපකරණ පිළියෙල කිරීම, ඒවායින් දත්ත රැස් කිරීම, එම දත්ත තොරතුරු බවට පත් කර වර්තා කිරීම

  B - හේතු සෙවීමට පන්තිභාර ගුරුවරුන් හා දෙමාපියන් හමු වී කතාබහ කිරීම

  C - නිගමන හා යෝජනා අතුළත් ලේඛනයක් සැකසීම

38. A අක්ෂරය යටතේ ජයලත් මහතා සිදු කළ ක්‍රියාවලිය හැඳින්වෙන්නේ කුමන නමකින් ද?

    (1) උපකරණකරණය (2) විශ්ලේෂණය

    (3) සාමාන්‍යකරණය (4) විමර්ශනය

39. B අක්ෂරයට අනුව දත්ත රැස් කළ ක්‍රමය කුමක් ද?

    (1) නිරීක්ෂණ (2) සම්මුඛ සාකච්ඡා (3) ප්‍රශ්නාවලී (4) පරීක්ෂණ

40. C අක්ෂරයේ දැක්වෙන ජයලත් මහතා විසින් සකසන ලද ලේඛනය කුමක් ද?

    (1) පර්යේෂණ යෝජනාව (2) පර්යේෂණ සැලැස්ම

    (3) පර්යේෂණ වාර්තාව (4) පර්යේෂණ පත්‍රිකාව

* * *

[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය / Ministry of Education - Division of Piriven Education / கல்வி அமைச்சு – பிரிவெ1.னாக் கல்விப் பிரிவு

| 08 | S | I, II |
|---|---|---|

# පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)

## 05 ශ්‍රේණිය

## (8) සමාජ විද්‍යාව - II

- **පළමුවන** ප්‍රශ්නය සහ තවත් **ප්‍රශ්න හතරක්** ද තෝරා ගෙන, **ප්‍රශ්න පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1. (i) සමාජය විද්‍යාත්මකව හැදෑරීමේ දී අවධානය යොමු කළ යුතු ප්‍රධාන අංශ **දෙක** මොනවා ද?
(ii) සමාජානුයෝජන කාරක **දෙකක්** සඳහන් කරන්න.
(iii) සමාජ ක්‍රමය වේගවත්ව හා දිගුකාලීන ව වෙනස් කරන බලවේග **දෙකක්** සඳහන් කරන්න.
(iv) සාම්ප්‍රදායික ආධිපත්‍යය සහිත සමාජයක දක්නට ලැබෙන ලක්ෂණ **දෙකක්** ලියන්න.
(v) ජනප්‍රිය බුදුසමයේ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.
(vi) මානව පවුලේ කාර්යයන් **දෙකක්** සඳහන් කරන්න.
(vii) ප්‍රාග් බෞද්ධ යුගයේ මෙරට වාසය කළ ජන කණ්ඩායම් **දෙකක්** සඳහන් කරන්න.
(viii) ශ්‍රී ලංකාවේ තරුණ වරදකරුවන් සඳහා පිහිටුවා ඇති විශෝධන මධ්‍යස්ථාන **දෙක** නම් කරන්න.
(ix) කැලිකසළ ගැටලුවේ හානිකර බලපෑම් **දෙකක්** සඳහන් කරන්න.
(x) දත්ත රැස් කිරීමේ උපකරණවල තිබිය යුතු ගුණාංග **දෙකක්** ලියන්න. (ලකුණු 02 × 10 = 20 යි)

2. (i) "සමාජ සමූහ" පිළිබඳ අර්ථකථනයක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ii) තත්ත්වය යන සංකල්පයට පොදු ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(iii) සමාජ සංවර්ධනය සඳහා සමාජ විද්‍යා දැනුම උපයෝගි කර ගත හැකි ආකාරය කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

3. (i) කෙටිකාලීන ව සමාජය වෙනස් කරනු ලබන බලවේගවල දක්නට **ලැබෙන** ප්‍රධාන ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ii) බටහිරකරණය නිසා ශ්‍රී ලාංකේය දේශපාලනයේ ඇති වූ වෙනස්කම් **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)
(iii) ආර්ථික කළමනාකරණය සඳහා උපයෝගි කර ගත හැකි බෞද්ධ ඉගැන්වීම් **දෙකක්** අගය කරන්න. (ලකුණු 05 යි)

4. (i) "සංස්කෘතික ලැග්ම" යන සංකල්පය අර්ථ දක්වන්න. (ලකුණු 02 යි)
(ii) ඉංග්‍රීසීන්ගෙන් සිංහල සංස්කෘතියට එල්ල වූ අභියෝග පරාජය කිරීමට ක්‍රියා කළ ජාතික නායකයින් **තිදෙනෙකුගේ** නම් ලියන්න. (ලකුණු 03 යි)
(iii) සංස්කෘතිය පෝෂණය වීමෙහිලා ධර්මතාවල වටිනාකම කරුණු **දෙකක්** ඇසුරින් අගයන්න. (ලකුණු 05 යි)

5. (i) ශ්‍රී ලංකාව පෙරදිග වෙළෙඳ මධ්‍යස්ථානයක් බවට පත්වීමට බලපෑ හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)
(ii) ගෝලීයකරණයේ යහපත් ප්‍රතිඵල **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)
(iii) කාන්තාවන්ගේ සමාජ අයිතිවාසිකම් සුරක්ෂිත වීමට බුදු දහමින් ලැබෙන දායකත්වය කරුණු **දෙකක්** ඇසුරින් අගය කරන්න. (ලකුණු 05 යි)

6. (i) ශ්‍රේණ්‍යාධිකරණය සතු බලතල **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ii) **මැක්ස් වේබර්** දැක්වූ ආධිපත්‍යයේ ආකාර **තුන** මොනවා ද? (ලකුණු 03 යි)
(iii) මෙත්තානුස්සතිය වැඩීම නිසා සමාජයට ඇති වන ප්‍රයෝජන **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

7. (i) මත්ද්‍රව්‍ය භාවිතය නිසා සමාජයට ඇති වන අයහපත් බලපෑම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
(ii) සමාජ ගැටලුවලට පසුබිම් වන හේතු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(iii) අපරාධ චර්යා පාලනය කර ගැනීමට උපයෝගී වන බෞද්ධ ඉගැන්වීම් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

8. (i) සමාජ විද්‍යා පර්යේෂණයක් සිදු කිරීම සඳහා සුදුසු මාතෘකා **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)
(ii) දත්ත රැස් කිරීමේ දී පර්යේෂකයාට මුහුණ දීමට සිදු වන ගැටලු **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)
(iii) සමාජ විද්‍යා පර්යේෂණයක් සඳහා අනුගමනය කළ යුතු පියවර **දෙකක්** විග්‍රහ කරන්න. (ලකුණු 05 යි)

* * *